# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ
10 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී

**මහින්ද රාජපක්ෂ, පා.ම**
මුදල් අමාත්‍ය

2021 ජූනි 30

CM 34058-245(07/2021)

## වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ**

**10 වැනි වගන්තිය යටතේ**

**ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වසරේ ජූනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වල යාවත්කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2021 වසරේ පළමු මාස 4 තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2021 පළමු අර්ධය සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# පටුන


පිටු අංකය

**01 වන පරිච්ඡේදය** **ආර්ථික සන්දර්භය ........................................................................ 1**
සමාලෝචනය ........................................................................ 1
උද්ධමනය ........................................................................ 2
මුදල් හා ණය ........................................................................ 2
කොටස් වෙළෙඳපොළ ........................................................................ 3
විදේශ අංශයේ ප්‍රවණතා ........................................................................ 4
ගෝලීය ආර්ථික ප්‍රවණතා ........................................................................ 7

**02 වන පරිච්ඡේදය** **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා ........................................................................ 15**
සමාලෝචනය ........................................................................ 15
රාජ්‍ය ආදායම ........................................................................ 17
රාජ්‍ය වියදම ........................................................................ 31
භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය ........................................................................ 37

**03 වන පරිච්ඡේදය** **රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය ........................................................................ 43**
සමාලෝචනය ........................................................................ 43
රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය ........................................................................ 43

**04 වන පරිච්ඡේදය** **විදේශ මූල්‍යයනය ........................................................................ 51**
සමාලෝචනය ........................................................................ 51
විදේශ මූල්‍යයන එකඟතා ........................................................................ 51
විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජන ........................................................................ 53
එකඟතා පළකරන ලදුව අනුව ඉදිරියේ දී උපයෝජනය වීමට ........................................................................ 53
නියමිත ශේෂය
විදේශ ණය ප්‍රමාණය සහ ණය සේවාකරණය ........................................................................ 54

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම 2020 | වටිනාකම 2021 (තාවකාලික) |
|---|---|---|---|---|
| මූර්ත අංශය | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තුව | % | -1.8 | ලැ.නො. |
| කෘෂිකර්මාන්ත | පළමු කාර්තුව | % | -6.5 | ලැ.නො. |
| කර්මාන්ත | පළමු කාර්තුව | % | -7.9 | ලැ.නො. |
| සේවා | පළමු කාර්තුව | % | 2.9 | ලැ.නො. |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) | මැයි අවසානයට | % | 5.2 | 6.1 |
| උද්ධමනය (සාමාන්‍යය) | මැයි අවසානයට | % | 5.2 | 5.4 |
| සේවා වියුක්ති අනුපාතය | වාර්ෂික | % | 5.5 | ලැ.නො. |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | වාර්ෂික | % | 50.6 | ලැ.නො. |
| රාජ්‍ය මූල්‍ය අංශය | | | | |
| අයවැය හිඟය | ජන.-අප්‍රේල් | රු.මිලි. | -452,175 | -520,543 |
| මුළු ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 476,733 | 481,722 |
| බදු ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 408,484 | 427,261 |
| බදු නොවන ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 68,248 | 54,461 |
| වර්තන වියදම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 823,844 | 890,085 |
| රාජ්‍ය ආයෝජන | ජන.-අප්‍රේල් | රු.මිලි. | 118,928 | 114,227 |
| රාජ්‍ය ණය | දෙසැ.අවසානයට | රු.බිලි. | 15,117 | ලැ.නො. |
| විදේශ අංශය | | | | |
| අපනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 2,931.9 | 3,800.3 |
| එයින් කෘෂි අපනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 626.8 | 829.4 |
| කාර්මික අපනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 2,294.8 | 2,949.4 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,320.1 | 1,699.5 |
| වෙනත් | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 974.7 | 1,249.9 |
| ආනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 5,625.3 | 6,748.1 |
| පාරිභෝගික භාණ්ඩ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,268.6 | 1,276.5 |
| අන්තර් භාණ්ඩ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,115.7 | 4,065.7 |
| එයින් ඛනිජ නිෂ්පාදන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,070.1 | 1,390.3 |
| ආයෝජන භාණ්ඩ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,233.4 | 1,403.1 |
| වෙළෙඳ ශේෂය | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -2,693.4 | -2,947.8 |
| සංචාරක පැමිණීම් | ජන.-අප්‍රේල් | සංඛ්‍යාව | 507,311 | 13,797 |
| සංචාරක ඉපැයීම් | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 682[(a)] | 19[(b)] |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,975 | 2,386 |
| කොටස් වෙළඳපොල විවිධ අයෝජන (ශුද්ධ) | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -28 | -107 |
| සමස්ථ ගෙවුම් ශේෂය | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -290 | -929 |
| දළ නිල සංචිත | අප්‍රේල් අවසානය | ඇ.ඩො.මිලි. | 7,210 | 4,471 |
| විනිමය අනුපාතය (මාසය අග) | මැයි අවසානය | ඇ.ඩොලරයට රුපියල් | 186.29 | 199.50 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | මැයි අවසානය | ඇ.ඩොලරයට රුපියල් | 187.87 | 199.58 |
| මූල්‍ය අංශය | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | මැයි අවසානය | % | 5.5 | 4.5 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | මැයි අවසානය | % | 6.5 | 5.5 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | මැයි අවසානය | % | 4 | 2.0 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | මැයි අවසානය | % | 9.3 | 5.7 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | අප්‍රේල් අවසානය | % | 13.1 | 9.7 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (මාස 01) | මැයි අවසානය | % | 6.4 | ලැ.නො. |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | මැයි අවසානය | % | 6.7 | 5.1 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | මැයි අවසානය | % | 6.9 | 5.2 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_{2b}$) | අප්‍රේල් 2021/අප්‍රේල් 2020 | % | 13.2 | 20.4 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | අප්‍රේල් 2021/අප්‍රේල් 2020 | % | 7.6 | 8.2 |

ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| විදුලි බලය | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2016 | % | 99.3 |
| ජලය | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2020 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 93.2 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2020 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 53.1 |
| මාර්ග | | | |
| මාර්ග ඝනත්වය | 2020 | වර්ග කි.මී. | 0.19 |
| මාර්ග වල මුළු දිග | 2020 | කි.මී | 12,496 |
| සන්නිවේදනය | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2020 | පුද්ගලයින් 100 කට | 143 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | 2020 | පුද්ගලයින් 100 කට | 79.9 |
| අධ්‍යාපනය | | | |
| පොදු අධ්‍යාපනය | | | |
| ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය | 2019 | % | 91.1 |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්) | 2020 | සංඛ්‍යාව | 16 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2019 | % | 92.9 |
| පරිගනක සාක්ෂරතා අනුපාතය (පළමු මාස 6) | 2020 | % | 32 |
| විශ්ව විද්‍යාල අධ්‍යාපනය | | | |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය | 2020 | සංඛ්‍යාව | 18.9 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-23) (අ) | 2020 | % | 8.2 |
| සෞඛ්‍ය | | | |
| රෝහල් (බටහිර වෛද්‍ය)[ආ] | 2020 | සංඛ්‍යාව | 609 |
| ඇඳන්[ආ] | 2020 | සංඛ්‍යාව | 77,121 |
| රෝහල් ඇඳන් | 2020 | පුද්ගලයින් 1,000 කට | 3.5 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2020 | සංඛ්‍යාව | 1,117 |
| ජනගහනය | | | |
| ජනගහන ඝනත්වය | 2020 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 350 |
| ජනගහන වර්ධනය | 2020 | % | 0.5 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2017 | අවුරුදු | 75.5 |
| ළදරු මරණ අනුපාතිකය | 2015 | සජීවී උපත් 1,000 කට | 8.5 |
| මාතෘ මරණ අනුපාතිකය | 2013 | සජීවී උපත් 1,000 කට | 26.8 |
| දළ උපත් අනුපාතිකය | 2020 | පුද්ගලයින් 1,000 කට | 13.8 |
| දළ මරණ අනුපාතිකය | 2020 | පුද්ගලයින් 1,000 කට | 6.0 |
| යැපුම් අනුපාතිකය | 2020 | % | 49.4 |
| දරිද්‍රතාව | | | |
| දරිද්‍රතා දර්ශකය | 2016 | % | 4.1 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය | 2016 | සංගුණකය | 0.45 |
| දරිද්‍රතා පරතර දර්ශකය | 2016 | % | 0.6 |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | 2016 | කිලෝකැලරි | 2,095 |
| ජාත්‍යන්තර ශ්‍රේණි ගත කිරීම් | | | ස්ථානය |
| මානව සංවර්ධන දර්ශකය | 2019 | රටවල් 189 ක් අතරින් ස්ථානය | 72 |
| ව්‍යාපාර පවත්වා ගෙන යාමේ දර්ශකය | 2019 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 99 |
| ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | 2019 | රටවල් 140 ක් අතරින් ස්ථානය | 84 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2020 | රටවල් 178 ක් අතරින් ස්ථානය | 131 |
| ගෝලීය සාම දර්ශකය | 2020 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 77 |
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2020 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 85 |

(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ.

(ආ) රජයේ

# 1 වන පරිච්ඡේදය

# ආර්ථික සන්දර්භය

## සමාලෝචනය

කොවිඩ් -19 වෛරසය පැතිරීම වැළැක්වීම, මැඩ පැවැත්වීම සහ අඩු කිරීම සඳහා පුළුල් පදනමක් සහිතව ශ්‍රී ලංකාව ප්‍රතිචාර දක්වන ලදී. සමෘද්ධි සහ වැඩිහිටියන් සඳහා මාසික දීමනාව වැනි පවතින සමාජ ආරක්ෂණ ජාල තුළින් සහ ප්‍රධාන වශයෙන්ම අගුළුලා ඇති ප්‍රදේශවල සංචරණ සීමා පැනවීම හේතුවෙන් තාවකාලිකව රැකියා අහිමිවූවන්ට මුදල් ප්‍රදාන ලබාදීම සහ සිය නිවෙස්වල නිරෝධායනය වන්නන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීම තුළින් ජනතාවගේ ජීවනෝපායන්ට සහාය වන අතරතුර එන්නත්කරණයේ සහ මුහුණු ආවරණ භාවිතා කිරීම සහ ආසාදිත පුද්ගලයින් හුදකලා කිරීම වැනි ඖෂධීය නොවන මැදිහත්වීම් වල සංයෝජනයත් රජය විසින් සාර්ථකව යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකාව මුළුමනින්ම අගුළු ලා තැබීම වෙනුවට සංචරණ සීමා ලිහිල් කරමින් සීමිත ප්‍රදේශ පමණක් අගුළු ලා තැබීමට කටයුතු කරන ලදී. ඒ අනුව, රට යථා තත්ත්වයට පත් වෙමින් පවතී. 2021 වසරේ පෙබරවාරි මාසයේ සිට දිවයිනම ආවරණය වන පරිදි මේ දක්වා එන්නත් මාත්‍රා 3,506,000 කට ආසන්න ප්‍රමාණයක් මුළු දිවයිනම ආවරණය වන පරිදි ලබා දී ඇත. ජනගහනයෙන් අවම වශයෙන් සියයට 60 ක් වත් එන්නත්කරණයට භාජනය කිරීමේ අපේක්ෂාව සහතික කිරීම මගින් රටේ ආර්ථික ක්‍රියාකාරකම් කඩිනමින් සහ වේගයෙන් නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමට හැකි වනු ඇත. ශ්‍රී ලංකාවේ එන්නත් නිෂ්පාදනය ආරම්භ කිරීමත් සමඟ මේ සඳහා තවදුරටත් ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත.

රටේ පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්තියට අනුකූලව, දැනටමත් ස්ථාපනය කර තිබෙන සරල හා විනිවිද භාවයෙන් යුතු බදු ක්‍රමය හේතුවෙන්, පෞද්ගලික අංශය, විශේෂයෙන්ම ව්‍යවසායකයන් ආර්ථිකයේ ඵලදායී අංශවල තවදුරටත් ආයෝජනය කිරීමට දිරිග න්වමින්, රටේ සමස්ත ඉල්ලුම තවදුරටත් වේගවත් කිරීමට 2021 වසරේ පළමු භාගයේදී ද අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති සහාය ලබා දෙන ලදී.

2021 වසරේ පළමු මාස හතර තුළ ප්‍රදාන ද ඇතුළත්ව රජයේ ආදායම රු. බිලියන 482.3 දක්වා ඉහළ ගිය අතර, එය වාර්ෂික ආදයම් ඇස්තමේන්තුව වන රු. බිලියන 1,961 න් සියයට 25 ක ළඟා කරගැනීමකි.

ආර්ථිකයේ ඵලදායී අංශවල ආයෝජනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ණය ලබා දීම කඩිනම් කිරීම තුළින් ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ අරමුණින්, 2021 වසරේ පළමු භාගයේදී ද අඛණ්ඩව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදී. 2021 වසරේ අප්‍රේල් මාසය වන විට පෞද්ගලික අංශයට ලබා දුන් ණය සියයට 8.2 කින් රු. බිලියන 6,445.9 දක්වා ඉහළ යාමෙන් පිළිබිඹු වන පරිදි, වෙළෙඳපොළ පොලී අනුපාත ඉතිහාසගත මට්ටම් දක්වා අඩු වූ අතර එමගින් ණය ගැනීමේ පිරිවැය අඩුවිය. මේ අතර සමස්ථ උද්දමන අනුපාතිකය 2021 වසරේ දෙවන භාගයේ සියයට 4-6 දක්වා පුළුල් ප්‍රතිශත පරාසයක් තුළ පවත්වා ගැනේ.

වසංගතය මධ්‍යයේ මතු වූ අභියෝග හමුවේ වුවද විදේශ අංශය ස්ථාවරව පැවතුණි. රෙදිපිළි හා ඇඟළුම්, රබර් නිෂ්පාදන, තේ, කුළුබඩු, පොල් වැනි කෘෂිකාර්මික අපනයන සහ ඛනිජ නිෂ්පාදනවල ආදායම ඉහළ යාම හේතුවෙන් 2021 වසරේ පළමු මාස හතර තුළ අපනයනවලින් ලද ආදායම ඇ. ඩො. මිලියන 3,800 දක්වා සියයට 29.6 කින් වර්ධනය විය. තවද, ආනයන වියදම ඇ. ඩො. මිලියන 6,748 ක් දක්වා සියයට 20.0 කින් ඉහළ ගොස් ඇති අතර ආහාරපාන, ඛනිජ තෙල්, වෛද්‍ය උපකරණ හා ඖෂධ, රෙදිපිළි, රසායනික ද්‍රව්‍ය, ප්ලාස්ටික් නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ හා ගොඩනැගිලි ද්‍රව්‍යවල ආනයන වියදම ඉහළ යාම මීට හේතු විය. විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඇ. ඩො. මිලියන 2,386 දක්වා සියයට 20.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. රටේ විදේශ සංචිත ප්‍රමාණය චීන මහජන බැංකුව සමඟ ඇතිකරගත් හදිසි අවස්ථාවකදී ලබාගැනීම සඳහා ඇ. ඩො. බිලියන 1.5ක මුදල් හුවමාරු ගිවිසුමට අමතරව ඇ.ඩො. බිලියන 4.5 ක් ලෙස වාර්තා විය.

වසංගතය හේතුවෙන් විදේශ අංශයෙන් ඇතිවූ පීඩනයන් හමුවේ වුවද, ණය සේවාකරණයේදී ශ්‍රී ලංකාව පවත්වාගෙන ආ අඛණ්ඩ වාර්තාව තවදුරටත් පවත්වාගෙන යාමට හැකිවී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට (ද.දේ.නි.) සාපේක්ෂව විදේශ ණය ප්‍රතිශතය සියයට 40 ක් දක්වා අඩු වී ඇත. නව ආයෝජන හස්තයක් වන කොළඹ වරාය නගර ආර්ථික කොමිසම මෙන්ම අපනයන ලැබීම් හා විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ මහ බැංකුව විසින් මිලදීගැනීම් හා බහුපාර්ශ්වික හා ද්වීපාර්ශ්වික ප්‍රභවයන්ගෙන් රජය වෙත වෙනත් ගලා ඒම් ද හේතුවෙන් ණය නොවන ගලා ඒම් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතයි. 2021 ජූලි මාසයේ දී බංගලාදේශ බැංකුවෙන් ඇ.ඩො. මිලියන

250 ක හා 2021 අගෝස්තු මාසයේදී SAARC Finance මුදල් හුවමාරු පහසුකම යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් ඇ.ඩො. මිලියන 400 ක මුදල් හුවමාරු පහසුකම් ලබාගැනීමට අපේක්ෂිත වන අතර, ඇ. ඩො. මිලියන 1,000 ක් සඳහා ඉන්දියානු පාර්ශවය සමග සාකච්ඡා ආරම්භ කර ඇත. මීට අමතරව, 2021 අගෝස්තු වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) යටතේ ඇ. ඩො. මිලියන 800 ක් ලැබීමට ද නියමිතය.

## උද්ධමනය

මනාව ඉලක්කගත කළ උද්ධමන අපේක්ෂාවත් සමග අඩු සමස්ත ඉල්ලුම පිළිබිඹු කරමින්, 2021 වසරේ පළමු මාස හතර තුළ උද්ධමනය අඩු මට්ටමක පැවතිණ. කෙසේ වෙතත්, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ලේ ආරම්භයත් සමග 2021 වසරේ මාර්තු මාසයේ සිට සැපයුම් සඳහා ඇති වන ලද බාධා හේතුවෙන් උද්ධමනය ඉහළ යාම සඳහා පීඩනයක් එල්ල විය. ඒ අනුව, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (NCPI, 2013=100) ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2021 වසරේ ජනවාරි මාසයේ පැවති සියයට 3.7 සිට 2021 වසරේ මැයි මාසය වනවිට සියයට 6.1 ක් දක්වා වර්ධනය වූ අතර එමඟින් එම කාලවකවානුව තුළ ආහාර හා ආහාර නොවන කාණ්ඩයෙහි මිල ගණන් ඉහළයාම පිළිබිඹු විය. එසේම, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (CCPI, 2013=100) ලක්ෂ්‍යමය වෙනස 2021 ජනවාරි මාසයේ පැවති සියයට 3.0 සිට 2021 වසරේ මැයි මාසය වන විට සියයට 4.5 දක්වා වර්ධනය විය. ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (NCPI) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (CCPI) ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන රටෙහි මූලික උද්ධමනය 2021 වසරේ පළමු මාස හතර තුළ අඩු මට්ටමක පවතින ලදී. කෙසේ වෙතත්, සමස්ත උද්ධමන අනුපාතිකය 2021 වසරේ දෙවන භාගයේ හා මධ්‍යකාලීනව සියයට 4-6 දක්වා පුළුල් ප්‍රතිශත පරාසයක් තුළ පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

වගුව **1.1 :** උද්ධමනයේ විචලනය (%)

| වසර | මාසය | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | | ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මතුපිට උද්ධමනය | | *මූලික උද්ධමනය | | මතුපිට උද්ධමනය | | *මූලික උද්ධමනය | |
| | | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය |
| 2020 | ජනවාරි | 5.7 | 4.5 | 3.0 | 5.3 | 7.6 | 4.1 | 3.9 | 5.6 |
| | පෙබරවාරි | 6.2 | 4.6 | 3.2 | 5.1 | 8.1 | 4.5 | 3.4 | 5.5 |
| | මාර්තු | 5.4 | 4.7 | 2.9 | 4.9 | 7.0 | 4.9 | 3.2 | 5.2 |
| | අප්‍රේල් | 5.2 | 4.8 | 3.1 | 4.7 | 5.9 | 5.1 | 3.2 | 5.0 |
| | මැයි | 4.0 | 4.7 | 2.9 | 4.4 | 5.2 | 5.2 | 3.7 | 4.8 |
| | ජුනි | 3.9 | 4.7 | 3.1 | 4.2 | 6.3 | 5.6 | 4.4 | 4.6 |
| | ජූලි | 4.2 | 4.8 | 3.2 | 4.0 | 6.1 | 5.9 | 4.5 | 4.5 |
| | අගෝස්තු | 4.1 | 4.8 | 3.2 | 3.8 | 6.2 | 6.1 | 4.6 | 4.4 |
| | සැප්තැම්බර් | 4.0 | 4.7 | 2.9 | 3.6 | 6.4 | 6.2 | 4.8 | 4.3 |
| | ඔක්තෝබර් | 4.0 | 4.6 | 3.0 | 3.4 | 5.5 | 6.2 | 4.5 | 4.2 |
| | නොවැම්බර් | 4.1 | 4.6 | 3.0 | 3.2 | 5.2 | 6.3 | 4.5 | 4.2 |
| | දෙසැම්බර් | 4.2 | 4.6 | 3.5 | 3.1 | 4.6 | 6.2 | 4.7 | 4.1 |
| 2021 | ජනවාරි | 3.0 | 4.3 | 2.7 | 3.1 | 3.7 | 5.8 | 4.2 | 4.2 |
| | පෙබරවාරි | 3.3 | 4.1 | 2.6 | 3.0 | 4.2 | 5.5 | 4.1 | 4.2 |
| | මාර්තු | 4.1 | 4.0 | 3.1 | 3.0 | 5.1 | 5.3 | 4.3 | 4.3 |
| | අප්‍රේල් | 3.9 | 3.9 | 3.0 | 3.0 | 5.5 | 5.3 | 4.1 | 4.4 |
| | මැයි | 4.5 | 3.9 | 3.2 | 3.0 | 6.1 | 5.4 | 4.2 | 4.4 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
*කොළඹ පාරිභෝගික මිල දර්ශකය - ආහාර, බලශක්ති, සහ ප්‍රවාහනය යන නිතර වෙනස් වන අයිතමයන් හැර

## මුදල් හා ණය

ආර්ථිකයේ ඵලදායී අංශවල ආයෝජනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ණය ලබාදීම වේගවත් කිරීම තුළින් ආර්ථික පුනර්ජීවනයට සහය දැක්වීම සඳහා 2021 වසරේ පළමු භාගය තුළදී ද ලිහිල් මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොළ පොලී අනුපාත ඉතිහාසගත අඩු මට්ටමක් වාර්තා කරමින් පහත වැටිණ. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංචිත මුදල් සියයට

0.9 කින් වැඩි වූ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුම ($M_2b$) සියයට 20.4 කින්ද වැඩි වන ලදී. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වැනි ආර්ථිකයේ ප්‍රමුඛ අංශ සඳහා ණය පහසුකම් ලබාදීම පිළිබිඹු කරමින් 2021 වසරේ අප්‍රේල් මස අවසන් වන විට පෞද්ගලික අංශයට ලබා දුන් ණය රු. බිලියන 6,445.9 දක්වා සියයට 8.2 කින් වර්ධනය විය. 2021 වසරේ පළමු මාස හතර තුළ රාජ්‍ය අංශය සඳහා ලබාදුන් ණය ද රු. බිලියන 1,093.4 දක්වා සියයට 17.1 කින් වැඩි විය.

දේශීය හා විදේශීය සාර්ව ආර්ථික හා මුදල් වෙළෙඳපොළ ප්‍රවණතා මධ්‍යයේ ආර්ථික පුනර්ජීවන කටයුතු සඳහා සහාය දැක්වීමක් වශයෙන් 2021 වසරේ පළමු භාගයේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) යන ප්‍රතිපත්ති පොළී අනුපාතයන් පිළිවෙළින් සියයට 4.50 සහ සියයට 5.50 වශයෙන් පවත්වා ගෙන ඇත. එසේම, 2021 වසරේ පළමු භාගය තුළ ප්‍රතිපත්ති පොලී අනුපාතයන් නොවෙනස්ව පැවතුණි ; බැංකු අනුපාතික සියයට 8.50 ක පැවති අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සියයට 2.0 ක පැවතුණි.

වගුව **1.2 :** මුදල් සහ පුද්ගලික අංශයට ලබාදුන් ණය

රු. බිලියන

| අයිතමය | 2020 | | | | 2021 | | | | 2021 අප්‍රේල්/ 2020 අප්‍රේල් වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | |
| සංචිත මුදල් | 935.6 | 963.3 | 1,013.8 | 1,021.6 | 975.9 | 978.1 | 1,028.6 | 1,031.1 | 0.9 |
| පුළුල් මුදල් (M2b) | 7,703.8 | 7,793.0 | 8,098.2 | 8,259.0 | 9,532.7 | 9,650.9 | 9,838.6 | 9,947.3 | 20.4 |
| පුද්ගලික අංශයට ලබාදුන් ණය | 5,796.7 | 5,822.0 | 5,942.1 | 5,955.65 | 6,196.6 | 6,276.0 | 6,388.2 | 6,445.9 | 8.2 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## කොටස් වෙළෙඳපොළ

කොළඹ කොටස් වෙළෙඳපොළ, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ පළමු කාර්තුවේ දී සිය කාර්යයන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වීම නිසා සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. වේගවත් එන්නත්කරණ වැඩසටහනේ ආරම්භය හා 2020 වසරේ පළමු කොවිඩ් රැල්ලට සාපේක්ෂව 2021 වසරේ තුන්වන රැල්ලේදී තෝරාගත් ප්‍රදේශවල පමණක් සංචරණ සීමා පැනවීම මෙයට හේතුවිය. සමස්ත කොටස් මිල දර්ශකය 2020 වසර අවසානයේදී ඒකක 6,774.22 සිට 2021 ජනවාරි මස 27 දින අවසානයේ දී ඒකක 8,812.01 දක්වා සියයට 30.05 කින් වර්ධනය වීම හා S&P SL 20 කොටස් මිල දර්ශකය 2020 වසර අවසානයේ දී ඒකක 2,638.10 සිට 2021 ජනවාරි 29 දින අවසානයේ දී ඒකක 3,514.18 ක් දක්වා සියයට 33.21 ක වර්ධනය වීම සමඟ කොළඹ කොටස් වෙළෙඳපොළ 2021 ජනවාරි මස තීව්‍ර ලෙස වර්ධනය විය. කෙසේ වුවද, සමස්ථ කොටස් මිල දර්ශකය සහ S&P SL 20 පෙබරවාරි මස මුල සිට පහත වැටීම ආරම්භ වූ අතර කොවිඩ් තුන්වන රැල්ල ආරම්භ වීමත් සමඟ 2021 මාර්තු දෙවන සතියේ දී සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 6,854 දක්වා හා S&P SL 20 මිල දර්ශකය ඒකක 2,757.45 දක්වා පහත වැටිණි. 2021 ජූනි මස 11 දින අවසානයේදී සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 7,610.30 ක් හා S&P SL 20 මිල දර්ශකය ඒකක 3,067.03 අගයන්වල පැවතුණි. වෙළඳපොල ප්‍රාග්ධනීකරණය 2020 මැයි මස රු. බිලියන 2,266 සිට 2021 මැයි මස රු. බිලියන 3,268 ක් දක්වා සියයට 44.21 කින් වසංගතයට පෙර පැවති මට්ටම දක්වා වර්ධනය විය. ඒ ආකාරයෙන්ම සාමාන්‍ය දෛනික පිරිවැටුම 2021 මැයි මස රු. මිලියන 4,409ක් දක්වා වසංගතයට පෙර පැවති මට්ටම් ඉක්මවා වර්ධනය වූ අතර එය 2020 වසරේදී රු. මිලියන 1,899 ක් හා 2019 වසරේදී රු. මිලියන 711 ක් විය. එසේ වුවද, ශුද්ධ විදේශ විකුණුම් 2021 වසරේ පළමු මාස පහ තුළ වර්ධනය විය. ශුද්ධ විදේශ විකුණුම්, 2020 වසරේ මැයි මස අවසානයේ දී වූ රු. මිලියන 12,260 ට සාපේක්ෂව 2021 වසරේ මැයි මස අවසානයේ දී රු. මිලියන 25,323 ක් දක්වා වැඩි විය. විදේශ මිලදී ගැනීම් 2020 මැයි මස අවසානයේ දී රු. මිලියන 34,121 සිට 2021 මැයි මස අවසානයේ දී රු. මිලියන 19,527 ක් දක්වා සියයට 44.21 කින් අඩු විය.

වගුව **1.3 :** ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්යසාධනය

| දර්ශකය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | මැයි අවසන විට | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2020 | 2021 |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 6,228 | 6,369 | 6,052 | 6,129 | 6,774 | 4,847 | 7,403 |
| මිලංකා මිල දර්ශකය S&P SL 20 දර්ශකය | 3,496 | 3,672 | 3,135 | 2,937 | 2,638 | 2,016 | 2,979 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,745 | 2,899 | 2,839 | 2,851 | 2,961 | 2,266 | 3,268 |
| වෙළඳපොල කටයුතු සිදුකරනු ලබන ලැයිස්තුගත සමාගම් ගණන | 295 | 296 | 297 | 289 | 283 | 289 | 284 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 737 | 915 | 834 | 711 | 1,899 | 1,215 | 4,409 |
| විදේශ විකුණුම් (රු. මිලියන) | 74,200 | 94,627 | 100,315 | 68,272 | 104,245 | 46,382 | 44,850 |
| විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | 74,583 | 112,285 | 77,067 | 56,537 | 52,889 | 34,111 | 19,527 |
| ශුද්ධ මිලදී ගැනීම් (රු. මිලියන) | 384 | 17,658 | -23,248 | -11,735 | -51,356 | -12,271 | -25,323 |

මූලාශ්‍ර: කොළඹ කොටස් වෙළෙඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශ අංශයේ ප්‍රවණතා

2021 පළමු මාස හතර තුළ විදේශ අංශය මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී. කාර්මික, කෘෂි කාර්මික හා ඛනිජ අපනයන වැනි සියලුම වර්ගයන්හි අපනයන වැඩිවීමත් සමඟ සමස්ත අපනයන සියයට 29.6 කින් ඉහළ යන ලදී; සමස්ත ආනයන ද සියයට 20 කින් වර්ධනය විය; වෙළඳ හිඟය පුළුල් විය; විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ගලා ඒම සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයීම් අඩු විය; දළ නිල සංචිතය ඇ. ඩො. බිලියන 4.5 ක් ලෙස පැවතිණි.

රෙදිපිළි හා ඇඟළුම්, රබර් නිෂ්පාදන, තේ, කුළුබඩු සහ පොල් වැනි කෘෂිකාර්මික අපනයන හා ඛනිජ නිෂ්පාදනවල ඉපයීම් ඉහළ යැමෙන් ප්‍රතිලාභ ලබමින් අපනයන ආදායම, 2020 වසරේ පළමු මාස හතර තුළදී වාර්තා වූ ඇ.ඩො. මිලියන 2,932 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී සියයට 29.6 කින් එනම්, ඇ. ඩො. මිලියන 868 කින් ඇ. ඩො. මිලියන 3,800 ක් දක්වා ඉහළ යන ලදී. එසේම, ආහාර පාන, සීනි සහ රස කැවිලි, වෛද්‍ය සහ ඖෂධ, ඉන්ධන, රෙදිපිළි, රසායනික හා ප්ලාස්ටික් නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හා ගොඩනැගිලි ද්‍රව්‍ය වල ආනයන වියදම වැඩිවීම හේතුවෙන් සමස්ත ආනයන වියදම 2020 වසරේ පළමු මාස හතර තුළදී පැවති ඇ. ඩො. මිලියන 5,625 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී සියයට 20.0 කින් එනම්, ඇ. ඩො. මිලියන 1,123 කින් ඇ. ඩො. මිලියන 6,748 දක්වා ඉහළ යන ලදී. වෙළඳ හිඟය 2020 වසරේ පළමු මාස හතර තුළ දී පැවති ඇ. ඩො. මිලියන 2,693 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී අපනයන වර්ධනයට වඩා ආනයන වර්ධනය වැඩිවීම හේතුවෙන් ඇ. ඩො. මිලියන 2,948 ක් දක්වා පුළුල් වී ඇත.

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2020 වසරේ පළමු මාස හතර තුළදී වාර්තා කළ ඇ.ඩො. මිලියන 1,975 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී සියයට 20.8 කින් එනම් ඇ.ඩො. මිලියන 411 කින් ඇ.ඩො. මිලියන 2,386 ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, අවිධිමත් ක්‍රම වෙනුවට විධිමත් ක්‍රම වෙතින් මුදල් එවීමට යොමුවීමත් වන්දි සහ සේවාන්ත ප්‍රතිලාභ වැඩි වීමත්ය. බැංකු හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය වන විදේශ විනිමය සඳහා සාමාන්‍ය විනිමය අනුපාතයට වඩා ඩොලරයකට රු. 2.00 ක් ගෙවීමේ විශේෂ දිරි දීමනාව ප්‍රකාශයට පත් කිරීම, විදේශ ප්‍රේෂණවල වර්ධනය සඳහා තවදුරටත් සහාය විය. තවද, ඉහළ පොලී අනුපාතයක් සහිත විශේෂ තැන්පතු ගිණුමක් (SDA) හඳුන්වා දීමෙන් ද ශ්‍රී ලංකාවට විදේශීය ගලා ඒම් වැඩි වීම දිරිගැන්විණ.

ජෛව බුබුළු සංකල්පය හඳුන්වාදීමත් සමඟ කොවිඩ්-19 දෙවන රැල්ලෙන් පසු සංචාරක අංශය සාධනීය වෙනසක් අත්පත් කර ගන්නා ලදී. කෙසේ වෙතත්, වසංගතයේ තුන්වන රැල්ල නැවත ආරම්භ වීමත් සමඟ ඒ සඳහා බාධා ඇති විය. සංචාරක ක්ෂේත්‍රයේ ඉපැයීම් 2020 වසරේ පළමු මාස හතර තුළ පැවති ඇ. ඩො. මිලියන 682 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 19 දක්වා පහත වැටුණි.

කොළඹ කොටස් හුවමාරුව (CSE) 2020 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ. ඩො. මිලියන 28 ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ.ඩො. මිලියන 107 ක ශුද්ධ ගලා යාමක් වාර්තා කරන ලදී. රජය වෙත දළ ගලා ඒම් ඇ. ඩො. මිලියන 799 ක් දක්වා අඩු විය. මේ අතර, 2021 වසරේ අප්‍රේල් මස අවසන් වන විට දළ නිල සංචිතය ඇ. ඩො. බිලියන 4.5 ක් වූ අතර, එය මාස 3.1 ක ආනයනවලට සමාන විය. සමස්ත ගෙවුම් ශේෂය (BOP) 2021 වසරේ අප්‍රේල් මාසය අවසන් වන විට ඇ. ඩො. මිලියන 929 ක හිඟයක් වාර්තා කළේය. 2021 වසරේ අප්‍රේල් මාසය වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 0.3 ක ප්‍රතිශතයකින් සුළු වශයෙන් අවප්‍රමාණය විය.

වගුව 1.4 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා විදේශ වෙළඳාම

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2020 | 2021 (තාවකාලික) | % වෙනස |
|---|---|---|---|
| **අපනයන** | **2,931.9** | **3,800.3** | **29.6** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 626.8 | 829.4 | 32.3 |
| තේ | 348.4 | 417.4 | 19.8 |
| ප්‍රාථමික නිෂ්පාදන (රබර් හා පොල් නිෂ්පාදන) | 93.5 | 139.0 | 48.7 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 184.9 | 273.0 | 47.6 |
| කාර්මික නිෂ්පාදන | 2,294.8 | 2,949.4 | 28.5 |
| රෙදි පිළි හාඇඟලුම් | 1,320.1 | 1,699.5 | 28.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 192.2 | 122.1 | -36.5 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 782.6 | 1,127.8 | 44.1 |
| ඛනිජ නිෂ්පාදන | 5.9 | 16.0 | 171.2 |
| අනෙකුත් | 4.4 | 5.6 | 27.3 |
| **ආනයන** | **5,625.3** | **6,748.1** | **20.0** |
| පාරිභෝගික භාණ්ඩ | 1,268.6 | 1,276.5 | 0.6 |
| ආහාර හා පාන වර්ග | 563.2 | 628.8 | 11.6 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 705.4 | 647.7 | -8.2 |
| අතරමැදි භාණ්ඩ | 3,115.7 | 4,065.7 | 30.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 1,070.1 | 1,390.3 | 29.9 |
| පොහොර | 55.0 | 82.2 | 49.5 |
| රෙදි පිළි හා ඇඟලුම් | 768.9 | 938.6 | 22.1 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 1,221.7 | 1,654.6 | 35.4 |
| ආයෝජන භාණ්ඩ | 1,233.4 | 1,403.1 | 13.8 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 685.5 | 913.0 | 33.2 |
| ප්‍රවාහන උපකරණ | 187.4 | 107.7 | -42.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 359.4 | 381.8 | 6.2 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 1.0 | 0.6 | -40.0 |
| අනෙකුත් | 7.7 | 2.8 | -63.6 |
| **වෙළඳ ශේෂය** | **-2,693.4** | **-2,947.8** | **-9.4** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

## අපනයනය

වසංගතයට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින්, අපනයන වලින් ලද ආදායම 2020 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා කළ ඇ.ඩො. මිලියන 2,931.1 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 29.6 කින් ඇ. ඩො. මිලියන 3,800.3 ක් දක්වා ඉහළ යන ලදී. රෙදිපිළි හා ඇඟළුම්, රබර් නිෂ්පාදන, ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන වලින් ඉහළ යන ලද ඉපැයීම් තුළින් ප්‍රතිලාභ ලබමින් කාර්මික අපනයන වලින් ලද ආදායම, 2020 වසරේ පළමු මාස හතර තුළදී වාර්තා කළ ඇ. ඩො. මිලියන 2,294.8 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 2,949.4 දක්වා සියයට 28.5 කින් ඉහළ යන ලදී. රෙදිපිළි හා ඇඟළුම් වලින් ඉපැයීම් 2021 පළමු මාස හතර තුළ ඇ. ඩො. මිලියන 1,699.5 දක්වා සියයට 28.7 කින් ඉහළ ගොස් ඇති අතර එය 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 1,320.1 ක් විය. රබර් නිෂ්පාදන, ආහාරපාන හා දුම්කොළ නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ වලින් අපනයන ආදායම පිළිවෙලින් ඇ. ඩො. මිලියන 317.9 දක්වා සියයට 44.3 කින්, ඇ.ඩො. මිලියන 167.4 දක්වා සියයට 32.0 කින් සහ ඇ.ඩො. මිලියන 156.0 දක්වා සියයට 63.5 කින් ඉහළ යන ලදී. අනෙකුත් කාර්මික අපනයන වන මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, රසායනික නිෂ්පාදන, මූල ලෝහ සහ ප්‍රවාහන උපකරණ 2021 වසරේ පළමු මාස හතර තුළ සමස්ත අපනයන ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් ලද අපනයන ආදායම ඇ. ඩො. මිලියන 122.1 ක් දක්වා සියයට 36.5 කින් අඩු වී ඇති අතර, ගුවන් සේවා සහ ඉන්ධන සැපයීම පහත වැටීම මෙයට ප්‍රධාන හේතු විය.

කෘෂිකාර්මික අපනයන වලින් ලද අපනයන ආදායම 2020 වසරේ පළමු මාස හතර තුළ දී වර්තා කළ ඇ. ඩො. මිලියන 626.8 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 829.4 ක් දක්වා සියයට 32.3 කින් සැලකිය යුතු ලෙස ඉහළ

ගොස් තිබෙනුයේ ප්‍රධාන වශයෙන්ම, තේ ඇ.ඩො. මිලියන 417.4 ක් දක්වා සියයට 19.8 කින්ද, කුළුබඩු ඇ.ඩො. මිලියන 136.2 ක් දක්වා සියයට 115.8 කින්ද, පොල් ඇ.ඩො. මිලියන 123.6 ක් දක්වා සියයට 45.9 කින්ද, මුහුදු ආහාර ඇ.ඩො. මිලියන 75.6 ක් දක්වා සියයට 19.4 කින් ද ඉපයීම් ඉහළ යාම හේතුවෙනි. එළවළු, රබර් සහ සැකසුම් නොකළ දුම්කොළ වලින් ලැබෙන ආදායම ද පිළිවෙලින් ඇ. ඩො. මිලියන 8.4 ක් දක්වා සියයට 3.9 කින්, ඇ. ඩො. මිලියන 15.4 ක් දක්වා සියයට 75.6 කින් සහ ඇ. ඩො. මිලියන 11.3 ක් දක්වා සියයට 88.8 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, සුළු කෘෂිකාර්මික අපනයන වලින් ඉපැයීම් 2021 පළමු මාස හතර තුළ දී ඇ.ඩො. මිලියන 41.6 ක් දක්වා සියයට 6.6 කින් පහත වැටුණි. මේ අතර, 2021 පළමු මාස හතර තුළ දී ඛනිජ අපනයනයෙන් ලද ආදායම ඇ.ඩො. මිලියන 16.0 දක්වා සියයට 172.6 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබේ.

## ආනයනය

අත්‍යාවශ්‍ය නොවන අයිතම ආනයනය සඳහා ඇති සීමාවන් හමුවේ වුවද, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම ඉහළ යාම හේතුවෙන් 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 5,625.3 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ආනයන මත වූ වියදම ඇ.ඩො. මිලියන 6,748.1 ක් දක්වා සියයට 20 ක ප්‍රතිශතයකින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආනයන සංයුතියට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ ඉන්ධන, රෙදිපිළි, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, රසායනික නිෂ්පාදන, ප්ලාස්ටික්, සීනි හා රසකැවිලි සහ වෛද්‍ය උපකරණ සහ ඖෂධ නිෂ්පාදනයන්ය.

ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ මත වියදම පහළ ගොස් තිබියදීත්, ආහාර පාන සඳහා වූ ආනයනික වියදම ඉහළ යාම හේතුවෙන්, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 1,268.6 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,267.5 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. සීනි හා රසකැවිලි සඳහා වූ ආනයනික වියදම වැඩි වූ අතර, එළවළු, ධාන්‍ය වර්ග, කිරි නිෂ්පාදන, මුහුදු ආහාර සහ කුළුබඩු සඳහා වූ ආනයනික වියදම අඩු විය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ මත වූ වියදම ඇ.ඩො. මිලියන 647.7 ක් දක්වා සියයට 8.2 කින් සංකෝචනය වී ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් පෞද්ගලික වාහන සහ ඇඳුම් සඳහා භාවිතා වන උපාංග මත වියදම අඩුවීම හේතු විය. විදුලි සංදේශ උපකරණ සඳහා වන වියදම 2021 වසරේ පළමු මාස හතර තුළ ඇ.ඩො. මිලියන 137.0 ක් දක්වා සියයට 117.4 ක ප්‍රතිශතයකින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත්තේ වසංගත තත්ත්වය සමඟ එවැනි උපකරණ සඳහා වන ඉල්ලුම ඉහළයාම හේතුවෙනි.

ඛනිජ නිෂ්පාදන හැර අනෙකුත් සියළුම උප අංශ සඳහා වන වියදම වැඩිවීම හේතුවෙන් අතරමැදි භාණ්ඩ මත ආනයන වියදම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 3,115.7 සිට 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 4,065.7 ක් දක්වා සියයට 30.5 කින් වැඩි විය. ගල් අඟුරු ද ඇතුළත්ව ඉන්ධන ආනයනික වියදම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,070.1 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,390.3 ක් දක්වා සියයට 29.9 ක ප්‍රතිශතයකින් වර්ධනය වූ අතර, සමස්ත ඉන්ධන වියදමින් ආසන්න වශයෙන් සියයට 18 ක ප්‍රතිශතයක් බොරතෙල් ආනයනය සඳහා ද, ඉතිරි සියයට 82 ක ප්‍රතිශතය පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ද වැය විය. තෙල් පිරිපහදුවේ නඩත්තු කටයුතු හේතුවෙන්, 2021 මාර්තු මස දී බොරතෙල් ආනයනය නතර කර තිබුණ ද, දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා ඉහළ පරිමාවකින් යුතුව ඉහළ මිලකට පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය කිරීම නිසා 2021 වසරේ පළමු මාස හතර තුළ දී ඉන්ධන ආනයන වියදම ඉහළ යන ලදී. ප්ලාස්ටික් සහ ආශ්‍රිත ද්‍රව්‍ය ඇ. ඩො. මිලියන 257.8 ක් දක්වා සියයට 53.5 කින්ද, රසායනික නිෂ්පාදන ඇ. ඩො. මිලියන 364.6 ක් දක්වා සියයට 42.7 කින් ද, මූල ලෝහ ඇ. ඩො. මිලියන 194.2 ක් දක්වා සියයට 42.0 කින් ද, ඉහළ යන ලද අතර රෙදිපිළි ආනයනික වියදම ඇ. ඩො. මිලියන 938.6 ක් දක්වා සියයට 22.1 කින් ඉහළ යන ලදී. දියමන්ති (ඇ. ඩො. මිලියන 43.5 ක් දක්වා සියයට 60 කින්), කඩදාසි සහ කඩදාසි පුවරු (ඇ. ඩො. මිලියන 146.8 ක් දක්වා සියයට 22.3 කින්), රබර් (ඇ. ඩො. මිලියන 133.4 ක් දක්වා සියයට 65.6 කින්), කෘෂිකාර්මික යෙදවුම් (ඇ. ඩො. මිලියන 86.6 ක් දක්වා සියයට 24.9 කින්), බඩඉරිඟු සහ තිරිඟු (ඇ. ඩො. මිලියන 120.2 ක් දක්වා සියයට 35.3 කින්), පොහොර (ඇ. ඩො. මිලියන 82.2 ක් දක්වා සියයට 49.4 කින්) වැනි වෙනත් අතරමැදි භාණ්ඩ ආනයනික වියදම ද ඉහළ යන ලදී. කෙසේ වුවද ඛනිජ නිෂ්පාදන මත වූ ආනයනික වියදම ඇ.ඩො. මිලියන 44.5 ක් දක්වා සියයට 15.1 කින් පහත වැටුණි.

ප්‍රවාහන උපකරණ වියදම ඇ.ඩො. මිලියන 107.7 ක් දක්වා සියයට 42.5 කින් පහළ වැටුණ ද, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වියදම ඇ.ඩො. මිලියන 913.0 ක් දක්වා සියයට 33.2 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ඇ. ඩො. මිලියන 381.8 ක් දක්වා සියයට 6.2 කින් ද ඉහළ යාමෙන් ආයෝජන භාණ්ඩ ආනයනික වියදම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 1,233.4 සිට 2021 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 1,403.1 ක් දක්වා සියයට 13.8 කින් ඉහළ යන ලදී.

## ගෝලීය ආර්ථික ප්‍රවණතා

### කොවිඩ් - 19 වසංගතය සහ ගෝලීය ආර්ථිකය

වසංගත තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් එන්නත්කරණ වැඩසටහන් කඩිනම් කිරීම සහ රෝග ව්‍යාප්තිය මර්දනය කිරීමේ වෙනත් ක්‍රියාමාර්ග සමඟ ගෝලීය වශයෙන් ඉහළ වර්ධන මාවතක් පිළිබඳ අළුත් වූ බලාපොරොත්තු සමඟ 2021 වසර ආරම්භ විය. ඒ අනුව, 2021 වසරේ සියයට 6.0 ක සහ 2022 වසරේ සියයට 4.4 ක වර්ධනයක් අත් කරගනිමින් ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුවද, වෛරසයේ නව හා වේගයෙන් බෝවන ප්‍රභේද ලොව පුරා හට ගැනීම සහ ලෝකයේ විවිධ ප්‍රදේශවල කොවිඩ් ආසාධිතයන් සංඛ්‍යාව වර්ධනය වීම නිසා ඇති වූ විවිධ අවිනිශ්චිතතා හේතුවෙන් වර්ධනය පිළිබඳ ගෝලීය අපේක්ෂා බලපෑමට ලක් විය හැක.

2021 ජූනි මස 27 වන දින වන විට, ගෝලීය මරණ සංඛ්‍යාව මිලියන 3.9 දක්වා ද ආසාධිත සංඛ්‍යාව මිලියන 180.7 දක්වා ද ඉහළ දමමින්, සෑම සමාජයකම සමාජ ආර්ථික සන්දර්භයටම හානි පමුණුවමින් කොවිඩ් - 19 වසංගතය මිනිස් ජීවිත වලට හානි පමුණුවා ඇත. එක්සත් ජනපදයට පසුව, මිලියන 30.18 ක් වූ වැඩිම මුළු අසාධිතයින් සංඛ්‍යාව වාර්තා කරමින්, සුවිශාල නව කොවිඩ් රැල්ලක් ඉන්දියාවෙන් මතුවිය. බ්‍රසීලයේ මිලියන 18.38 දක්වා ද, ප්‍රංශයේ මිලියන 5.8 දක්වා ද, ජර්මනියේ මිලියන 3.7 දක්වා ද මුළු අසාදිතයින් සංඛ්‍යාව ඉහළ දමමින්, ප්‍රංශය සහ ජර්මනිය වැනි යුරෝපා රට වලද බ්‍රසීලය වැනි අනෙකුත් රටවල ද ආසාධිත සංඛ්‍යාවේ වර්ධනයක් වාර්තා කෙරිණ.

එන්නත් බෙදා හැරීම සහ එන්නත්කරණයට ඇති ප්‍රවේශය සම්බන්ධයෙන් ලොව පුරා සංකීර්ණ තත්ත්වයක් පවතියි. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ වේගය එක් එක් රටවල් එන්නත්කරණයට ඇති ප්‍රවේශය මත රඳා පැවතිය ද, රටවල් වල ආදායම් තත්ත්වය අනුව එන්නත්කරණයට ඇති ප්‍රවේශය දැඩි විෂමතාවයක් පෙන්නුම් කරයි. "Our World in Data" වෙබ් අඩවියට අනුව 2021 ජුනි මස 26 වැනි දින වන විට ලෝක ජනගහනයෙන් සියයට 22.6 ක් අවම වශයෙන් කොවිඩ් - 19 සඳහා ලබා දෙන එන්නතක එක මාත්‍රාවක්වත් ලබා ගෙන ඇත. රටවල් 212ක් විසින් මාත්‍රා බිලියන 2.8 ක් ලබා දී ඇති අතර, සෑම දිනයකම මාත්‍රා මිලියන 41.2 ක් ලබා දෙනු ලබයි.

2021 ජුනි මස 25 වැනි දින වන විට ලොව පුරා ලබා දී ඇති මාත්‍රා බිලියන 2.8 න් , සියයට 32.7 ක් ඉහළ ආදායම් ලබන රටවල් විසින් ද, සියයට 52.6 ක් ඉහළ මැදි ආදායම් ලබන රටවල් විසින් ද, සියයට 14.4 ක් පහළ මැදි ආදායම් ලබන රටවල් විසින් ද, සියයට 0.3 ක් පහළ ආදායම් ලබන රටවල් විසින් ලබා දී ඇත. මෙයින් අදහස් වන්නේ, එන්නත්කරණය සඳහා සියල්ලන්ටම ප්‍රවේශය ලබා දීම සඳහා පහළ ආදායම් ලබන රටවලට මූල්‍යමය සහාය ලබා දීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බවයි.

ලොව පුරා එන්නත්කරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට අමතරව, සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගෙන යන අතරතුර, තිරසර සහ සියලු දෙනාට ප්‍රතිලාභ සැලසෙන ලෙස ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා රටවල් විසින් ප්‍රයන්ත දරන අතරතුර, වසංගත තත්ත්වයේ අයහපත් බලපෑම් මගහරවා ගැනීමට ගෝලීය වශයෙන් ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙනසකට භාජනය වී තිබේ. ඉහළ වර්ධනයක් සහිත අංශවල රැකියා උත්පාදනය කිරීමට පහසුකම් සැලසීම, වෙළඳ පිරිවැය අවම කිරීම මෙන්ම, අධ්‍යාපනය සහ සෞඛ්‍යය, අන්තර් සබඳතාවය (Connectivity) සහ හරිත සහ ස්ථාවර (resilient) යටිතල සහසුකම් ගොඩනැංවීම සඳහා රාජ්‍ය ආයෝජන මේ සඳහා අවශ්‍ය වේ. මෙම සන්දර්භය යටතේ, වර්ධනය සඳහා ඇති අවස්ථාවලට හානියක් නොවන සේ, රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාවය වැඩි කිරීම, සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රමුඛතා කිරීම සහ වඩාත් හොඳින් ඉලක්කගත කළ සමාජ සුබසාධන කටයුතු සමඟ රාජ්‍ය මූල්‍ය අවකාශය නැවත ගොඩනැගීම අභියෝගයක්ව පවතියි. පහළ ආදායම් ලබන රටවල ද්‍රවශීලතා සහ ණය ගෙවීම පිළිබඳ ගැටලු විසඳා ගැනීම සඳහා සහාය වීම, ගෝලීය වශයෙන් සම්බන්ධීකරණය කළ ණය සහන ප්‍රයන්ත ස්ථාපනය කිරීම සහ ප්‍රධාන හඳුනාගත් ක්ෂේත්‍ර වල ආර්ථික වශයෙන් පරිවර්තනයක් ඇති කළ හැකි ආයෝජන සඳහා පහසුකම් සැලසීම සඳහා ගෝලීය සහයෝගීතාවය අත්‍යාවශ්‍ය වේ.

මෙම සන්දර්භය යටතේ, ගෝලීය ආර්ථිකය වර්ධන මාවතකට අවතීර්ණ වී වේගයෙන් යථා තත්ත්වයට පත් වෙතැයි පුරෝකථනය කර තිබුණ ද, ඉහළ යන තෙල් සහ පාරිභෝගික භාණ්ඩ මිල සමඟ ඇති වූ ඉහළ උද්ධමන පීඩාකාරී තත්ත්වයන්, ගෝලීය විරැකියාවට අඛණ්ඩව ඇති වන බලපෑම්, පුළුල් වූ අයවැය හිඟ යන් සහ වැඩි වූ ගෝලීය ණය මට්ටම් සහ එක්සත් ජනපද ප්‍රතිපත්ති පොලී අනුපාතවල බලපෑම්, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින රටවලට තවදුරටත් ගැටලුවක්ව පවතියි.

### ගෝලීය ආර්ථිකයේ වර්ධනය

2020 වසරේදී වාර්තා කරන ලද සියයට 3.3 ක තීව්‍ර සංකෝචනයෙන් අනතුරුව, 2021 වසරේදී ලෝක ආර්ථිකය යළි යථා තත්ත්වයට පත් වෙතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකය 2021 වසරේදී සියයට 5.5 කින් ද 2022 වසරේදී 4.2 කින් ද වර්ධනය වෙතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2021 ජනවාරි මාසයේ දී ඇස්තමේන්තු කරන ලදී. කෙසේ වුවද, 2021 අප්‍රේල් මාසය වන විට එම මාසයේදී පළ කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook) මඟින්, එම පුරෝකථනයන් 2021 වසර සඳහා සියයට

6ක් ලෙස ද 2022 වසර සඳහා සියයට 4.4 ක් ලෙස ද ඉහළ දමන ලදී. ඒ අතර, 2021 ජූනි මස පළ කරන ලද "ගෝලීය ආර්ථික අපේක්ෂා" (Global Economic Prospects) යන වාර්තාව මඟින්, ලෝක බැංකුව 2021 වසරේ ගෝලීය ආර්ථිකය සියයට 5.6 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වසංගත තත්ත්වය ඇති වීමත් සමඟ ලෝක ආර්ථික වර්ධනය පිළිබඳ ඇස්තමේන්තු කිරීම තවදුරටත් අවිනිශ්චිත වී ඇති බව මෙයින් අදහස් වේ.

එන්නත්කරණ ආවරණයේ වේගය, කොවිඩ් වසංගතයේ ආසාධිත සංඛ්‍යාව ඉහළ යමින් නව රැලි මතු වීම, ලැබෙන ප්‍රතිපත්තිමය සහායේ ප්‍රමාණය, ණය මට්ටම්, සංචාරක කර්මාන්තය මත ආර්ථිකයේ රැඳියාව වැනි ව්‍යුහාත්මක කරුණු මත රඳා පවතිමින්, ලෝකයේ විවිධ කලාප සහ රටවල ආර්ථික වර්ධනය විෂම වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇස්තමේන්තු අනුව, සංවර්ධිත රටවල; 2020 වසරේ දී වාර්තා වන ලද සියයට 4.7 ක ප්‍රබල සංකෝචනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 5.1 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජනපදය සියයට 6.4 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, යූරෝ කලාපය සියයට 4.4 කින් වර්ධනය වනු ඇත. ජපානය, එක්සත් රාජධානිය සහ කැනඩාව, 2021 වසරේ දී පිළිවෙලින් සියයට 3.3 කින්, සියයට 5.3 කින් සහ සියයට 5 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. චීනයේ සහ ඉන්දියාවේ පිළිවෙළින් සියයට 8.4 ක හා 12.5 ක ප්‍රබල ආර්ථික වර්ධන අපේක්ෂාවන් අනුව, නැඟී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින රටවල් 2020 වසරේදී වාර්තා වූ සියයට 2.2 ක සංකෝචනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 6.7 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව, සියයට 8.6 කින් වර්ධනය වීමට නියමිත අතර, නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින යුරෝපය සියයට 4.4 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අතර, ලතින් ඇමෙරිකානු හා කැරිබියන් කලාපය, මැද පෙරදිග හා මධ්‍යම ආසියාව සහ උප සහරානු අප්‍රිකාව, පිළිවෙලින් සියයට 4.6 කින්, සියයට 3.7 කින් සහ සියයට 3.4 කින් වර්ධනය වීමට අපේක්ෂිතය.

### *දකුණු ආසියානු වර්ධන අපේක්ෂා*

2021 ජූනි මස ලෝක බැංකු ඇස්තමේන්තු අනුව, 2021 වසරේදී දකුණු ආසියානු ආර්ථිකය සියයට 6.8 කින් වර්ධනය වීමට නියමිතය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ඉන්දියානු ආර්ථිකය සියයට 12.5 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කර තිබුණ ද, කොවිඩ් -19 අසාධිත සංඛ්‍යාවේ විශාල වර්ධනයක් සමඟ එම වර්ධන අපේක්ෂා වලට බාධා පැමිණෙනු ඇත. කෙසේ වුවද, කලාපයේ ආර්ථිකය විවිධ මට්ටම් වලින් වර්ධනය වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේක්ෂා කරයි. : මාලදිවයින (සංචාරක කර්මාන්තය මත රඳා පැවැත්ම හේතුවෙන් 2020 දි වාර්තා කළ සියයට 32.2 ක සංකෝචනයට පසු සියයට 18.9), බංගලාදේශය (සියයට 5.0), ඇෆ්ගනිස්තානය (සියයට 4.0), නේපාලය (සියයට 2.9), පකිස්ථානය (සියයට 1.5) සහ භූතානය (සියයට -1.9).

### විරැකියාව

කොවිඩ් -19 වසංගතය හේතුවෙන් 2020 වසරේ දී සේවා නියුක්තිය සහ ජීවනෝපාය කෙරෙහි දැඩි ලෙස හානි පැමිණුනු අතර, මෙම තත්ත්වය 2021 වසර වෙත ද බලපෑම් එල්ල කොට තිබේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව, සමස්ත වැඩ කරන පැය ගණනින් සියයට 8.8 ක් අහිමි වී ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. විරැකියාව හෝ ආර්ථික වශයෙන් අක්‍රියතාවයට පත්වීම හේතුවෙන් 2019 වසරට සාපේක්ෂව, 2020 වසරේදී සමස්ත රැකියා නියුක්තිය මිලියන 114 කින් අඩු විය. ගෝලීය සමස්ත රැකියා හිඟය 2020 වසරේදී රැකියා මිලියන 144 කින් වැඩි විය. මෙම ප්‍රවණතා 2021 වසරේදී අඛණ්ඩව පැවතුණ අතර, 2021 වසරේ පළමු කාර්තුවේදී වැඩ කරන පැය සියයට 4.8 කින් එනම් පූර්ණ කාලීන රැකියා මිලියන 140 කින් සමස්ත වැඩ කරන පැය හිඟ යක් ඇති වී ඇති අතර, 2021 වසරේ දෙවන කාර්තුවේදී සියයට 4.4 කින් කින් එනම් පූර්ණ කාලීන රැකියා මිලියන 127 කින් සමස්ත වැඩ කරන පැය හිඟයක් ඇති වී ඇත. වැඩ කරන පැය අහිමි වීම හේතුවෙන්, වසංගත තත්ත්වයට පෙර ඇස්තමේන්තුවට සාපේක්ෂව 2020 වසරේදී සියයට 8.3 කින් එනම්, ඇ.ඩො. ට්‍රිලියන 3.7කින් ගෝලීය කම්කරු ආදායම අඩු වූ අතර, ගෝලීය දුරිද්‍රතාවය ඉහළ දමමින්, 2021 පළමු කාර්තු දෙක අතරතුරදී සියයට 5.3 කින් එනම් ඇ. ඩො. ට්‍රිලියන 1.3 කින් ගෝලීය කම්කරු ආදායම අඩු වී ඇත.

ගෝලීය ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීම සමඟ, 2021 වසරේ දී මිලියන 100 ක් සහ 2022 වසරේදී මිලියන 80 ක රැකියා උත්පාදනය වනු ඇතැයි පුරෝකථනය කර තිබුණ ද, වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ රැකියා හිඟය පියවීම සඳහා මෙම පුරෝකථනය කළ රැකියා වල වර්ධනය ප්‍රමාණවත් නොවන බව ඇස්තමේන්තු ගත කර තිබේ. වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ගෝලීය රැකියා හිඟය 2021 වසරේදී මිලියන 75 ක් ද 2022 වසරේදී මිලියන 23 ක් ද වනු ඇතැයි අපේක්ෂිතය. විරැකියා අනුපාතය 2021 වසරේදි සියයට 6.3 ක් දක්වා ද වැඩි වනු ඇතැයි ද 2022 වසරේදී සියයට 5.7 ක් දක්වා අඩු වනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

### ගෝලීය වෙළඳාම

ගෝලීය වෙළඳාම, 2020 වසරේදී වාර්තා කළ සංකෝචනයෙන් අනතුරුව, 2021 වසරේ පළමු කාර්තුවේදී ලක්ෂ්‍යමය පදනමින් සියයට 10 ක වර්ධනයක් වාර්තා කරන ලද අතර, මෙයට ප්‍රධාන හේතුව වූයේ

නැගෙනහිර ආසියානු රටවල අපනයනයේ වර්ධනයයි. 2020 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව ආනයන වල සියයට 12 ක වර්ධනයක් සහ අපනයන වල සියයට 7 ක වර්ධනයක් සහිතව, සංවර්ධිත රටවල වෙළඳාම 2021 වසරේ පළමු කාර්තුවේදී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සංවර්ධනය වෙමින් පවතින රටවල ආනයන හා අපනයන 2021 වසරේ පළමු කාර්තුවේ දී පිළිවෙලින් සියයට 18.0 ක සහ සියයට 22.0 ක වර්ධනයක් වාර්තා කළේය. ඛනිජ (සියයට 42), සන්නිවේදන උපකරණ (සියයට 38), කාර්යාල උපකරණ (සියයට 37), වෙනත් නිෂ්පාදන (සියයට 33), රෙදිපිළි (සියයට 28) ලෙස වර්ධනය වූ අංශ 2021 වසරේ වෙළඳාමේ ඇති වූ වර්ධනයට දායක විය. එමෙන්ම, ප්‍රවාහන හා සංචාරක සේවා වල ඇති වූ බාධා හමුවේ වුවද, ලෝක සේවා වෙළඳාම ද 2021 වසරේ පළමු කාර්තුවේ දී යථා තත්ත්වයට පත් විය.

## උද්ධමනය

ලෝක බැංකු ඇස්තමේන්තුවලට අනුව, 2021 වසර පුරාම වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත තෙල් මිල සමඟ පාරිභෝගික භාණ්ඩවල මිල වැඩිවීම, ගෝලීය සැපයුම් දාමයේ අවහිරතා හේතුවෙන්, ගෝලීය උද්ධමනය 2020 වසරේ වාර්තා කළ සියයට 2.5 සිට 2021 වසරේදී ප්‍රතිශතාංක 1.4 කින් සියයට 3.9 දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය වර්ධන අපේක්ෂා සහ තෙල් මිල සම්බන්ධ පුරෝකථන සලකා බලමින්, සංවර්ධිත රටවල උද්ධමනය 2020 වසරේ සියයට 0.5 සිට 2021 වසරේ සියයට 1.8 දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත අතර, නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින රටවල උද්ධමනය 2020 වසරේ දී සියයට 3.1 සිට 2021 වසරේදී සියයට 4.6 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර තිබේ.

වගුව **1.5 :** තෝරාගත් රටවල් කිහිපයක මූලික ආර්ථික දර්ශක සාරාංශය - 2020

| රට | 2020 | | | | |
|---|---|---|---|---|---|
| | ද.දේ.නි.වර්ධනය (වාර්ෂික ප්‍රතිශත වෙනස) | උද්ධමනය (ප්‍රතිශතය) | සේවා වියුක්තිය (ප්‍රතිශතය) | රාජ්‍ය මූල්‍ය හිඟය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | දළ රාජ්‍ය ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) |
| ආජන්ටිනාව | -10.0 | 42 | 11.4 | -8.9 | 103.0 |
| ඕස්ට්‍රේලියාව | -2.4 | 0.9 | 6.5 | -9.9 | 63.1 |
| බ්‍රසීලය | -4.1 | 3.2 | 13.2 | -13.4 | 98.9 |
| කැනඩාව | -5.4 | 0.7 | 9.6 | -10.7 | 117.8 |
| චිලී | -5.8 | 3 | 10.8 | -7.1 | 32.5 |
| චීනය | 2.3 | 2.4 | 3.8 | -11.4 | 66.8 |
| ප්‍රංශය | -8.2 | 0.5 | 8.2 | -9.9 | 113.5 |
| ජර්මනිය | -4.9 | 0.4 | 4.2 | -4.2 | 68.9 |
| ග්‍රීසිය | -8.2 | -1.3 | 16.4 | -9.9 | 213.1 |
| ඉන්දියාව | -8.0 | 6.2 | ... | -12.3 | 89.6 |
| ඉන්දුනීසියාව | -2.1 | 2 | 7.1 | -5.9 | 36.6 |
| ඉතාලිය | -8.9 | -0.1 | 9.1 | -9.5 | 155.6 |
| ජපානය | -4.8 | 0 | 2.8 | -12.6 | 256.2 |
| කොරියාව | -1.0 | 0.5 | 3.9 | -2.8 | 48.7 |
| මැලේසියාව | -5.6 | -1.1 | 4.5 | -5.1 | 67.5 |
| මෙක්සිකෝව | -8.2 | 3.4 | 4.4 | -4.6 | 60.6 |
| රුසියාව | -3.1 | 3.4 | 5.8 | -4.1 | 19.3 |
| සිංගප්පූරුව | -5.4 | -0.2 | 3.1 | -8.9 | 128.4 |
| දකුණු අප්‍රිකාව | -7.0 | 3.3 | 29.2 | -12.2 | 77.1 |
| ස්පාඤ්ඤය | -11.0 | -0.3 | 15.5 | -11.5 | 117.1 |
| ශ්‍රී ලංකාව | -36.0 | 4.6 | 5.5 | -11.1 | 101.0 |
| තායිලන්තය | -6.1 | -0.8 | 2 | -4.7 | 49.6 |
| එක්සත් රාජධානිය | -9.9 | 0.9 | 4.5 | -13.4 | 103.7 |
| එක්සත් ජනපදය | -3.5 | 1.2 | 8.1 | -15.8 | 127.1 |
| වියට්නාමය | 2.9 | 3.2 | 3.3 | -5.4 | 46.6 |
| වෙනිසියුලාව | -30.0 | 2,355 | 55.5 | -5.0 | 304.1 |

මූලාශ්‍ර : *World Economic Outlook*, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් *2021*; *Fiscal Monitor*, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් *2021* හා වාර්ෂික වාර්තාව *2020*, ශ්‍රී ලංකා මහ බැංකුව
... දත්ත නොමැත

## පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ

2020 වසරේ දී වාර්තා කළ ප්‍රබල අඩු වීමෙන් පසු, 2021 වසරේදී පාරිභෝගික භාණ්ඩවල මිල වැඩි විය. බලශක්ති මිල ගණන් ඉහළ යන ලදී. බ්‍රෙන්ට් බොර තෙල් මිල හතරවන කාර්තුවේ වාර්තා වූ බැරලයකට ඇ. ඩො. 44.5 ට සාපේක්ෂව, 2021 පළමු කාර්තුවේ දී සියයට 36.2 කින් බැරලයකට ඇ.ඩො. 60.6 ක් දක්වා වැඩි විය. ඕස්ට්‍රේලියානු සහ දකුණු අප්‍රිකානු ගල් අගුරු මිල ගණන්, 2021 පළමු කාර්තුවේදී පිළිවෙලින් සියයට 30.5 කින් සහ සියයට 20.7 කින් ඉහළ යන ලදී. බලශක්ති නොවන සහ කෘෂිකාර්මික මිල ගණන් ද 2021 වසරේ වැඩි වන ප්‍රවණතාවයක් පෙන්වන ලදී. 2020 වසරේ හතර වන කාර්තුවට සාපේක්ෂව, 2021 පළමු කාර්තුවේ දී බඩඉරිඟු මිල ගණන් මෙට්‍රික් ටොන් එකක් ඇ. ඩො. 214.6 ක් දක්වා සියයට 11.8 කින් ද, හාල් (තායිලන්ත 5%) මිල මෙට්‍රික් ටොන් එකක් ඇ. ඩො. 542.3 දක්වා සියයට 9.9 කින් ද තිරිඟු මිල මෙට්‍රික් ටොන් එකක් ඇ. ඩො. 2,752 දක්වා සියයට 10.9 කින් ද වැඩිවිය. එමෙන්ම, 2020 වසරේ හතරවන කාර්තුවට සාපේක්ෂව, 2021 වසරේ පළමු කාර්තුවේ දී, ඇලුමිනියම් සියයට 9 කින් ද, තඹ සියයට 18 කින් ද, යකඩ සියයට 25.5 කින් ද, ඊයම් සියයට 5.8 කින් ද, නිකල් සියයට 10.4 කින් ද, ටින් සියයට 33. 4 කින් ද, සින්ක් සියයට 4.4 කින් ද ලෙස ලෝහ මිල ගණන් ඉහළ යන ලදී.

වගුව **1.6 :** ජාත්‍යන්තර භාණ්ඩවල මිල

| අයිතමය | ඒකකය | තත්‍ය | | | පුරෝකථන | | |
|---|---|---|---|---|---|---|---|
| | | **2019** | **2020** | **2021** | **2022** | **2023** | **2024** |
| බලශක්ති | | | | | | | |
| ගල් අඟුරු , ඕස්ට්‍රේලියාව | මෙ.ටො./ඩොලර් | 77.9 | 60.8 | 78.0 | 76.1 | 74.2 | 72.4 |
| බොර තෙල්, සාමාන්‍යය | බැරලයට ඩොලර් | 61.4 | 41.3 | 56.0 | 60.0 | 61.0 | 61.9 |
| ස්වාභාවික වායු, එ.ජ. | මෙට්‍රික් බ්‍රිතාන්‍ය තාප ඒකක මිලියනයට/ ඩොලර් | 2.6 | 2.0 | 2.8 | 2.9 | 2.9 | 3.0 |
| බලශක්ති නොවන | | | | | | | |
| කෘෂිකාර්මික | | | | | | | |
| පාන වර්ග | | | | | | | |
| කොකෝවා | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.34 | 2.37 | 2.40 | 2.43 | 2.47 | 2.50 |
| කෝපි, රොබස්ටා | කිලෝග්‍රෑමයට ඩොලර් | 1.62 | 1.52 | 1.60 | 1.63 | 1.66 | 1.70 |
| තේ | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.56 | 2.70 | 2.50 | 2.55 | 2.60 | 2.65 |
| ආහාර | | | | | | | |
| මේද සහ තෙල් | | | | | | | |
| පාම් තෙල් | මෙ.ටො./ඩොලර් | 601 | 752 | 975 | 983 | 992 | 1,001 |
| සෝයා පිටි | මෙ.ටො./ඩොලර් | 347 | 394 | 500 | 503 | 507 | 510 |
| සෝයා බෝංචි | මෙ.ටො./ඩොලර් | 369 | 407 | 550 | 555 | 561 | 566 |
| ධාන්‍ය | | | | | | | |
| බඩඉරිඟු | මෙ.ටො./ඩොලර් | 170 | 165 | 210 | 212 | 214 | 216 |
| සහල්, තායිලන්තය 5% | මෙ.ටො./ඩොලර් | 418 | 497 | 510 | 512 | 514 | 516 |
| තිරිඟු, එක්සත් ජනපදය., HRM | මෙ.ටො./ඩොලර් | 202 | 211 | 230 | 233 | 235 | 238 |
| වෙනත් ආහාර | | | | | | | |
| සීනි | කිලෝග්‍රෑමයට ඩොලර් | 0.28 | 0.28 | 0.34 | 0.35 | 0.35 | 0.36 |
| අමුද්‍රව්‍ය | | | | | | | |
| කපු | කිලෝග්‍රෑමයට ඩොලර් | 1.72 | 1.59 | 1.95 | 1.97 | 2.00 | 2.02 |
| රබර් | කිලෝග්‍රෑමයට ඩොලර් | 1.64 | 1.73 | 2.25 | 2.25 | 2.26 | 2.26 |
| ඉරූ දුව, අරටු සහිත ලී | ඝන මීටරයට ඩොලර් | 696 | 700 | 750 | 758 | 767 | 775 |
| ලෝහ සහ ඛනිජ | | | | | | | |
| ඇලුමිනියම් | මෙ.ටො./ඩොලර් | 1,794 | 1,704 | 2,200 | 2,050 | 2,100 | 2,150 |
| තඹ | මෙ.ටො./ඩොලර් | 6,010 | 6,174 | 8,500 | 7,500 | 7,000 | 7,500 |
| නිකල් | මෙ.ටො./ඩොලර් | 13,914 | 13,787 | 16,500 | 16,000 | 16,146 | 16,293 |

මූලාශ්‍රය : *World Commodity Outlook, 2021* අප්‍රේල්

## රාජ්‍ය මූල්‍ය අංශය

2020 වසරේ දී ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමට එරෙහිව ගන්නා ලද පෙර නොවූ විරූ මට්ටමක පැවති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමඟ ගෝලීය අයවැය හිඟය 2019 වසරේ දී සියයට 3.6 සිට 2020 වසරේ දී සියයට 10.8 දක්වා වැඩි විය. ගෝලීය අයවැය හිඟය 2021 වසරේ දී සියයට 9.2 දක්වා ද 2022 වසරේ දී සියයට 5.4 දක්වා ද අඩු වෙතැයි අපේක්ෂා කෙරේ. සංවර්ධිත රටවල්, සිය අයවැය හිඟය 2021 වසරේ සියයට 10.4 දක්වා ද 2022 වසරේ සියයට 4.6 දක්වා ද අවම කර ගැනීමට නියමිතය. නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින රටවල්, සංවර්ධිත රටවල් වලට වඩා අඩු මට්ටමකින් වුවද සිය අයවැය හිඟය, 2021 වසරේ සියයට 7.7 ක් දක්වා ද, 2022 වසරේ සියයට 6.7 ක් දක්වාද අඩු කර ගනු ඇතැයි අපේක්ෂිතය.

වර්ධනය වූ අයවැය පරතරයට සමගාමීව, ගෝලීය ණය මට්ටම් 2019 වසරේදී ද. දේ. නි. යෙන් සියයට 83.7 සිට 2020 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 97.3 ක් දක්වා වර්ධනය විය. ගෝලීය ණය මට්ටම් 2021 හා 2022 වසර වලදී පිළිවෙලින් සියයට 98.9 හා 99.0 දක්වා තවදුරටත් වර්ධනය වීමට නියමිතය. සංවර්ධිත රටවල ද.දේ.නි. යේ අනුපාතයක් ලෙස ණය මට්ටම 2019 වසරේ දී සියයට 103.8 සිට, 2020 වසරේ දී සියයට 120.1 ක් දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය වූ අතර, 2021 වසරේ දී සියයට 122.5 දක්වා එය තවදුරටත් වර්ධනය වනු ඇතැයි ද, 2022 වසරේ දී සියයට 121.6 දක්වා සුළු වශයෙන් අඩු වෙතැයි ද අපේක්ෂා කෙරේ. නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින රටවල ණය මට්ටම් ද, ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ සියයට 54.7 සිට 2020 වසරේ දී සියයට 64.4 දක්වා ප්‍රබල ලෙස වර්ධනය වූ අතර, 2021 වසරේ සියයට 65.1 දක්වා ද 2022 වසරේ සියයට 67.3 දක්වා ද තවදුරටත් වර්ධනය වීටම නියමිතය.

## මුදල් හා මූල්‍ය අංශය

වසංගත තත්ත්වය ආරම්භ වූ කාලයේ ඇති වූ ප්‍රබල අඩුවීම් ආපසු හරවමින්, ඉහළ යන පාරිභෝගික මිල ගණන් පෙන්නුම් කරමින් සහ ප්‍රබල වශයෙන් ඉහළ උද්ධමන සමායනයන් හේතු කොට ගෙන, 2020 මැද භාගයේ සිට එක්සත් ජනපදයේ දීර්ඝ කාලීන පොලී අනුපාත පදනම් අංක 125 කින් වැඩි වී ඇත. 2021 අප්‍රේල් මාසය වන විට, දීර්ඝකාලීන පොලී අනුපාත, වසංගතයට පෙර පැවති තත්ත්වයන් වෙත ළඟා වේ යැයි පවතින අපේක්ෂා සමඟ, මූර්ත පොලී අනුපාත ද ඉහළ යාමට ආරම්භ විය. 2021 අප්‍රේල් වන විට වෙනත් සංවර්ධිත රටවල දස අවුරුදු පොලී අනුපාතවල සාමාන්‍යය, පදනම් අංක 50 කින් ඉහළ යැමත් සමඟ, එක්සත් ජනපද දීර්ඝකාලීන එලදා අනුපාතික ඉහළයාම වෙනත් සංවර්ධිත රටවල ඒ හා සමාන එලදා අනුපාතික ඉහළ යාම සඳහා බලපෑමක් එල්ල කොට ඇත. කෙසේ වුවද, අනුපාත අඛණ්ඩව සහ සීඝ්‍රව වර්ධනය වීම, මූල්‍ය අවදානම් සහ සාර්ව - මූල්‍ය ස්ථාවරත්වයට බලපෑම් ඇති කරමින්, පොලී අනුපාතය වෙනස් වීම හේතුවෙන් අවදානම් තත්ත්වයක් ඇති කිරීමට සහ මූල්‍ය තත්ත්වයන් සංකීර්ණ කිරීමට හේතු විය හැක. මෙම තත්ත්වය නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින රටවලට, විශේෂයෙන්ම එම රටවල් දැඩි මූල්‍ය අවශ්‍යතාවයන්ට සහ දැඩි ණය බරතාවයකට මුහුණ දී සිටින අවස්ථාවක, ඔවුන්ගේ බැඳුම්කර වෙළෙඳපොළ සහ මුදල් ඒකක වලට බලපෑම් ඇති කරමින් විශාල වශයෙන් මුදල් පිටතට ගලා යාම් ඇති කිරීමට හේතුවිය හැක.

## ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඉදිරි දැක්ම

සාර්ව ආර්ථික ස්ථායිතාව, ණය තිරසාර මට්ටමෙන් පවත්වාගෙන යාම, මානව සම්පත් සංවර්ධනය, ඉලක්කගත කළ සමාජ ආරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට අනුගත වීමේ හැකියාව යනාදියෙන් සමන්විත වන සැමට ප්‍රතිලාභ සලසන, තිරසර සහ ස්ථාවර ආර්ථික වර්ධනයක අවශ්‍යතාවය, මෙම ගෝලීය ආර්ථික තත්ත්ව වලින් තවදුරටත් ප්‍රකාශ කරනු ලබයි. ලොව අනෙකුත් රටවල් සමඟ ශ්‍රී ලංකාවද වසංගත තත්ත්වය හේතුවෙන් සහ ඒ හා සම්බන්ධ ගෝලීය ආර්ථික කරුණු හේතුවෙන් ඇතිවන ඒ හා සමාන ප්‍රබල අභියෝග වලට මුහුණ දී තිබුණද, ආර්ථික කටයුතු වල පුනර්ජීවනය, කාර්යක්ෂම ආදායම් පරිපාලනය, ප්‍රමුඛගත රාජ්‍ය ආයෝජන සහ ප්‍රතිපත්ති ස්ථාවරත්වය සමඟ ප්‍රබල ආර්ථික වර්ධනයක් ලබා ගනු ඇතැයි අපේක්ෂිතය.

## 1. කොවිඩ්-19 හමුවේ රජය විසින් හඳුන්වාදුන් ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

### රාජ්‍ය මූල්‍ය අංශය

- ජනාධිපති අරමුදලෙන් රු. මිලියන 100 ක දායකත්වයක් සමඟින් කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කිරීම.
- කොවිඩ්-19 වසංගතයට පිළියමක් ලෙස සෞඛ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය හා දන්ත උපකරණ, ඖෂධ, රසායනික ද්‍රව්‍ය සහ ඒ සමාන උපකරණ ආනයනය කර සැපයීම හෝ ආනයනය කර පරිත්‍යාග කිරීම සඳහා බදු සහන ලබා දීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශය සහ වෙනත් රජයේ ආයතන වෙත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අපනයනාභිමුඛ ව්‍යවසායයන් විසින් සෞඛ්‍ය ආරක්ෂක උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සැපයීම හෝ පරිත්‍යාග කිරීම සඳහා බදු සහන ලබා දීම.
- ඖෂධ නිෂ්පාදන යන්ත්‍රසූත්‍ර හා උපකරණවල උපාංග සහ අමතර කොටස් ඇතුළුව එම යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය සඳහා බදු සහන ලබාදීම.
- කොවිඩ්-19 රෝගීන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය වන පර්යේෂණ කට්ටල ඇතුළුව වෛද්‍ය උපකරණ හා උපාංග ආනයනය සඳහා බදු සහන ලබාදීම.
- රු. බිලියන 50 ක ආරම්භක ප්‍රාග්ධනයක් සහිතව ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල (FPSF) පිහිටුවීම, ඉන්ධන ආනයන මත වූ රේගු බදු අධිභාරය එම අරමුදලට බැර කරන ලදී. කෙසේ වෙතත්, බනිජ තෙල් මිල ඉහළයාම හේතුවෙන් අධිභාරය ඉවත් කර ඇත.
- වැඩිහිටියන්, විශේෂ හැකියා ඇති අයවලුන්, වකුගඩු රෝගීන්, ගොවීන්, ජීවනෝපාය අහිමි වූ දෛනික වැටුප් ලබන්නන් සහ සංචරණ සීමා පැන වූ ප්‍රදේශවල වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් සඳහා 2020 අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා රු. 5,000 ක මාසික දීමනාවක් ලබාදීම.
- අලුත් අවුරුද්ද වෙනුවෙන් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා 2021 අප්‍රේල් මසට රු. 5,000 ක දීමනාවක් ලබාදීම.
- සති දෙකක නිරෝධායනයට ලක්වන පවුල් සඳහා ආදායම් තත්ත්වය නොසලකා රු. 10,000 ක වටිනාකමින් යුතු වියළි සලාක මල්ලක් ලබාදීම.
- කොවිඩ්-19 වසංගතය මැඩලීමේ ක්‍රියාදාමය වෙනුවෙන් 2020 වසර සඳහා රු. බිලියන 117.5 ක සහ 2021 ජනවාරි මස සිට ජුනි මස දක්වා රු. බිලියන 53.0 ක වියදමක් දැරීම.
- සියලුම සමෘද්ධි බැංකු හරහා අඩු ආදායම්ලාභීන්ට රු. 10,000 ක පොළී රහිත අත්තිකාරම් මුදලක් ලබාදීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇපකර මත වාණිජ බැංකු හරහා ණය සහන පමා කාලයක් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම.
- උපයෝගිතා බිල්පත් සහ රු. 50,000 ට අඩු මාසික ණයපත් බිල්පත් ගෙවීම් සඳහා මාසයක සහන කාලයක් ලබා දීම.
- කොරෝනා මර්දන කටයුතුවල නිරත වන සෞඛ්‍ය සේවකයින්, පොලීසිය, ත්‍රිවිධ හමුදා නිලධාරීන් ඇතුළු අනෙකුත් රාජ්‍ය සේවකයන්ගේ රක්ෂණ ප්‍රතිලාභය දෙගුණ කිරීම.
- සියළුම රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගැනීම් මත වූ ණය වාරික මාස දෙකක කාලයක් සඳහා වැටුපෙන් අය නොකිරීම.
- 2020 වසරේ පෙබරවාරි හා මාර්තු මාස වලට අදාල එකතු කළ අගය මත බද්ද සඳහා ගෙවීම් කාල සීමාව 2020 අප්‍රේල් මස 30 දක්වා දීර්ඝ කිරීම.
- කොවිඩ්-19 හේතුවෙන් රට අගුළුලා තිබූ කාලසීමාව ඇතුළත නොගෙවන ලද සියලුම බදු දඩ මුදල් වලින් නිදහස් කිරීම සහ ප්‍රමාද වී ගෙවීම් සඳහා වූ දඩ මුදල් 2020 ජුලි මස සිට අය කිරීමට උපදෙස් දීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන සහන ක්‍රියාමාර්ග, එනම් 2018/2019 තක්සේරු වර්ෂ තෙක් නිකුත් කරන ලද තක්සේරු කිරීම් මත ආදායම් බදු හිඟ මුදල් කපා හැරීම, 2019/2020 සඳහා අතිරේක ඇගයීම් නිකුත් නොකිරීම, හිඟ/පැහැර හැරීම් වලින් බදු පියවීම් සඳහා සහන කාලයක් ලබාදීම, අත්පත්කර ගැනීමේ දැන්වීම් දීර්ඝ කිරීම් සහ බදු වාර්තා පිරවීම සඳහා වූ දින දීර්ඝ කිරීම.

## විදේශ අංශය

- ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි කරනු ලබන ඕනෑම ආයෝජනයක්, බැහැරගත ප්‍රේෂණ සහ විගමනිකයින් මෙරට මුදල් ගෙන්වා ගැනීම යනාදී විදේශ මුදල් ගලායාම් මාස තුනක කාලයක් සඳහා අත්හිටුවීම.

- තෝරාගත් මෝටර් රථ සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීමේ දී ණයවර ලිපි නිකුත් කිරීම, පිළිගැනුම් මත ලේඛන සහ අත්තිකාරම් ණය පහසුකම් ලබාදීම මාස තුනකට අත්හිටුවීම.

- යම් යම් කොන්දේසි මත සියලුම අත්‍යවශ්‍ය නොවන ආනයනයන් සඳහා සීමා පැනවීම.

- සංචාරකයින් ලෙස විදෙස් ගතවන ලාංකිකයන් හට ලබාගත හැකි ඇ.ඩො. 10,000 සංචාරක දීමනා මුදල ඇ.ඩො. 5,000 (හෝ වෙනත් විදේශ මුදල් වලට සමාන) දක්වා පහත හෙළීමට බලයලත් විදේශ මුදල් නෝට්ටු නිකුත් කරන්නන් හට උපදෙස් දීම.

- විදේශ සංචිත ක්ෂය නොවන ලෙස කාලීන පදනමින් විදේශ මුදල් ද්‍රවශීලතාවය සැපයීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා විකුණුම්-මිලදී ගැනීම් විදේශ විනිමය හුවමාරු වෙන්දේසි හඳුන්වා දීම.

- ඉන්දීය සංචිත බැංකුව සමග ඇ.ඩො. මිලියන 400 ක ද්විපාර්ශවික මුදල් හුවමාරු ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා ගැනීම. ගිවිසුම අත්සන් කිරීම සඳහා අවශ්‍ය සියලුම පූර්ව අවශ්‍යතාවන් මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව විසින් ඉටු කොට ඇත.

- වාණිජ බැංකු මගින් සිදුවන විදේශ විනිමය වෙළෙඳපොළෙහි සමපේක්ෂණ ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා තෝරාගත් පදනමක් මත ශුද්ධ විවෘත ස්ථාන (NOP) සීමා කිරීම.

- රජයේ අඛණ්ඩ ද්‍රවශීලතා සැපයුම සඳහා ඇමරිකානු ෆෙඩරල් සංචිත බැංකුව සමග ඇ.ඩො. මිලියන 1,000 ක නැවත මිලදී ගැනීමේ පහසුකමක් ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගැනීම.

- බංගලාදේශ මහ බැංකුව සමග ඇ.ඩො. මිලියන 250 ක ද්විපාර්ශවික මුදල් හුවමාරු ගිවිසුමට සහ ඉන්දීය සංචිත බැංකුව සමග නැවතත් ඇ. ඩො. මිලියන 400ක ද්විපාර්ශවික මුදල් හුවමාරුවකට අවතීරණය වීම.

## මුදල් අංශය

- ත්‍රිරෝද රථ, ට්‍රක් රථ, පාසැල් වෑන් සහ බස්රථ සහ ස්වයං රැකියා නියුක්ත වාහන රියදුරන් ඇතුළුව ස්වයං රැකියා නියුක්තිකයන් මිලියන 1.5 ක් සඳහා මාස 6 කට කල්බදු ණය වාරික අයකිරීම අත්හිටුවීම.

- රටේ ආර්ථික ක්‍රියාවලියට උත්තේජනයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිය (SRR) සියයට 2.00 දක්වා පහත හෙළීම මගින් රු. බිලියන 150 ක ද්‍රවශීලතාවයක් ආර්ථිකයට මුදා හැරීම.

- ව්‍යාපාර සහ ආර්ථික කටයුතුවලට සහය වීම සඳහා රු. බිලියන 50 ක ප්‍රතිමූල්‍යකරණ පහසුකම් හඳුන්වා දීම.

- කොවිඩ්-19 නිසා හෝ මුහුණපාන අභියෝග කළමනාකරණයේ ජාතික කර්තව්‍යයට සහයවීම සඳහා විශේෂ තැන්පත් ගිණුමක් (SDA) හඳුන්වා දීම.

- වෙළෙඳපොළ ණය අනුපාතික අඩුකිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් ඒකක 250 කින් 4.50 සහ 5.50 දක්වා පහත හෙළීම.

- ණය කාඩ්පත් සඳහා තිබූ පොළී අනුපාතිකය රු. 50,000 දක්වා වූ දේශීය ගණුදෙනු සඳහා සියයට 15 දක්වා අඩු කිරීම හා අවම මාසික ගෙවීම් සියයට 50 කින් අඩු කිරීම.

- ඇඳිරි නීතිය පනවා නොමැති කාලය තුළ සියලු බැංකු ශාඛා විවෘත කිරීම තුළින් ජනතාව වෙත අඛණ්ඩව බැංකු සේවා සැපයීමට කටයුතු කිරීම.

- අභිමත පරිදි ගෙවීම් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් කපාහැරීම මඟින් අඛණ්ඩව ණය ප්‍රවාහයන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රලාභී බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම.

- ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය සඳහා සහාය වීමට නව ණය යෝජනා ක්‍රම 3 ක් ක්‍රියාත්මක කිරීම. මේ අනුව කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ (ඉදිකිරීම් සහ වෙනත්) ව්‍යාපාර සඳහා සියයට 4 ක වාර්ෂික පොලියකට ණය ලබාදීම සහ ආපසු ගෙවීමේ කාලය මාස 09 කට දීර්ඝ කිරීම.

- කොවිඩ්-19 වසංගතයේ 3 වන රැල්ලට බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් නව සහන සැලසීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම. මේ අනුව සක්‍රීය ණය, අක්‍රීය ණය හා වෙනත් පහසුකම් සඳහා විවිධ සහන හඳුන්වා දීම.

**පරිපාලනමය මෙහෙයුම්**

- කොවිඩ් එන්නත්කරණ ක්‍රියාවලිය 2021 වර්ෂයේ පෙබරවාරි මස සිට ආරම්භ කිරීම.

- කොවිඩ්-19 උවදුර මර්දනය සඳහා වූ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම කොවිඩ්-19 සෞඛ්‍ය සත්කාර, අධ්‍යාපනය, ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායන් ස්ථාපිත කිරීම හා සෞඛ්‍ය අවදානම් සහ ආර්ථික ලිහිල් කිරීමේ උපාය මාර්ග කළමනාකරණය කිරීම සඳහා ඉහළ මට්ටමේ සම්බන්ධීකරණ සභාවක් පිහිටුවීම.

- ජාතික බෝවන රෝග විද්‍යායතනය සහ තවත් රෝහල් විශාල ප්‍රමාණයක් කොවිඩ්-19 රෝගී ප්‍රතිකාර සඳහා සූදානම් කිරීම සහ දිවයින පුරා නිරෝධායන මධ්‍යස්ථාන 34 ක් ස්ථාපිත කිරීම.

- 2021 මැයි මාසය වනවිට දෛනික පී.සී.ආර්. (PCR) පරීක්ෂණ සංඛ්‍යාව 25,000 ඉක්මවීම.

- ආහාර හා ඖෂධ ප්‍රතිලාභීන්ගේ නිවෙස්වලටම බෙදාහැරීම.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ තැපැල් සේවා මගින් විශ්‍රාමිකයින් 645,179 කට විශ්‍රාම වැටුප් ගෙවීම.

- ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා "සෞභාග්‍යා" ගෙවතු වගා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.

- ගොවිතැන්/ගෙවතු වගාව දිරි ගැන්වීම උදෙසා අඩු ආදායම්ලාභී පවුල්වලට පොහොර සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම.

- රෝහල් ඇඳන්, විෂබීජ හරණකුටි, විෂබීජහරණ දියර වැනි නිෂ්පාදන රට තුළදීම නිපදවීමට දේශීය නිෂ්පාදකයන් සහ නව නිපැයුම්කරුවන් දිරිමත් කිරීම.

- දේශීය මෙන්ම අපනයන ඉල්ලුම සපුරාලීම පිණිස සියලුම කෘෂිකාර්මික කටයුතු සඳහා ඇඳිරිනීතිය වැනි අනෙකුත් සියලුම සීමා ලිහිල් කිරීම.

- දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) කොවිඩ්-19 අරමුදලට ඇ.ඩො. මිලියන 5 ක් ප්‍රදානය කිරීම.

# 2 වන පරිච්ඡේදය

# රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

## සමාලෝචනය

පෞද්ගලික අංශය දිරිමත් කරමින්, විශේෂයෙන් වඩාත් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හා සමගාමීව දැනටමත් ස්ථාපිත සරල හා විනිවිද බදු ක්‍රමය හේතුවෙන් ව්‍යවසායකයින් ආර්ථිකයේ වඩාත් ඵලදායී අංශවල ආයෝජනය කිරීමට දිරි ගන්වමින් රටේ සමස්ත ඉල්ලුම තවදුරටත් වේගවත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති සහාය 2021 වසරේ මුල් භාගයේ දී ද අඛණ්ඩව ලබා දෙන ලදී. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතයේ බලපෑම සහ ගෝලීය ආර්ථිකයේ පෙර නොවූවිරූ මට්ටම්වල කැළඹීම් රජයේ මූල්‍ය මෙහෙයුම් කෙරෙහි දැඩි බලපෑම් ඇති කර ඇත. එවැනි අභියෝග මධ්‍යයේ, 2021 වසරේ මුල් මාස හතර තුළ ප්‍රදාන ඇතුළු රජයේ ආදායම රු. බිලියන 482.3 ක් වූ අතර, එය රු. බිලියන 1,961 ක් වූ 2021 වසරේ වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 25 කට ආසන්නය.

2020 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 476.7 ක් වූ රාජ්‍ය ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 481.7 ක් දක්වා වැඩි වීමත් සමඟ රජයේ ආදායම් එක්රැස් කිරීමේ ප්‍රයත්නයත් සාර්ථක වී ඇත. 2021 වසරේ පළමු මාස හතර තුළ දී එකතු කළ අගය මත බද්ද (VAT), වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද (PAL), සෙස් (CESS) බද්ද සහ සුරාබද්ද තුළින් ලද ඉහළ ආදායම් හේතුවෙන් රජයේ බදු ආදායම, 2020 වසරේ එම කාලය තුළ පැවති රු. බිලියන 408.5 ට සාපේක්ෂව සියයට 4.6 කින් එනම් රු. බිලියන 427.3 ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ නමුත්, මහ බැංකු ලාභ මාරු කිරීම් වලින් ලැබෙන ආදායම පහත වැටීම හේතුවෙන් බදු නොවන ආදායම රු. බිලියන 24 සිට රු. බිලියන 15 දක්වා සියයට 20.2 කින් පහළ වැටී ඇත.

2020 වසරේ පළමු මාස හතර තුළදී රු. බිලියන 81.4 ක් වූ ආදායම් බදු ආදායම 2021 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී රු. බිලියන 55.2 ක් දක්වා සියයට 32.1 කින් පහළ ගොස් ඇත. 2020 වසරේ කොවිඩ්-19 පැතිරීම අවම කිරීම සඳහා පනවා තිබූ සංචරණ සීමා හේතුවෙන් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු වලින් ලැබූ ආදායම රු. බිලියන 47.0 ක් දක්වා සියයට 18.7 කින් පහළ ගොස් ඇත. 2021 වසරේදී ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනය පිළිබිඹු කරමින් 2020 වසරේ පළමු මාස හතර තුළ රු. මිලියන 59 ක් වූ ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලද ආදායම 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 191 දක්වා සියයට 227.2 කින් ඉහළ ගොස් ඇත.

දේශීය පරිභෝජනය පදනම් කරගත් බදු වලින් ලද ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 145.3 ක් දක්වා සියයට 19.9 කින් ඉහළ ගොස් ඇත. 2021 වසරේ පළමු මාස හතර තුළ දී දේශීය ක්‍රියාකාරකම් මත සුරාබද්දෙන්/නිෂ්පාදන බද්දෙන් එකතු වූ ආදායම රු. බිලියන 82.7 ක් දක්වා සියයට 15.6 කින් ඉහළ ගිය අතර දේශීය ක්‍රියාකාරකම් මත වැට් බද්දෙන් ලැබූ ආදායම රු. බිලියන 48.2 සිට රු. බිලියන 62.4 දක්වා සියයට 31.2 කින් වැඩි විය.

මේ අතර, 2021 අයවැයෙන් ප්‍රකාශයට පත් කර ඇති පරිදි, රේගු බදු අනුපාත තාර්කිකකරණය සඳහා රජය සියයට 0, 10 සහ 15 යන කාණ්ඩ තුනක රේගු බදු ව්‍යූහයක් හඳුන්වා දී ඇත.

ආනයන මත වැට් බද්ද, රේගු ආනයන බද්ද (CID), සෙස් බද්ද (CESS) සහ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද (PAL) යන ආනයන පාදක බදු වලින් ලද ආදායම රු. බිලියන 200.7 ක් දක්වා සියයට 5.6 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, 2021 වසරේ මුල් මාස හතර තුළදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් (SCL) එකතු කරන ලද ආදායම රු. බිලියන 20.5 ක් දක්වා සියයට 14.9 කින් අඩු වූ අතර, ආනයන සීමා කිරීම් හේතුවෙන් මෝටර් රථ ආනයනයෙන් ලැබෙන බදු ආදායම පහත වැටීම නිසා ආනයන සම්බන්ධ නිෂ්පාදන බදු රු. බිලියන 28.6 දක්වා සියයට 49.0 කින් පහළ ගොස් ඇත.

වගුව 2.1 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා අයවැය සාරාංශය

රු. මිලියන

| අයිතමය | 2020 | 2021 (තාවකාලික) |
|---|---|---|
| ආදායම් හා ප්‍රදාන | **478,696** | **482,289** |
| ආදායම | **476,733** | **481,722** |
| බදු | 408,484 | 427,261 |
| බදු නොවන | 68,248 | 54,461 |
| ප්‍රදාන | 1,963 | 567 |
| වියදම | **930,871** | **1,002,832** |
| පුනරාවර්තන | **820,685** | **890,085** |
| පොලී ගෙවීම් | 336,216 | 366,240 |
| අනෙකුත් | 484,469 | 523,844 |
| රාජ්‍ය ආයෝජන | 118,928 | 114,227 |
| අනෙකුත් | -8,742 | -1,480 |
| ආදායම් අතිරික්තය (+)/ හිඟය (-) | **-343952** | **-408,362** |
| සමස්ත අයවැය අතිරික්තය(+)/හිඟය (-) | **-452175** | **-520,543** |
| මූල්‍යනය | **452,175** | **520,543** |
| විදේශීය මූල්‍යනය | **26,299** | **16,994** |
| ණය ගැනීම් | 118,439 | 127,077 |
| ණය ආපසු ගෙවීම් | -92,139 | -110,083 |
| දේශීය මූල්‍යනය | **425,876** | **503,549** |
| ණය ගැනීම් | 1,030,188 | 1,397,680 |
| ණය ආපසු ගෙවීම් | -604,312 | -894,131 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ප්‍රධාන වශයෙන් පුනරාවර්තන වියදම් වැඩිවීම හේතුවෙන්, 2020 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 930.9 ක් වූ රජයේ මුළු වියදම, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 1,002.8 ක් දක්වා සියයට 7.7 කින් වැඩි වී ඇත. කොවිඩ් බලපෑමට ලක්වූ පවුල් සඳහා සහන සහ ජීවනෝපාය ආධාර සැපයීම මෙන්ම නිරෝධායන ක්‍රියාකාරකම් සහ එන්නත් ආනයන වියදම් වැනි කොවිඩ් ව්‍යාප්තිය අවම කිරීමේ පියවර වැනි කොවිඩ්-19 සම්බන්ධ සෘජු වියදම් සහ පොලී ගෙවීම්, වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා වන වියදම් වැඩිවීම හේතුවෙන් 2020 වසරේ පළමු මාස හතර තුළදී රු. බිලියන 820.7 ක් වූ පුනරාවර්තන වියදම්, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 890.1 ක් දක්වා සියයට 8.5 කින් ඉහළ යන ලදී. විදේශීය ණය සඳහා පොලී ගෙවීම් අඩු වී තිබියදීත් 2021 වසරේ පළමු මාස හතර තුළ පොලී ගෙවීම් සඳහා වන වියදම රු. බිලියන 366.2 ක් දක්වා සියයට 8.9 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම, 2021 වසරේ පළමු මාස හතර තුළ වැටුප් හා වේතන රු. බිලියන 274.0 ක් දක්වා සියයට 8.0 කින් ද විශ්‍රාම වැටුප් ගෙවීම් රු. බිලියන 87.3ක් දක්වා සියයට 9.3 කින් ද වැඩි වී ඇත. එසේම, 2020 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 110.2 ක් ලෙස වාර්තාවූ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 112.7 දක්වා සියයට 2.3 කින් වැඩි වී ඇත.

වගුව **2.2 :** 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත (වාර්ෂික) | තාවකාලික (ජන.-අප්‍රේ.) | සාධනය (%) |
|---|---|---|---|
| මුළු ආදායම | **1,951** | **482** | **24.7** |
| බදු ආදායම | 1,724 | 427 | **24.8** |
| බදු නොවන ආදායම | 227 | 54 | **24.0** |
| මුළු වියදම | **3,526** | **1,003** | **28.4** |
| වර්තන වියදම | 2,466 | 890 | **36.1** |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | 1,060 | 113 | **10.6** |

මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## රාජ්‍ය ආදායම

බදු ආදායම ඉහළ යාම හේතුවෙන් 2020 වසරෙහි අදාළ කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 476.7 ක් වූ රාජ්‍ය ආදායමට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ සමස්ත රාජ්‍ය ආදායම රු. බිලියන 481.7 දක්වා වැඩි විය.

වගුව 2.3 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | තත්‍ය (ජන. - අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | |
| ආදායම් සහ ලාභ මත බදු | 371.0 | 55.2 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 200.0 | 62.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | - | 0.2 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - වෙනත් | 4.5 | 18.5 |
| **උප එකතුව** | **575.5** | **136.4** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | |
| ආනයන බදු | 180.0 | 31.6 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 110.0 | 39.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු -ආනයන | - | 0.0 |
| වරාය ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 170.0 | 53.8 |
| සෙස් ආනයන / අපනයන | 70.0 | 26.8 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 110.0 | 20.5 |
| ආර්ථික සේවා ගාස්තු | - | - |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 315.0 | 58.8 |
| දුම්වැටි | 130.0 | 27.6 |
| ඛනිජ තෙල් | 85.0 | 20.7 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 100.0 | 10.6 |
| අනෙකුත් | 2.0 | - |
| **උප එකතුව** | **957.0** | **231.0** |
| **සුරා බදු දෙපාර්තමේන්තුව** | | |
| මත්පැන්/දුම්කොළ | 160.0 | 52.4 |
| **උප එකතුව** | **160.0** | **52.4** |
| **අනෙකුත්** | | |
| විදුලි සංදේශ බද්ද | 20.0 | 4.3 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 11.5 | 3.1 |
| **උප එකතුව** | **31.5** | **7.4** |
| **මුළු බදු ආදායම** | **1,724.0** | **427.3** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද, සෙස් බද්ද සහ සුරාබද්ද මඟින් එකතු කරන ලද බදු ආදායම පිළිවෙලින් සියයට 32.4, සියයට 44.8, සියයට 110.9 සහ සියයට 46.5 කින් කැපී පෙනෙන ලෙස ඉහළ යාම හේතුවෙන් 2020 වසරෙහි සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 408.5 ක් වූ බදු ආදායමට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ බදු ආදායම රු.බිලියන 427.3 දක්වා සියයට 4.6 කින් වැඩි විය. වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 1,951 ට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ රාජ්‍ය ආදායමෙන් සියයට 24.7 ක් එක්රැස් කරගන්නා ලදී. කෙසේ වුවද, රාජ්‍ය ව්‍යවසායයන්හි ලාභ සහ ලාභාංශ ඉහළ යාම මධ්‍යයේ වුවද කුළී, විකුණුම් හා ගාස්තු සහ පොළී ආදිය මඟින් වන ලැබීම් අඩුවීමත් සමඟ 2021 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම රු. බිලියන 54.5 දක්වා සියයට 20.2 කින් කැපී පෙනෙන ලෙස අඩු විය. 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 2.9 ට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ ලාභ හා ලාභාංශ මඟින් ලද ආදායම රු. බිලියන 7.0 දක්වා සැළකිය යුතු ලෙස වැඩි විය.


වගුව 2.4 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය

රු. මිලියන

| අයිතමය | 2020 | 2021 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| **බදු ආදායම** | **408,485** | **427,260** | **4.6** |
| ආදායම් බදු | 81,372 | 55,245 | -32.1 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 121,164 | 145,316 | 19.9 |
| එකතු කළ අගය මත බදු | 48,199 | 62,435 | 29.5 |
| නිෂ්පාදන බදු/සුරාබදු | 71,534 | 82,690 | 15.6 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 1,432 | 191 | -86.7 |
| ආනයන මත පදනම් වූ බදු | 190,122 | 200,710 | 5.6 |
| රේගු බදු | 31,267 | 31,644 | 1.2 |
| එකතු කළ අගය මත බදු | 28,740 | 39,407 | 37.1 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 101 | 5 | -95.0 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 37,165 | 53,814 | 44.8 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 24,092 | 20,500 | -14.9 |
| නිෂ්පාදන බදු | 56,065 | 28,574 | -49.0 |
| සෙස් | 12,692 | 26,766 | 110.9 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 15,827 | 25,989 | 64.2 |
| **බදු නොවන ආදායම** | **68,248** | **54,461** | **-20.2** |
| **මුළු ආදායම** | **476,733** | **481,722** | **1.0** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.1 රූප සටහන : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ ආදායම් සංයුතිය




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## බදු ආදායම

සමස්ත ආදායමෙන් සියයට 88.7 ක් වූ බදු ආදායම, 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 408.5 ට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 427.3 දක්වා සියයට 4.6 කින් වැඩි විය. කෙසේ වුවද, 2020 මාර්තු මාසයේ දී වසංගත තත්ත්වයෙහි බලපෑමෙන් පැනනැගී සංස්ථාපිත ආදායම් බදු අංශයෙන් වන ලැබීම් අඩුවීම හේතුකොටගෙන ආදායම් බදු මගින් ලැබෙන ආදායම 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 81.4 ට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 55.2 දක්වා සියයට 32.1 කින් අඩු විය. මේ අතර රජයේ බදු ආදායමට වක්‍ර බදු මගින් දක්වන දායකත්වය සියයට 87.1 ක් වූ අතර එය 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 327.1 හි සිට 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 372.0 දක්වා සියයට 13.7 කින් වැඩි විය.

## ආදායම් බදු

ආදායම් බදුවලින් ලද ආදායම, 2020 වසරේ මුල් මාස හතර තුළ දී වාර්තා කළ රු. බිලියන 81.4 ට සාපේක්ෂව, 2021 වසරේ අනුරූප කාල පරිච්ඡේදය ඇතුළත රු. බිලියන 55.2 දක්වා සියයට 32.1 කින් අඩු විය. සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු වලින් ලද ආදායම, 2020 වසරේ මුල් මාස හතරට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී සියයට 18.7 කින් රු. බිලියන 47.0 දක්වා අඩු විය. 2020 වසරේ දී වසංගත ව්‍යාප්තිය මර්දනය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගවල අයහපත් බලපෑම මේ සඳහා හේතු ලෙස දැක්විය හැකිය. කෙසේ වුවද, 2021 වසරේ දී ආර්ථික කටයුතුවල සිදු වුණු පුනර්ජීවනය පෙන්නුම් කරමින්, ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලද ආදායම, 2020 වසරේ මුල් මාස හතරේ දී වාර්තා කළ රු. මිලියන 59ට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 227.2 කින් රු. මිලියන 191 දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය. උපයන විට ගෙවීම (උ.වි.ගෙ.) බදු ආදායම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා

කරන ලද රු. බිලියන 5.6 ට සාපේක්ෂව, 2021 වසරේ පළමු මාස හතරක කාල සීමාව තුළ සියයට 20.9 කින් රු. බිලියන 4.4 දක්වා අඩු විය. සේවා නියුක්ති ආදායම මත රඳවා ගැනීමේ බද්ද 2020 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරන ලද අතර, ඒ වෙනුවට වාසික තැනැත්තන් සඳහා ස්වේච්ඡා පදනමින් ද, නිර්වාසික තැනැත්තන් සහ පුරවැසියන් නොවන තැනැත්තන් සඳහා අනිවාර්යය පදනමින් ද, 2020 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හඳුන්වා දෙන ලදී. ඒ හා සමානවම, නිර්වාසික පුද්ගලයන් සඳහා විකල්පයක් ලෙස ඔවුන්ගේ ඉල්ලීම මත පමණක් අඩු කරනු ලබන, අනෙකුත් කරුණු අතර පොළී මත අත්තිකාරම් අදායම් බද්ද හඳුන්වා දීමත් සමඟම, පොළී මත බදු ආදායම, 2021 වසරේ මුල් මාස හතර තුළ දී සියයට 33.6 කින් රු. බිලියන 3.3 ක් දක්වා අඩු වී ඇත.

වගුව 2.5 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා ආදායම් බදු කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | 2020 | 2021 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 57,788 | 46,967 | -18.7 |
| උපයන විට ගෙවීම් | 5,556 | 4,396 | -20.9 |
| පොළී ආදායම මත බදු | 4,924 | 3,268 | -33.6 |
| ආර්ථික සේවා ගාස්තු | 13,044 | 423 | -96.8 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 59 | 191 | 227.2 |
| එකතුව | 81,372 | 55,245 | -32.1 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බදු ආදායම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 76.9 ක බදු ආදායමට සාපේක්ෂව, 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 101.8 ක් දක්වා සියයට 32.4 කින් වැඩි වූ අතර එය ඇස්තමේන්තුගත වාර්ෂික ආදායමෙන් සියයට 32.9 ක ප්‍රතිශතයකි. 2021 වසරේ පළමු මාස හතර තුළ දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බදු මඟින් එකතු කළ බදු ආදායම සියයට 29.5 කින් රු. බිලියන 62.4 ක් දක්වා වැඩි වූ අතර ආනයන මත එකතු කළ අගය මත බදු මඟින් ලැබූ බදු ආදායම රු. බිලියන 39.4 ක් දක්වා සියයට 37.1 කින් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ 2021 වසරේ පළමු මාස හතර තුළ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ වීමයි.

වගුව 2.6 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා එකතු කළ අගය මත බදු ආදායමේ කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | 2020 | 2021 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| දළ ආදායම | 77,130 | 101,842 | 32.0 |
| දේශීය | 48,237 | 62,435 | 29.4 |
| ආනයන | 28,893 | 39,407 | 36.4 |
| ආපසු ගෙවුම් | 191 | - | |
| ශුද්ධ ආදායම | 76,938 | 101,842 | 32.4 |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | 0.2 | - | |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## නිෂ්පාදන බද්ද/ සුරාබද්ද

2021 වසරේ පළමු මාස හතර තුළදී නිෂ්පාදන බදු/ සුරා බදු තුළින් ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 127.6 ට සාපේක්ෂව රු. බිලියන 111.3 ක් දක්වා සියයට 12.8 කින් අඩු වූ අතර මත්පැන් සහ අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම තුළින් ලද ආදායමේ වර්ධනය අභිබවා මෝටර් වාහන, දුම්වැටි සහ ඛනිජතෙල් නිෂ්පාදන තුළින් ලද ආදායම අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. නිෂ්පාදන බදු/ සුරාබදු ආදායම 2021 වසරේ පළමු මස හතර තුළ දී එකතු කරන ලද බදු ආදායමෙන් සියයට 26.0 ක් හා මුළු ආදායමෙන් සියයට 23.1 ක් වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 23.4 ක ළඟා කරගැනීමක් වේ.

වගුව 2.7 : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා නිෂ්පාදන බදු/සුරාබදු ආදායම් කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | 2020 | 2021 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| මත්පැන් | 35,778 | 52,412 | 46.5 |
| දුම්වැටි හා දුම්කොළ | 33,867 | 27,602 | -18.5 |
| මෝටර් වාහන | 33,551 | 7,921 | -76.4 |
| ඛනිජ තෙල් | 22,514 | 20,653 | -8.3 |
| අනෙකුත් | 1,880 | 2,665 | 41.7 |
| එකතුව | 127,591 | 111,253 | -12.8 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව


උත්සව සමය තුළ සංචරන සීමා ලිහිල් කිරීම හේතුවෙන් 2021 වසරේ පළමු මාස හතර තුළ සුරාබදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ ලැබු රු. බිලියන

35.8 ක ආදායමට සාපේක්ෂව රු. බිලියන 52.4 දක්වා සියයට 46.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, 2021 වසරේ පළමු මාස හතර තුළ සැර මත්පැන් වලින් ලද සුරාබදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ රැස්කළ රු. බිලියන 20.3 ක ආදායම හා සැසඳීමේදී රු. බිලියන 36.4 ක් දක්වා සියයට 78.8 කින් වර්ධනය විය. ඒ හා සමානව, 2021 වසරේ පළමු මාස හතර තුළ ධාන්‍ය මත්පැන් වලින් ලද සුරාබදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ රැස්කළ රු. බිලියන 7.0 ක ආදායම හා සැසදීමේදී රු. බිලියන 15.2 ක් දක්වා සියයට 117.1 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2021 පළමු මාස හතර තුළදී දුම්වැටි තුළින් ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 33.9 ට සාපේක්ෂව රු. බිලියන 27.6 ක් දක්වා සියයට 18.5 කින් අඩු වූ අතර දුම්පානය හා කොවිඩ්-19 අතර ඇති සෞඛ්‍යමය සම්බන්ධතාවයට වූ ප්‍රතිචාරය පෙන්නුම් කරමින් දුම්වැටි අලෙවිය අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය.

2021 වසරේ පළමු මාස හතර තුළ දී මෝටර් වාහන තුළින් ලද නිෂ්පාදන බදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 33.6 ට සාපේක්ෂව රු. බිලියන 7.9 ක් දක්වා සියයට 76.4 කින් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, මේ සඳහා 2020 වසරේ මාර්තු මස සිට අත්‍යවශ්‍ය නොවන ආනයන අඩුකිරීමට හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ග නිසාවෙන් මෝටර් වාහන ආනයන අඩුවීම හේතුවිය.

ඛනිජතෙල් නිෂ්පාදන මත 2021 වසරේ පළමු මාස හතර තුළ දී ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 22.5 ට සාපේක්ෂව රු. බිලියන 20.7 ක් දක්වා සියයට 8.3 කින් අඩු වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඩීසල් ආනයන අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. කෙසේ වුවද, 2021 වසරේ පළමු මාස හතර තුළදී නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම තුළින් ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 1.9 ට සාපේක්ෂව රු. බිලියන 2.7 ක් දක්වා වර්ධනය විය.

**2.2 රූප සටහන :** 2020 සහ 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා නිෂ්පාදන බදු කාර්යසාධනය




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## වෙනත් බදු

ආනයන වැඩිවීම හේතුවෙන් 2021 වසරේ පළමු මාස හතර තුළ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද, රේගු ආනයන බද්ද හා සෙස් බද්දෙන් උපයන ලද ආදායම වැඩි විය. කෙසේ වුවද, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ දී අඩු විය.

කොවිඩ්-19 වසංගතයේ පළමු සහ දෙවන රැල්ලෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් යථාතත්වයට පත්වීමේ ප්‍රතිලාභ සමඟින් ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා කළ රු. බිලියන 37.2 සිට 2021 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 53.8 ක් දක්වා සියයට 44.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 170 න් සියයට 31.7 ක ප්‍රතිශතයක් ළඟාකර ගැනීමකි. ජාත්‍යන්තර පාරිභෝගික භාණ්ඩවල ඉහළ මිල ගණන් වලට ප්‍රතිචාර වශයෙන් ආනයනික කිරිපිටි, එල්.පී. ගෑස් සහ කොකෝවා ඇට මත වන ගුවන්තොටුපොළ සංවර්ධන බදු අනුපාතයන් 2021 පෙබරවාරි සහ අප්‍රේල් මාස වල සැලකිය යුතු ලෙස සංශෝධනය කරන ලදී. මේ අතර රේගු ආනයන බද්දෙන් උපයන ලද ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 31.3 සිට රු. බිලියන 31.6 ක් දක්වා සියයට 1.2 කින් වර්ධනය විය. කෙසේ වුවද, අත්‍යවශ්‍ය භාණ්ඩ මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් උපයන ලද බදු අනුපාතයන් පහත හෙලීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් උපයන ලද ආදායම රු. බිලියන 20.5 ක් දක්වා සියයට 14.9 කින් අඩු වූ අතර 2021 වසරේ පළමු මාස හතර තුළ දී විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම රු. බිලියන 4.3 ක් දක්වා සියයට 0.4 කින් ආන්තිකව පහත වැටී ඇත.

2020 වසරේ සමාන කාල පරිච්ඡේදයට සාපෙක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ සෙස් බද්දෙන් ලද ආදායම රු. බිලියන 12.7 සිට රු. බිලියන 26.8 ක් දක්වා සියයට 110.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2021 අයවැයෙන් ප්‍රකාශිත පරිදි රේගු ආනයන බද්දට සමගාමීව සෙස් බදු අනුපාත ද සංශෝධනය කිරීම මෙකී වර්ධනයට හේතු විය. ආනයන මත වූ සෙස් බදු ආදායම 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ රු. බිලියන 12.2 සිට 2021 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 26.1 ක් දක්වා සියයට 113.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මීට අනුරූපව අපනයන මත වූ සෙස් බදු ආදායම ද 2020 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 0.5 සිට 2021 වසරේ පළමු මාස හතර තුළදී රු. බිලියන 0.7 ක් දක්වා සියයට 39.6 කින් වර්ධනය විය.

## බදු නොවන ආදායම

වසංගතයේ දීර්ඝ කාලීන බලපෑම හේතුවෙන් බදු නොවන ආදායම 2020 වසරේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 68.2 ට සාපේක්ෂව 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 54.5 ක් දක්වා සියයට 20.2 කින් කැපී පෙනෙන ලෙස අඩු විය. ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ වීම හේතුවෙන් රාජ්‍ය ව්‍යාපාර මගින් ලැබූ ලාභාංශ 2020 වසරේ රු. බිලියන 2.9 සිට 2021 වසරේ රු. බිලියන 7.0 ක් දක්වා සියයට 146.0 කින් වැඩි වූ අතර සමාජ ආරක්ෂණ ගෙවීම් මගින් ලද ආදායම රු. බිලියන 11.3 ක් දක්වා සියයට 27.6 කින් වැඩි විය. කෙසේ වුවද, විකුණුම් හා ගාස්තු මගින් ලද ආදායම 2020 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ  පළමු මාස 4 තුළදී රු. බිලියන 20.9 සිට රු. බිලියන 12.5 ක් දක්වා සියයට 40.2 කින් පහත වැටුණි. කුලී ආදායමද 2020 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතර තුළ  රු. බිලියන 8.6 සිට රු. බිලියන 1.4 ක් දක්වා සියයට 83.4 කින් අඩු විය. මේ අතර පොළී ආදායම ද රු. බිලියන 1.3 ක් දක්වා පහත වැටුණි. 2021 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම ඇස්තමේන්තුගත වාර්ෂික බදු නොවන ආදායමෙන් සියයට 24.0 කි.

වගුව 2.8: රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය

රු. බිලියන

| අයිතමය | 2020 (ජන.-අප්‍රේ.) | 2021 වාර්ෂික ඇස්තමේන්තුව | 2021 (ජන.-අප්‍රේ.) තාවකාලික | හේතුව |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 81.4 | 371.0 | 55.2 | 2020 වසරේ සමාන කාල පරිච්ඡේදය හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුළදී ආදායම් බදු මඟින් ලද ආදායම සියයට 32.1 කින් රු. බිලියන 55.2 දක්වා අඩු වී ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 14.9 ක ලඟා කර ගැනීමකි. 2020 වසරේ මාර්තු මස මැද භාගයේ සිට ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගත තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ඒ අනුව සලකා බලනු ලබන කාලය තුළ සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු රු. බිලියන 47.0 දක්වා සියයට 18.7 කින් අඩු වී ඇත. කෙසේ වුවද, 2021 වසරේ පළමු මාස හතර තුළ ලත් ආදායම් බදු ආදායමට ප්‍රාග්ධන ලාභ බදු මඟින් රැස්කළ ආදායම ධනාත්මක දායකත්වයක් ලබාදී ඇත. |
| එකතු කල අගය මත බද්ද | 76.9 | 310.0 | 101.8 | වාර්ෂික ඇස්තමේතුවෙන් සියයට 32.9 ක් ලඟා කර ගනිමින් 2020 වසරේ සමාන කාලය හා සැසඳීමේදී, 2021 වසරේ පළමු මාස හතර තුළදී රු. බිලියන 101.8 ක් දක්වා එකතු කළ අගය මත බදු මඟින් ලත් ආදායම සියයට 32.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මේ සඳහා 2021 වසරේ පළමු මාස හතර තුළ ආනයන සියයට 20 කින් ඉහළයාමත් සමඟින් 2021 වසරේ නව සාමාන්‍යකරන තත්ත්වය සිල්ලර වෙළඳාමද ඇතුළුව දේශීය ක්‍රියාකාරකම්හි වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. 2020 වසරේ පළමු මාස හතර හා සැසඳීමේදී 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දේශීය ක්‍රියාකාරකම් මත හා ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම පිළිවෙළින් රු. බිලියන 62.4 දක්වා සියයට 29.5 කින් හා රු. බිලියන 39.4 දක්වා සියයට 37.1 කින් ඉහළ ගොස් ඇත. |
| නිෂ්පාදන බදු | 127.6 | 475.0 | 111.3 | 2020 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුල රු. බිලියන 111.3 ක් දක්වා සියයට 12.8 කින් නිෂ්පාදන බදු මඟින් ලද ආදායම පහත බැස ඇත. එය 2021 වසරේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 23.4 ක ලඟා කරගැනීමකි. 2020 වසරේ මාර්තු මස සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථවාහන ආනයනය සීමාකිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. දුම්වැටි අලෙවිය පහත බැසීම හේතුවෙන් දුම්වැටි මඟින් ලත් නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 27.6 දක්වා සියයට 18.5 කින් සංකෝචනය වී ඇත. එමෙන්ම පරිභෝජනය පහත බැසීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඩීසල් ආනයනය පහත බැසීම හේතුවෙන් ඛනිජතෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 20.7 දක්වා සියයට 8.3 කින් පහත බැස ඇත. කෙසේ වුවද, උත්සව සමය තුළ මත්පැන් අලෙවිය ඉහළ යාම හේතුවෙන් සුරා බදු ආදායම රු. බිලියන 52.4 දක්වා සියයට 46.5 කින් ඉහළ ගොස් ඇත. ඇස්තමේන්තුගත හා තත්‍ය අගයන් අතර පරතරය අඩුකරගනිමින් සලකා බලනු ලබන කාලය තුළ අනෙකුත් නිෂ්පාදන මඟින් ලද නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 2.7 දක්වා සියයට 41.7 කින් ඉහළ ගොස් ඇත. |

රු. බිලියන

| අයිතමය | 2020 (ජන.- අප්‍රේ.) | 2021 වාර්ෂික ඇස්තමේන්තුව | 2021 (ජන.- අප්‍රේ.) තාවකාලික | හේතුව |
|---|---|---|---|---|
| ආනයන බදු | 31.3 | 180.0 | 31.6 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 17.6 ක ප්‍රතිශතයක් ලඟා කරගනිමින් 2021 වසරේ පළමු මාස හතර තුළ ආනයන බදු ආදායම සියයට 1.2 කින් ආන්තික ලෙස ඉහළ ගොස් ඇත. රේගු ආනයන බදු අදාල වන ඇතැම් භාණ්ඩ සඳහා වූ ආනයන තහනම් තවදුරටත් පවත්වාගෙන යාම සහ ආනයන ඉහළ යාම මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද (PAL) | 37.2 | 170.0 | 53.8 | 2021 වසරේ පළමු මාස හතර තුළ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම රු. බිලියන 53.8 දක්වා සියයට 44.8 කින් ඉහළ ගොස් ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 31.7 ක ලඟා කර ගැනීමකි. විශේෂයෙන්ම ආයෝජන භාණ්ඩද ඇතුළුව වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද අදාල වන භාණ්ඩ ආනයන වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද | 24.1 | 110.0 | 20.5 | 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුල විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මඟින් උපයන ලද ආදායම රු. බිලියන 20.5 දක්වා සියයට 14.9 කින් පහත බැස ඇත. එය 2021 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 18.6 ක ලඟා කර ගැනීමකි. දේශීය ඉල්ලුම හා සැපයුම තිරසර මට්ටමින් තුලනය කිරීම සඳහා තෝරාගත් පරිභෝජන භාණ්ඩයන්ගේ බදු අනුපාත පහත හෙළීම මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| වෙනත් බදු | 30.1 | 108.0 | 53.0 | 2021 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 49.1 ක් ළඟා කර ගනිමින් 2020 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 30.1 හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුළ වෙනත් බදු ආදායම රු. බිලියන 53.0 දක්වා සියයට 76.2 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2021 අයවැයට සමගාමීව අනුපාත සංශෝධනය කිරීම මඟින් ඇති කළ බලපෑම හේතුවෙන් පෙර වසරේ අනුරූපී කාලපරිච්ඡේදය හා සැසඳීමේදී රු. බිලියන 26.8 දක්වා සෙස් බදු ආදායම සියයට 110.9 කින් ඉහළ යාම සහ කෝවිඩ්-19 පාලන ක්‍රියාමාර්ගයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව ඇති කල වර්ගීකරණය නොකරන ලද මාර්ගගත බදු ගෙවීමේ ක්‍රමය මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. කෙසේ වුවද, පෙර වර්ෂයේ සමාන කාලය හා සැසඳීමේදී 2021 වසරේ පළමු කාර්තුව තුලදී අන්තර්ජාතික දුරකථන ඇමතුම් ලැබීම් හා ඇමතීම් කාලය පහත වැටීම හේතුවෙන් විදුලි සංදේශ බද්ද සියයට 0.4 කින් ආන්තිකව පහළ බැස ඇත. |
| බදු නොවන ආදායම | 68.2 | 227.0 | 54.5 | විකුණුම් හා ගාස්තු, මහ බැංකු ලාභ, පොළී ආදායම් හා කුලී ආදායම්වල පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 68.2 හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම රු. බිලියන 54.5 දක්වා සියයට 20.2 කින් පහළ බැස ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 24.0 ක ප්‍රතිශතයකි. කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වල පහත බැසීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. කෙසේ වුවද, 2020 වසරේ අදාල කාලපරිච්ඡේදයට වඩා 2021 වසරේ පළමු මාස හතර තුළ සමාජ ආරක්ෂණ දායක මුදල රු. බිලියන 11.3 ක් දක්වා ලඟා කරගත් අතර රජය සතු ව්‍යාපාරයන්ගෙන් ලැබෙන ලාභ හා ලාභාංශ ලැබීම් රු. බිලියන 7 දක්වා ලඟා කරගනිමින් පිළිවෙළින් සියයට 27.6 ක් හා සියයට 146 ක වර්ධනයක් ලඟා කරගෙන ඇත. එමෙන්ම 2020 වසරේ ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා ලබාගත් ආදායම් හා සැසඳීමේදී අනෙකුත් බදු නොවන ආදායම් මඟින් ලද ආදායම රු. බිලියන 5.9 දක්වා හතර ගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. |
| එකතුව | 476.7 | 1,951.0 | 481.7 | |

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී

### විශේෂ සටහන 2.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග :2021 ජනවාරි - ජූනි

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බදු - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සිදුකරන ලද සංශෝධන** | |
| **2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| **ආදායම් බදු නිදහස් කිරීම්** | |
| 2021.04.01 | - කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබාදී ඇති ශ්‍රී ලංකා දේපළ ආයෝජන භාරයකට යම් තැනැත්තෙකු ඉඩම් විකිණීම, හුවමාරු කිරීම හෝ පැවරීම මගින් උපලබ්ධිවන ලැබීම්.<br>- ඕනෑම ශ්‍රී ලංකා දේපළ ආයෝජන භාරයකින්, කොටස් කරුවෙකු විසින් ලාභාංශ සහ ඒකක උපලබ්ධිවීම මත ලාභ ලැබීම් හෝ ව්‍යාපාරයක හෝ ආයෝජනයක ප්‍රාග්ධන වත්කම් උපලබ්ධි කිරීම මඟින් වන ලැබීම්.<br>- ඕනෑම සුබසාධක සංගමයක් (සාමාජිකයින්ගේ ප්‍රවර්ධනය කරනු ලබන යහසාධක අරමුදල් ඇතුළුව) මගින් උපයාගන්නා ලද හෝ උපචිත වන පොළිය.<br>- අදාළ තක්සේරු වර්ෂය සඳහා එහි ආනයන වියදම ආවරණය කර ගැනීම සඳහා පවත්වා ගෙන යන, විදේශ ප්‍රභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් විවෘත කළ සහ ඕනෑම දේශීය බැංකුවක විදේශ මුදලින් පවත්වා ගෙන යන තැන්පතු මගින් බහුජාතික සමාගමක් විසින් උපයනු ලබන හෝ උපචිත වන පොළිය.<br>- ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර සුරැකුම්පත් මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කර ඇති ඕනෑම සමෘද්ධි ප්‍රජා-පාදක බැංකුවක් විසින් උපයනු ලබන හෝ උපචිත වන පොළිය හෝ වට්ටම්.<br>- 2021 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකා රජය විසින් හෝ රජය වෙනුවෙන් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ඇමරිකානු ඩොලර් මිලියන 100 කට නොඅඩු සමුච්චිත ආයෝජනයක් සිදුකළ වාණිජ බැංකුවකට හෝ බලයලත් ගනුදෙනුකරුවෙකුට එම බැඳුම්කර උපලබ්ධිවීම හෝ උපචිත වීම මගින් වන ලැබීම්.<br>- විදේශ මුදලින් උපයනු ලබන ලැබීම් හා ලාභ ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා ප්‍රේෂණය වන අවස්ථාවකදී, රත්‍රන්, මැණික්, හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමේ ඕනෑම ව්‍යාපාරයක් මඟින් හෝ ශ්‍රී ලංකාවට මැණික් ගෙන්වා කපා ඔප මට්ටම් කිරීමෙන් පසු එසේ කපා ඔප මට්ටම් කළ මැණික් අපනයනය කිරීමේ ව්‍යාපාරයන්වල නියැලීම මඟින් ඕනෑම තැනැත්තෙකු ඉපයූ හෝ උපයන ලද ලැබීම්.<br>- TVET සංකල්පය (තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව) යටතේ ප්‍රමිතිගත සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් නියාමනය වන ඕනෑම තෘතීය අධ්‍යාපන ආයතනයක්, එකී තක්සේරු වර්ෂයට පෙර තක්සේරු වර්ෂය හා සාපේක්ෂව සිසුන් බඳවාගැනීම දෙගුණයක් කර ඇත්නම්, එකී ආයතනය විසින් උපයන ලද හෝ ඉපයූ ලැබීම් සහ ලාභ. අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා මෙම නිදහස් කිරීම අදාළ වේ.<br>- ශ්‍රී ලංකාවේ ස්ථාවර ආයතනයක් හරහා ශ්‍රී ලංකාවේ ලාභ සහ ආදායම උපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සහ තම ව්‍යාපාරය පුළුල් කිරීමට හෝ කොටස් හෝ කොළඹ කොටස් වෙළඳපොළෙන් යම් සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ යම් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර අත්කර ගැනීමට, එලෙස උපයා ගත් ලාභ අවම වශයෙන් වසර තුනක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සිදු කළ නිර්වාසික සමාගමක් විසින් ප්‍රේෂණ බදු වලින් (ප්‍රේෂණ ලාභ මත 14% ක අනුප්‍රමාණයෙන්) නිදහස් කෙරේ. මෙම බදු නිදහස් කිරීම වසර තුනක කාල පරිච්ඡේදයක් සඳහා අදාළ වේ. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| බදු විරාම | |
| 2021.04.01 | පහත සඳහන් නව ව්‍යාපාරවලින් උපයා ගන්නා ලද හෝ උපචිත වන ලැබීම් හා ලාභ (ප්‍රාග්ධන ලාභ හැර) සඳහා බදු විරාම ලබා දී ඇත. වසර දෙකක ක්‍රියාත්මක කිරීමේ කාලයක් සලකා බලනු ලැබේ.<br>- ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිතා කරන ලද ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාපිත වෙනම තෝරාගත් වැඩබිමක ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය විකුණනු ලබන ව්‍යාපාරයක් සඳහා දස වර්ෂයකට බදු නිදහස් කිරීම.<br>- TVET සංකල්පය යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් නියාමනය කරන ඕනෑම ආයතනයක් මගින් වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව නිම කිරීමෙන් පසු 2021 අප්‍රේල් 01 දින හෝ එදිනෙන් පසු යම් පුද්ගලයෙකු විසින් ආරම්භ කරන ලද ඕනෑම ව්‍යාපාරයක් පස් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>- වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද බෝට්ටු හෝ නැව් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයකින් එවැනි බෝට්ටු හෝ නැව් සැපයීම මගින් ලැබූ හෝ උපයන ලද ඕනෑම ලැබීම් හෝ ලාභ සඳහා සත් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>- මෙගා වොට් සියයකට නොඅඩු ධාරිතාවයකින් බලශක්තිය නිපදවීමට හැකි ලෙස ඕනෑම "පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක්" සමගින් ස්ථාපනය කර ඇති සූර්ය හෝ සුළං බලශක්ති ව්‍යාපෘතියක්, එකී බලශක්තිය ජාතික විදුලිබල පද්ධතියට සැපයෙන අවස්ථාවකදී සත් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>- 2021 අප්‍රේල් 01 වන දින හෝ එදිනෙන් පසුව ඕනෑම වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ දේශීය ශ්‍රමිකයන් සහ අමුද්‍රව්‍ය භාවිතා කරමින් සන්නිවේදන කුළුණු සහ ඒ හා සම්බන්ධ උපකරණ ඉදිකරන සහ සවිකරන හෝ එවැනි ඉදිකිරීම් සහ සවිකිරීම් සඳහා අවැසි තාක්ෂණ සේවා සපයන ඕනෑම ව්‍යාපාරයක් සඳහා පස් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.<br>- කොළඹ සහ හම්බන්තොට වරායන්හි අක්වෙරළ ව්‍යාපාරයන්ට සම්බන්ධ බන්ධිත ගුදම් හෝ ගුදම් කුළියට දීමේ ඕනෑම ව්‍යාපාරයක්, එවැනි ගුදම් සඳහා එකී තැනැත්තා 2021 අප්‍රේල් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආයෝජනය කර ඇත්නම් බදු නිදහස් කිරීම. |
| සහනදායී බදු අනුපාත | |
| 2021.04.01 | - මැණික් හා ස්වර්ණාභරණ විකිණීම මත පුද්ගලයන් සඳහා සියයට 14 ක උපරිම බදු අනුපාතය සහ සමාගම් සඳහා සියයට 14 ක සමවර්ත බදු අනුපාතය අදාළ වේ.<br>- පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතා කර ජනනය කරන ලද විදුලිය ජාතික පද්ධතියට සැපයීමෙන් ලබන ආදායම මත පුද්ගලයන් සඳහා සියයට 14 ක උපරිම බදු අනුපාතය සහ සමාගම් සඳහා සියයට 14 ක සමවර්ත බදු අනුපාතය අදාළ වේ.<br>- 2021 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසුව, එනමුදු 2021 දෙසැම්බර් 31 වන දිනට පෙර එහි කොටස්, කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කර ඇති ඕනෑම සමාගමක් 2022 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ තුනක් (2022/2023 සිට 2024/2025 දක්වා) සඳහා සියයට 14 ක බදු අනුපාතය අදාළ වේ. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග | |
|---|---|---|
| ආදායම් බදු බැඳියාව අඩු කිරීම් | | |
| | ආදායම | බදු අඩු කිරීම |
| 2021.04.01 | 2021 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසුව, එනමුදු 2021 දෙසැම්බර් 31 වන දිනට පෙර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදී ඇති, කොළඹ කොටස් වෙළඳපොළෙහි ස්වකීය කොටස් ලැයිස්තුගත කර ඇති ඕනෑම සමාගමක් විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් ද ඇතුළුව නමුත් ආයෝජන වත්කම් උපලබ්ධි වීම මගින් වන ලැබීම් මත හැර) 2021/2022 තක්සේරු වර්ෂය සඳහා | 50% |
| | බහු ජාතික සමාගමක් විසින් ලාභාංශ ලැබීම් හා ලාභ මත ගෙවිය යුතු ආදායම් බදු | |
| | (i) 2020/2021 වර්ෂය හා සැසඳීමේ දී 2021/2022 වර්ෂයේ දී අවම වශයෙන් අපනයන 30% කින් වැඩි වී ඇත්නම් | 25% |
| | (ii) 2021/2022 වර්ෂය හා සැසඳීමේ දී 2022/2023 වර්ෂයේ දී අවම වශයෙන් අපනයන 50% කින් වැඩි වී ඇත්නම් | 50% |
| | (iii) 2020/2021 වර්ෂය හා සැසඳීමේ දී 2023/2024 වර්ෂයේ දී අවම වශයෙන් අපනයන 50% කින් වැඩි වී ඇත්නම් හෝ ඉහත (ii) හි සඳහන් තත්ත්වයම 2023/2024 සඳහා ද පවත්වාගෙන ගොස් ඇත්නම් | 50% |
| | යම් තැනැත්තෙකු විසින් කෘෂි වගා කටයුතු වලින් ලබාගත් කෘෂි නිෂ්පාදන, එම පුද්ගලයා විසින් පිරිසැකසුම් හෝ නිෂ්පාදන කටයුත්තක් සඳහා යොදා ගනු ලබන්නේ නම්, ඒ කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ සඳහා ගෙවිය යුතු බදු කොටස | 25% |
| තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී ඉඩදෙනු ලබන අඩුකිරීම් | | |
| 2021.04.01 | - ප්‍රාග්ධන ස්වභාවය ද, එසේ නොවේද යන්න නොසලකා වෙළඳපළ පර්යේෂණ, අලෙවිකරණය, වෙළඳ ප්‍රචාරණය සහ සන්නිවේදන වැඩසටහන් සැලසුම් කිරීම සහ නිෂ්පාදනය, ප්‍රධාන පෙළේ මාධ්‍යවල හෝ සමාජ මාධ්‍යවල ප්‍රචාරණය, නිෂ්පාදන දියත් කිරීම් හෝ ප්‍රචාරණ වැඩසටහන් සක්‍රීය කිරීම සහ විකුණුම් ස්ථාන ද්‍රව්‍ය සංවර්ධන හා මුද්‍රණය සඳහා වන අලෙවිකරණ හා සන්නිවේදන වියදම්, ව්‍යාපාරයේ ලැබීම් හා ලාභ ගණනය කිරීමේ දී අඩු කිරීමට ඉඩලබා දී ඇත.<br>- වෘත්තීය පුහුණුවකින් පසුව තරුණ පුරුෂයෙකු හෝ කාන්තාවක් විසින් ආරම්භ කරන (5 අවුරුදු බදු විරාම සඳහා සුදුසුකම් ලබන) ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය සඳහා බැංකු සහ මූල්‍ය ආයතන විසින් සපයා ඇති ණය අරමුදල්වල පිරිවැය. | |
| නව සුදුසුකම් ලබන ගෙවීම් | | |
| 2021.04.01 | - වාසික පුද්ගලයෙකු විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා සනාථ කිරීම පරිදි සමෘද්ධි ප්‍රතිලාභ පවුලක කාන්තාවකට අලෙවිසැලක් ස්ථාපනය කිරීමට මුදල් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද දායකත්වය.<br>- එක් එක් අවස්ථාව මත පදනම් වූ සියළු කරුණු සැලකිල්ලට ගැනීමෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සනාථ කර ඇති පරිදි, ඕනෑම මූල්‍ය ආයතනයක් විසින් වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක් අත්පත් කර ගැනීමට හෝ එකතු කර ගැනීමට පිරිවැයක් ලෙස දරන ලද යම් වියදමක් සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සැළකේ. අඩු කළ හැකි මුළු වියදම තක්සේරු වර්ෂ තුනක කාලයක් තුළ සමාන ප්‍රමාණයන්ට බෙදිය යුතු අතර, එකී වියදම දරන ලද තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන එවැනි එක් එක් තක්සේරු වර්ෂයන්හි දී එකී මූල්‍ය ආයතනයේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ යුතුය.<br>- ඕනෑම චිත්‍රපටයක් ප්‍රවර්ධනය කිරීමේ වියදම ද ඇතුළුව, රු. මිලියන 5 කට නොඅඩු පිරිවැයක් දරමින් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමේ දී, හෝ රු. මිලියන 25 කට නොවැඩි පිරිවැයක් දරමින් චිත්‍රපට ශාලාවක් ඉදි කිරීම හා එයට උපකරණ මිලදී ගැනීම හෝ රු. මිලියන 10 කට නොවැඩි පිරිවැයක් දරමින් චිත්‍රපට ශාලාවක් නවීකරණය කිරීමේ දී දරනු ලබන වියදම. එසේ අඩු කිරීම, වර්ෂයේ බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකකට සීමා වන අතර, ඊළඟ වසර දක්වා ඉදිරියට ගෙන යා හැකිය. | |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
| --- | --- |
| "නිශ්චිත ව්‍යාපාර" ලෙස සැලකීම | |
| 2021.04.01 | 14% බදු අනුපාතය අදාළ වන නිශ්චිත ව්‍යාපාර යන්නට පහත සඳහන් ව්‍යාපාර ඇතුළත් වේ.<br>- නිශ්චිතව දක්වන වරාය පරිශ්‍රයක් තුළ, දේශීය තෙල් සැපයුම්කරුවන් වෙත සමුද්‍රීය ඉන්ධන සැපයීම ද ඇතුළුව සමුද්‍රීය ඉන්ධන සැපයීම හා සම්බන්ධ ඉන්ධන සැපයුම් සේවා<br>- ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා අයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇති අපනයන අභිමුඛ සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ -<br>(අ) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ බදු විරාමයක් භුක්ති විඳින සමාගමක් ද ඇතුළුව, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව තිබෙන සහ එවැනි ගිවිසුමක ප්‍රතිපාදන යටතේ තීරු බදු රහිත පදනම යටතේ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවසර තිබෙන සමාගමකට හෝ<br>(ආ) යම් රජයේ ආයතනයක් යටතේ තීරු බදු රහිත පදනම මත නිශ්චිත භාණ්ඩ ආනයනය කිරීමට සුදුසුකම්ලත් යම් තැනැත්තෙකුට 2021 අප්‍රේල් 1 දින සිට ආරම්භ වන වසර 3 ක කාල පරිච්ඡේදයක් තුළ ආනයන ප්‍රතිස්ථාපන ලෙස ආයෝජන මණ්ඩලය විසින් අනුමත කර ඇති ප්‍රමාණයක් දක්වා විකිණීම. |
| බදු දිරිගැන්වීම් සහ තාවකාලික සහන වල වෙනස්වීම් | |
| 2021.04.01 | - 2021 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තක්සේරු වර්ෂ තුනක් සඳහා රු. මිලියන 500 ක උපරිම සීමාවකට යටත්ව සියයට 100 ක අමතර අඩු කිරීමකට ඉඩ ලබා දී ඇත. කෙසේවුවද, එම වියදම් සියයට 65 ක දේශීයව අගය එකතු කිරීමක් සහිතව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් 2021/2022 සිට 2022/2023 දක්වා වර්ෂ 3ක් තුළ දී විය යුතුය.<br>- බදු ඉඩමක් තුළ ගොඩනැගිල්ලක් හෝ ඒ හා සමාන කාර්යයක් ඉදිකිරීම වැඩිකළ ප්‍රාග්ධන දීමනාවක් ලෙස සැළකේ.<br>- දේශීය ආදායම් පනතේ 6 වන උපලේඛනය යටතේ අමතර ප්‍රාග්ධන දීමනා සඳහා ලබා දෙන ලද කාලය තවත් වසර තුනකින් දීර්ඝ කිරීම.<br>- පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා සියයට 100 ක් සමාන වන අතිරේක අඩු කිරීමක් 2021/2022 සිට 2022/2023 දක්වා තක්සේරු වර්ෂ තුළ අඩු කළ හැක. |
| වාසික පුද්ගලයින් සඳහා බදු සහන | |
| 2021.04.01 | - වර්ෂයක් සඳහා රු. 600,000 උපරිම අඩු කිරීමක් දක්වා සූර්ය පලක සඳහා ආයෝජනය කරන පුද්ගලයින්ට සහනයක් ලබා දී ඇත. ලබාදෙනු ලබන සහනය බැංකු ණයක් හරහා මුදල් යෙදවීමෙන් ආයෝජනය කළ හැකි අතර, එවැනි අවස්ථාවලදී සහන කටයුතු සඳහා ණය ආපසු ගෙවීම සළකා බලනු ලබයි. |
| බදු පරිපාලන විධිවිධාන වල වෙනස්වීම් | |
| 2021.04.01 | - ලිත් මාසයකදී සියලුම ප්‍රාග්ධන ලාභ ගනුදෙනු සඳහා තනි වාර්තාවක් ඉදිරිපත් කිරීමට සහ උපලබ්ධි කිරීම සිදු වූ අදාළ ලිත් මාසයෙන් පසුව දින තිහක් ඇතුළත නියමිත ගෙවීමට ඉඩ දීම.<br>- තැනැත්තෙකු විසින් අදායම් වාර්තාවක් ගොනු කරන්නේ නම්, එය අදාළ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ස්වයං තක්සේරුව ලෙස සළකනු ලබන අතර, තැනැත්තෙකු විසින් ප්‍රාග්ධන ලාභ බදු ගොනු කිරීම ස්වයං තක්සේරුවක් ලෙස සළකනු නොලැබේ.<br>- බදු හා සම්බන්ධ සියළුම මූලාශ්‍ර ලියකියවිලි වල හෝ පාදකවන අනෙකුත් ලියකියවිලි වල බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) භාවිතා කිරීම අනිවාර්යය කිරීම.<br>- වාසික හෝ වාසික නොවන වග නොසලකා හැර, පරිගණක හෝ දුරකථන උපාංග භාවිතා කර රාජ්‍ය සංස්ථා ද ඇතුළුව සියලුම සීමා සහිත සමාගම් විසින් ඔවුන්ගේ බදු වාර්තා (වාර්ෂික වාර්තා ඇතුළුව) විද්‍යුත් ගොනු කිරීම (e-filing) අනිවාර්යය කිරීම. |
| එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත | |
| 2021.01.01 | 2021 අංක 9 දරන එකතු කල අගය මත (සංශෝධන) බදු පනත<br>- අපනයන අභිමුඛ ආයෝජන මණ්ඩල (BOI) සමාගම් විසින් ඇතැම් නිමි ඇඳුම් දේශීයව විකිණීමේදී අදාළ වන ඒකක පදනම මත එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය රු.100/- සිට 25/- දක්වා අඩුකිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනත | |
| 2021.04.05 | 2021.04.05 දිනැති අංක 2222/2 දරන ගැසට් නිවේදනය,<br>- ශ්‍රී ලංකා පොලිසියට ත්‍රිරෝද රථ 2,000 ක් මිලදී ගැනීම සඳහා අදාල වන බදු නිදහස් කිරීම. |
| 2021.04.06 | 2021.04.05 දිනැති අංක 2222/3 දරන ගැසට් නිවේදනය,<br>- වාහන නිෂ්පාදනය එකලස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව නිෂ්පාදනය කරන ලද/ එකලස් කරන ලද මෝටර් වාහන හා යතුරු පැදි සඳහා නව බදු ව්‍යුහයක් හඳුන්වා දීම. |
| 2021.04.23 | 2021.04.22 දිනැති අංක 2224/24 දරන ගැසට් නිවේදනය,<br>- ජංගම වැඩපළ මෝටර් රථ සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම. |
| සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය) | |
| 2021.01.01 | සුරාබදු නිවේදන අංක 01/2021 (2021.01.01 දිනැති අංක 2208/34 දරන ගැසට් නිවේදනය)<br>- ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කරන දිනය දීර්ඝ කිරීම. |
| 2021.01.01 | සුරාබදු නිවේදන අංක 02/2021 (2021.01.01 දිනැති අංක 2208/35 දරන ගැසට් නිවේදනය)<br>- ර.බී.7, ර.බී.8, ර.බී.11, ර.බී.12 සහ ර.බී.22B බලපත්‍ර සඳහා 2021 වසර සඳහා වූ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තුව නිදහස් කිරීම. |
| 2021.01.08 | සුරාබදු නිවේදන අංක 03/2021 (2021.01.07 දිනැති අංක 2209/42 දරන ගැසට් නිවේදනය)<br>- ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් රුපියල් විසිපහක් වන බද්දක් නියම කිරීම.<br>- සුරාබදු නිවේදන අංක 993 (2016.12.20 දිනැති අංක 1998/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය) මෙයින් අවලංගු වේ. |
| 2021.01.07 | සුරාබදු නිවේදන අංක 04/2021 (2021.01.07 දිනැති අංක 2209/44 දරනගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 03/2018 දක්වෙන රා තැබෑරුම් විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් සංශෝධනය කිරීම.<br>- සුරාබදු නිවේදන අංක 11/2018 (2020.06.13 දිනැති අංක 2075/24 දරන අති විශේෂ ගැසට් නිවේදනය) මෙයින් අවලංගු වේ. |
| 2021.01.07 | සුරාබදු නිවේදන අංක 05/2021 (2021.01.07 දිනැති අංක 2209/43 දරන ගැසට් නිවේදනය)<br>- රා සිල්ලරට විකුණනු ලබන සීමාව හා ප්‍රවාහනය කළහැකි ප්‍රමාණය මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි ලීටර් තුනක් දක්වා සංශෝධනය කිරීම.<br>- 1985.08.14 දිනැති සුරාබදු නිවේදන අංක 745 මෙයින් අවලංගු වේ. |
| 2021.01.11 | සුරාබදු නිවේදන අංක 06/2021 (2021.01.11 දිනැති අංක 2210/2 දරන ගැසට් නිවේදනය)<br>- තරු 03 හා තරු 04 හෝටල් සහ තරු 05 හා ඊට ඉහල ගණයේ හෝටල්/ බුටික් හෝටල්/ බුටික් විලා පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මධ්‍යසාර භාවිතයට අය කරනු ලබන ගාස්තුව 2021 වර්ෂය සඳහා ගෙවීමෙන් නිදහස් කිරීම. |
| 2021.02.25 | සුරාබදු නිවේදන අංක 07/2021 (2021.02.25 දිනැති අංක 2216/16 දරන ගැසට් නිවේදනය)<br>- ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතියට අදාළ වන්නා වූ රීති නියම කිරීම. |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනත | |
| 2021.01.05 | 2021.01.05 දිනැති අංක 2209/17 දරන ගැසට් නිවේදනය<br>- සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත පැවරී තිබූ මුහුණු ආවරණ නිෂ්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය සහ ඖෂධ නිෂ්පාදනය කරනු ලබන යන්ත්‍රෝපකරණ මත පැනවී ඇති වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු නිදහස් කිරීම සඳහා නිර්දේශ කිරීමේ අධිකාරි බලය ඖෂධ නියාමන, සැපයුම් හා නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත පැවරීම. |
| 2021.02.23 | 2021.02.22 දිනැති අංක 2216/3 දරන ගැසට් නිවේදනය<br>- කිරිපිටි ආනයනය මත 2.5% සහනදායී අනුපාතය ප්‍රදානය කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.03.09 | 2021.03.09 දිනැති අංක 2218/51 දරන ගැසට් නිවේදනය<br>- යම් ව්‍යවසායයක් ඇ.ඩො. මිලියන 50 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ආයෝජනයක් අදියර වශයෙන් යොදා ගනිමින් එහි වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර එය ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉදිකිරීමේදී එම ව්‍යාපෘතිය අදාළ බද්දෙන් නිදහස් කෙරේ. |
| 2021.03.20 | 2021.03.19 දිනැති අංක 2219/68 දරන ගැසට් නිවේදනය<br>- ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිම් තාර නිෂ්පාදනය සඳහා විශේෂිතව ආනයනය කරනු ලබන දූවි තෙල් මත වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සහන ලබාදීම. |
| 2021.04.20 | 2021.04.19 දිනැති අංක 2224/8 දරන ගැසට් නිවේදනය<br>- ආනයනික ජාත්‍යන්තර ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු මිල මෙට්‍රික් ටොන් එකකට ඇ.ඩො. 325 ට ලගාවන තුරු 7.5% සහනදායී අනුපාතයක් හෝ මෙට්‍රික් ටොන් එකකට රු.2,000 යන දෙකෙන් වඩා අඩු බදු සහනය ලබාදීම |
| සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | |
| 2021.01.13 | 2021.01.12 දිනැති අංක 2210/9 දරන ගැසට් නිවේදනය<br>- ආනයනික අමු ද්‍රව්‍ය යොදා ගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන පහත කොන්දේසි සපුරන ව්‍යවසායක් විසින් එම අපනයන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියෙන් සහ අළුත්වැඩියා/ නඩත්තු ක්‍රියාවලිය තුළින් ජනිත වන සුන්බුන් හෝ ඉවත ලන දෑ අපනයනය කිරීමේ දී සෙස් බද්ද අදාළ නොවේ :<br>(i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් ලියාපදිංචි වී ඇත්තේ නම් ; හෝ<br>(ii) රේගු බන්ධිත ගුදම් තුල වන නිෂ්පාදන(Customs Manufacture – In – Bond) වැඩපිළිවෙල හෝ අපනයන සඳහා තාවකාලික ආනයන (TIEP) වැඩපිළිවෙල යටතේ ලියාපදිංචි වී තිබීම. |
| 2021.03.18 | 2021.03.17 දිනැති අංක 2219/36 දරන ගැසට් නිවේදනය<br>- 2019 මාර්තු 06 හෝ එදිනට පසුව ව්‍යාපෘතිය ඇ.එ.ජ. ඩොලර් මිලියන 50 හෝ ඊට වැඩි ආයෝජනයක් එක් එක් අදියර තුළ සිදු කරන ඕනෑම ව්‍යවසායයක් සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් මගින්, එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ හෝ ව්‍යාපෘතිය ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයන් බද්දෙන් නිදහස් කිරීම. |
| 2021.03.16 | 2021.03.15 දිනැති අංක 2219/15 දරන ගැසට් නිවේදනය<br>- පිඟන් ගඩොල් සහ සෞඛ්‍යාරක්ෂක සවිකරන ද්‍රව්‍ය ආනයනය මත බදු අනුපාත සංශෝධනය කිරීම. |
| රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත | |
| 2021.04.23 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2021 (2020.11.17 දිනැති අංක 2224/25 දරන ගැසට් නිවේදනය)<br>- රාජ්‍ය ගිණුම්කාරක සභාවේ මඟපෙන්වීම පරිදි ජංගම වැඩපොළ වාහන සඳහා නව ජාතික උප බෙදුම් සංයෝජිත සංකේතාංක ඇති කිරීම. |
| 2021.05.18 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2021 (2021.05.17 දිනැති අංක 2228/2 දරන ගැසට් නිවේදනය)<br>- මුහුණු ආවරණ සඳහා සහනදායි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම හේතුවෙන් සිදුවන ආදායම් අහිමිවීම වැළැක්වීම සඳහා නව සංයෝජිත සංකේතාංකයක් ඒ වෙනුවෙන් ඇතිකිරීම. |
| රේගු අධිභාරය - රේගු ආඥාපනත (232 වැනි අධිකාරය) | |
| 2021.02.02 | 2021.02.01 දිනැති අංක 2213/7 දරන ගැසට් නිවේදනය.<br>- තෝරාගත් ඉන්ධන ආනයනය සඳහා වූ අධිභාරය ශුන්‍ය කිරීම.. |
| රේගු ආනයන බදු නිදහස් කිරීම - රේගු ආඥාපනත (232 වැනි අධිකාරය) | |
| 2021.01.01 | - පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 7 සිට රු. 18 දක්වා වැඩි කිරීම සහ පෙට්‍රල් (ඔක්ටේන් 95) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 6 සිට රු. 16 දක්වා වැඩි කිරීම.<br>- සුපර් ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 15 ක රේගු තීරු බදු නිදහස් කිරීම සහ ඔටෝ ඩීසල් ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 20 සිට දක්වා වැඩි කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.02.02 | - පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 18 සිට රු. 29 දක්වා වැඩි කිරීම සහ පෙට්‍රල් (ඔක්ටේන් 95) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 16 සිට රු. 8 දක්වා අඩු කිරීම.<br>- සුපර් ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 15 ක රේගු තීරු බදු නිදහස් කිරීම ඉවත් කිරීම සහ ඔටෝ ඩීසල් ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 20 සිට රු. 14 දක්වා අඩු කිරීම. |
| 2021.03.25 | - පෙට්‍රල් (ඔක්ටේන් 92) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 29 සිට රු. 45 දක්වා වැඩි කිරීම සහ පෙට්‍රල් (ඔක්ටේන් 95) ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 16 සිට රු. 24 දක්වා වැඩි කිරීම.<br>- සුපර් ඩීසල් ආනයනය මත ලීටරයකට රු. 10 ක රේගු තීරු බදු නිදහස් කිරීම හඳුන්වා දීම සහ ඔටෝ ඩීසල් ආනයනය මත රේගු තීරු බදු නිදහස් කිරීම ලීටරයකට රු. 14 සිට රු. 25 දක්වා වැඩි කිරීම. |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත | |
| 2021.01.14 | 2021.01.13 දිනැති අංක 2210/16 දරන ගැසට් නිවේදනය.<br>- සීනි, බොම්බයි ළූණු සහ පරිප්පු ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.01.19 | 2021.01.18 දිනැති අංක 2211/8 දරන ගැසට් නිවේදනය.<br>- චීස්, කොත්තමල්ලි, කහ සහ උඳු පිටි ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.02.12 | 2021.02.11 දිනැති අංක 2214/58 දරන ගැසට් නිවේදනය.<br>- කරවල වර්ග සඳහා අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද එම අගයෙහිම පවත්වා ගැනීම සහ එළවළු මිල පාලනය කිරීම සඳහා අර්තාපල් මත වන බද්ද මාස 06ක කාලයක් සඳහා රු.15 දක්වා අඩු කිරීම. |
| 2021.03.04 | 2021.03.03 දිනැති අංක 2217/23 දරන ගැසට් නිවේදනය.<br>- මැකරල් මාළු, උඳු, කව්පි, කුරක්කන් සහ මිලට් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.04.14 | 2021.04.13 දිනැති අංක 2223/2 දරන ගැසට් නිවේදනය.<br>- සීනි, බොම්බයි ළූණු සහ පරිප්පු ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.04.28 | 2021.04.27 දිනැති අංක 2225/1 දරන ගැසට් නිවේදනය.<br>- මාළු, උම්බලකඩ, මුං ඇට, මැංගුස්ටීන් සහ කිව් ෆෘට් ආනයනය මත අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2021.04.28 | 2021.04.27 දිනැති අංක 2225/8 දරන ගැසට් නිවේදනය.<br>- දිසිදි පොල් (අනෙකුත්) ආනයනය මත කි. ග්‍රැමයට රු. 300 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 03 ක කාලයක් සඳහා පැනවීම සහ බී. සී. සී ලංකා ආයතනය බද්දෙන් නිදහස් කිරීම. |
| 2021.04.27 | 2021.04.27 දිනැති අංක 2225/13 දරන ගැසට් නිවේදනය.<br>- අර්තාපල් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 50 ක් දක්වා වැඩි කිරීම. |
| 2021.05.18 | 2021.05.17 දිනැති අංක 2285/103 දරන ගැසට් නිවේදනය.<br>- අයිතම 22 ක් සඳහා ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි | |
| 2021.01.05 | 2021 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.01.05 දිනැති අංක 2209/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>- 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි වශයෙන් ආනයන රෙගුලාසි යටතේ ප්‍රකාශයට පත් කරන ලද හඳුනාගත් ආනයනික ටයර් භාණ්ඩ ලැයිස්තුව සංශෝධනය කිරීම. |
| 2021.02.11 | 2021 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.02.11 දිනැති අංක 2214/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>- 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි වශයෙන් ආනයන රෙගුලාසි යටතේ ප්‍රකාශයට පත් කරන ලද හඳුනාගත් ආනයනික සෙරමික් භාණ්ඩ සහ සාරි ලැයිස්තුව සංශෝධනය කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.04.07 | 2021 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.04.06 දිනැති අංක 2222/31 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>- පාම් තෙල් ආනයනයට අදාල නියෝග පැනවීම. |
| 2021.04.23 | 2021 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.04.23 දිනැති අංක 2224/43 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>- ජංගම වැඩ පොළොවල් සඳහා අනයන පාලන බලපත්‍ර පැනවීම. |
| 2021.04.23 | 2021 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.04.23 දිනැති අංක 2224/44 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>- විශේෂ කාර්යය මෝටර් වාහන ආනයනය තාවකාලිකව අත් හිටුවීම. |
| 2021.05.07 | 2021 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2021.05.06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br>- රසායනික පොහොර, කෘමි නාශක සහ පළිබෝධ නාශක ආනයනය පාලනය කිරීම. |
| 2018 අංක 35 දරන මුදල් පනත | |
| මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද | |
| 2021.01.05 | 2021.01.05 දිනැති අංක 2209/23 දරන ගැසට් නිවේදනය<br>- පාර්ලිමේන්තු කටයුතු විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ 8 වන පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ආනයනය කරන ලද මෝටර් රථයක්, සුඛෝපභෝගී භාණ්ඩ බද්දෙන් නිදහස් කිරීම. |
| 2006 අංක 11 දරන මුදල් පනත | |
| ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩ සටහන් බද්ද | |
| 2021.02.09 | 2021.02.09 දිනැති අංක 2214/25 දරන ගැසට් නිවේදනය<br>- විදේශීය ටෙලි නාට්‍ය සහ චිත්‍රපට විකාශනය මත පනවනු ලබන ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද නැවත පැනවීම. කොවිඩ්-19 ආශ්‍රිත සීමා නිසා දේශීය ටෙලිනාට්‍ය හා චිත්‍රපටි නිෂ්පාදනය කිරීමට ඇති වූ බාධා සලකා බලා තාවකාලික ක්‍රියාමාර්ගයක් ලෙස විදේශීය ටෙලිනාට්‍ය හා චිත්‍රපට මෙම බද්දෙන් 2020 මාර්තු මස 27 දින සිට නිදහස් කිරීම. |
| 2021.05.11 | 2021.05.10 දිනැති අංක 2227/2 දරන ගැසට් නිවේදනය<br>- මාසයක කාලයක් සඳහා විදේශීය වාණිජ වැඩසටහන් විකාශනය වෙනුවෙන් නිෂ්කාශන සහතිකයක් ලබාගැනීමේ විධිවිධානයක් හඳුන්වා දීම. |
| 2009 අංක 11 දරන මුදල් පනත | |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද | |
| 2021.01.01 | 2021.02.09 දිනැති අංක 2214/25 දරන ගැසට් නිවේදනය<br>- 2021.01.01 දින සිට ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද එම අගයෙන්ම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම |
| 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත | |
| 2021.01.05 | 2021.01.05 දිනැති අංක 2209/22 දරන ගැසට් නිවේදනය<br>- හම්බන්තොට ආරබොක්ක ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන්කළ කලාපයක් පිහිටුවීම. |
| 2021.03.05 | 2021.03.05 දිනැති අංක 2217/40 දරන ගැසට් නිවේදනය<br>- "සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" පිහිටුවීමට අදළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම. |
| 2021.03.23 | 2021.03.23 දිනැති අංක 2220/30 දරන ගැසට් නිවේදනය<br>- කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම. |
| 2021.04.19 | 2021.04.19 දිනැති අංක 2224/2 දරන ගැසට් නිවේදනය<br>- ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන්කළ විශේෂිත කලාපය තුල ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරි දීමනා නියම කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2021.04.20 | 2021.04.20 දිනැති අංක 2224/9 දරන ගැසට් නිවේදනය<br>- රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහාම වෙන්කළ විශේෂිත කලාපය තුළ ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරි දීමනා නියම කිරීම. |
| 2021.05.24 | 2021.05.24 දිනැති අංක 2229/2 දරන ගැසට් නිවේදනය<br>- "වෙල්කම් හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාල සීමාව 2022 ජනවාරි මස 01 දින සිට තවදුරටත් මාස දහ අටක (18) කින් දීර්ඝ කිරීම. |
| 2021.05.24 | 2021.05.24 දිනැති අංක 2229/3 දරන ගැසට් නිවේදනය<br>- "ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ්" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාලසීමාව 2020 මාර්තු මස 25 වන දින සිට තවදුරටත් මාස දහනවයක (19) කින් දීර්ඝ කිරීම. |

### රාජ්‍ය වියදම

2020 වසරේ අනුරූපී කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ වියදම වන රු. බිලියන 930.9 හා සැසඳීමේ දී 2021 වසරේ පළමු මාස හතර තුළ රජයේ මුළු වියදම රු. බිලියන 1,002.8 ක් දක්වා සියයට 7.7 ක වැඩිවීමක් වාර්තා විය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සහ ජීවනෝපාය ආධාර ලබා දීම, වසංගතය වැළැක්වීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග වන නිරෝධායන කටයුතු සහ එන්නත් ආනයනය සඳහා වියදම්, වැනි ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතයට අදාළ වියදම් වලට අමතරව පොලී ගෙවීම, වැටුප් හා විශ්‍රාම වැටුප් සඳහා වූ වියදම වැඩි වීම හේතුවෙන් 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 820.7 හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර සඳහා පුනරාවර්තන වියදම රු. බිලියන 890.1 දක්වා සියයට 8.5 කින් ඉහළ ගොස් ඇත. 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 110.2 හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුළ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් සඳහා වියදම රු. බිලියන 112.7 දක්වා සියයට 2.3 කින් පමණ සුළු වශයෙන් ඉහළ ගොස් ඇත

**2.9 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ වියදම් කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **820,685** | **890,085** |
| පුද්ගල පඩිනඩි | 253,810 | 274,044 |
| විශ්‍රාම වැටුප් | 79,878 | 87,345 |
| පොලී ගෙවීම් | 336,216 | 366,240 |
| වෙනත් | 150,781 | 162,456 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් | **110,186** | **112,748** |
| එකතුව | **930,871** | **1,002,832** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### පොලී ගෙවීම්

2020 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 336.2 හා සැසඳීමේදී 2021 වසරේ පළමු මාස හතර තුළ දේශීය හා විදේශීය ණය පොලී ගෙවීම රු. බිලියන 366.2 දක්වා සියයට 8.9 කින් පමණ ඉහළ ගොස් ඇත. 2020 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද ණය සඳහා විදේශීය බැඳියාව අඩු කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තියේ ප්‍රතිලාභයක් ලෙස 2020 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 104.1 හා සැසඳීමේ දී 2021 වසරේ පළමු මාස හතර තුළ විදේශ ණය සඳහා පොලී ගෙවීම් සියයට 11.3 කින් පහළ ගොස් රු. බිලියන 92.4 ක් වූ අතර 2020 පළමු මාස හතර තුළදී රු. බිලියන 232.0 ක් වූ දේශීය ණය සඳහා පොලී ගෙවීම් 2021 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 273.8 දක්වා සියයට 18.0 කින් ඉහළ ඇත.

### වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප්

පළාත් සභා සහ අයවැය මඟින් මූල්‍ය දායකත්වය ලබා දෙන රාජ්‍ය ආයතන ද ඇතුළුව සියලු රාජ්‍ය සේවාවන්ගේ වැටුප් හා වේතන ලෙස 2021 පළමු මාස හතරක කාලය තුළ දී රුපියල් බිලියන 274.0 ක වියදමක් දරා ඇති අතර 2020 වසරේ සමාන කාලසීමාව තුළ දරන ලද රු. බිලියන 253.8 ට සාපේක්ෂව එය සියයට 8 ක වර්ධනයකි.

මෙයට අමතරව 2021 වසරේ පළමු මාස හතර තුළ විශ්‍රාම වැටුප් සඳහා රු. බිලියන 87.3 ක් ගෙවා ඇති අතර, එය 2020 වසරේ සමාන කාලසීමාව තුළ දරන ලද රු. බිලියන 79.9 ට සාපේක්ෂව සියයට 9.3 ක වර්ධනයකි. මෑත කාලීනව විශ්‍රාම ලැබූ විශ්‍රාමිකයන්ගේ මූලික වැටුප ඉහළ අගයක් ගැනීම සහ හිඟ පාරිතෝෂික නිරවුල් කිරීම මෙම වර්ධනය කෙරෙහි හේතු වී ඇත.

### සුබසාධන වියදම

2021 වසරේ පළමු මාස හතර තුළ සමෘද්ධි සහනාධාරය, වැඩිහිටි දීමනාව, ආබාධිත රණවිරුවන් සඳහා වන ආධාර, ගැබිණි මව්වරුන් සඳහා වන පෝෂණ මල්ල,

පොහොර සහනාධාරය සහ පාසල් නිල ඇඳුම් හා පෙළ පොත් ඇතුළත් කුටුම්භ සහනාධාර සඳහා රජය විසින් රු. බිලියන 172.1 ක වියදමක් දරන ලදී.

2021 වසරේ පළමු මාස හතර තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදුන් සමෘද්ධි මුදල් ප්‍රදාන රු. මිලියන 17,271 ක් වූ නොවනස් අගයක පැවතුනි. කෙසේ වුවද, 2020.06.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2020 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි රටතුළ ජීවත් වන සියලුම අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් ප්‍රතිලාභ ලැබීමට ඇතුළත් කිරීමත් සමග ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඉහළයාම හේතුවෙන් වකුගඩු රෝගීන් සඳහා මසකට රු. 5,000 බැගින් ගෙවන ලද මූල්‍ය ආධාරය රු. මිලියන 554 සිට රු. මිලියන 776 දක්වා සියයට 40 කින් වැඩිවිය.

කොවිඩ්-19 වසංගතය වැළැක්වීම වෙනුවෙන් දරන ලද අතිරේක වියදම හේතුවෙන් 2021 වර්ෂයේ පළමු මාස හතර තුළ, රජයේ රෝහල් සඳහා වන වෛද්‍ය සැපයුම් වලට අදාළ රජයේ වියදම 2020 වර්ෂයේ අනුරූපී කාල සීමාව තුළ දරන ලද රු. මිලියන 13,763 ට සාපේක්ෂව රු. මිලියන 20,143ක් දක්වා සියයට 46කින් වැඩිවිය. මේ අතර, ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දීම වෙනුවෙන් රජය විසින් රු. මිලියන 2,000කට ආසන්න මුදලක් වැය කර ඇත.

අදාළ කාල සීමාව සඳහා පාසල් ළමුන් වෙනුවෙන් නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, දුෂ්කර ප්‍රදේශවල පාසැල් සිසුන් සඳහා පාවහන් යුවලක් ලබා දීම වැනි අධ්‍යාපනය සඳහා වූ සුබසාධන වැඩසටහන් වෙනුවෙන් දරන ලද පිරිවැය රු. මිලියන 2,888 ක් විය.

**2.10 වගුව : 2021 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා ප්‍රධාන සුබසාධන වැඩසටහන් සඳහා වියදම්**

රු. මිලියන

| වැඩසටහනේ නම | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|
| සමාජ සුබසාධනය | |
| විශ්‍රාම වැටුප් | 87,502 |
| සමෘද්ධි සහනාධාර | 17,271 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර | 1,432 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර | 3,303 |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | 776 |
| රණවිරු මාපිය රැකවරණ , දීමනාව | 724 |
| ගංවතුර හා නියං සහනාධාර | 41 |
| පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 0 |
| මියගිය හා තුවාල ලැබූ සොල්දාදුවන් සඳහා සේවා වන්දි | 12,293 |
| සෞඛ්‍ය හා පෝෂණ | |
| ත්‍රිපෝෂ වැඩසටහන | 98 |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ල | 1,928 |
| පාසල් පෝෂ්‍යදායී ආහාර වැඩසටහන | 781 |
| නැවුම් කිරි වැඩසටහන- පාසල් ළමුන් | 0 |
| පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය | 1,353 |
| පෙර පාසල් ළමුන් සඳහා උදය ආහාරය | 36 |
| රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් සමග) | 20,143 |
| අධ්‍යාපනය | |
| පාසල් පෙළ පොත් | 541 |
| පාසල් නිල ඇඳුම් | 684 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන් | 802 |
| ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන් | 208 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර | 600 |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ලැප්ටොප් පරිගණක හා වයිෆයි පහසුකම් සඳහා පොළී සහනාධාර | 1 |
| රාජ්‍ය විශ්ව විද්‍යාල වලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | 50 |
| පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර | 3,800 |
| දහම් පාසල් ශිෂ්‍යයින් සඳහා පෙළ පොත් | 1 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 1 |
| සහනාධාර | |
| පොහොර සහ බෝග සහනාධාර | 7,140 |
| වෙනත් සහනාධාර | |
| ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ග යන්හි ශ්‍රී ල. ග. ම. බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ සේවාවන්ට බස් ගමන් අවසර පත් ලබාදීම | 3,800 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

සාමාන්‍ය සුබසාධන වැඩසටහන් වලට අමතරව, 2020 වර්ෂයේ දී කොවිඩ්-19 පැතිරයාම ආරම්භ වූ අවස්ථාවේ දී ලබාදුන් සහන රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර රට තුළ හුදකලා කිරීම් සහ සංචරණ සීමා පැනවීම හේතුවෙන් සෘජුව හෝ වක්‍රව තම ජීවනෝපායන් අහිමි වූ ජනතාවට සහ වැඩිහිටියන්, ආබාධිත පුරවැසියන් සහ වකුගඩු රෝගීන් වැනි පොරොත්තු ලේඛනයේ සිටි ප්‍රතිලාභීන් සඳහා 2021 අප්‍රේල් සහ මැයි මාස සඳහා රු. 5,000 මුදල් දීමනාව ලබාදෙන ලදී. තවද, අවදානමට ගොදුරු විය හැකි සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහන මිලකට ලබා දීමටද පියවර ගන්නා ලදී.

### ආංශික වියදම්

### පාසල් අධ්‍යාපනය

2021 වසරේ පළමු මාස හතර තුළ පාසල් අධ්‍යාපනය වෙනුවෙන් රජය දරන ලද මුළු වියදම රු. මිලියන 82,035 ක් වන අතර ඉන් රු. මිලියන 80,925 ක් පුනරාවර්තන වියදම් වූ අතර ප්‍රාග්ධන වියදම් රු. මිලියන 1,110 කි. සමස්ත පුනරාවර්තන වියදම් සියයට 9.87 කින් ඉහළ ගිය නමුත් කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පාසල් ළමුන් සඳහා පෝෂ්‍යදායි ආහාර සහ කිරි වීදුරුවක් සැපයීම වැනි සුබසාධන වැඩසටහන් සැලසුම් කර ඇති පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා සුබසාධන වියදම් සියයට 19.6 කින් අඩු වී ඇත.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ ඉගෙනුම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් "ඊ-තක්සලාව" සහ "ගුරු ගෙදර" රූපවාහිනී වැඩසටහන තුළින් දුරස්ථ අධ්‍යාපනය නගා සිටුවීමට පියවර ගෙන තිබේ. තවද, ග්‍රාමීය පාසල් 4092 ක් වෙත ලබාදීම සඳහා රූපවාහිනී යන්ත්‍ර 5945 මිලදී ගැනීමටත් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීමටත් අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී.

**2.11 වගුව : 2021 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පඩිනඩි | 60,080 | 69,059 |
| ජාතික | *13,867* | *14,224* |
| පළාත් | *46,213* | *54,835* |
| සුභසාධන වැඩසටහන | 5,432 | 4,369 |
| විභාග ඇගයීම් කටයුතු | 1,165 | 702 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය | 4,129 | 403 |
| විශේෂ අධ්‍යාපන සංවර්ධනය | 55 | 4 |
| ගුරු සංවර්ධනය | 327 | 98 |
| පළාත් අධ්‍යාපනය | 584 | 470 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### උසස් අධ්‍යාපනය

2020 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වැය කරන ලද වියදම සියයට 17ක වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, එම සමස්ත වියදම රු. මිලියන 23,261 ක් විය. මෙම කාල පරිච්ඡේදය තුළ පුනරාවර්තන වියදම සියයට 7 කින් වර්ධනය වෙමින් රු. මිලියන 17,699 ක් ලෙස වාර්තා වී ඇත. මූලධන වියදම්වල වර්ධනය සියයට 64 ක් වූ අතර, එය රු. මිලියන 5,562 ක් විය. සමස්ත මූලධන වියදමෙන් රු. මිලියන 904 ක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල සහ කැලණිය සහ සබරගමුව විශ්වවිද්‍යාලවල තාක්ෂණික පීඨ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කර ඇත. තවද උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වර්ධනය, විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත විෂය ධාරාවන් සඳහා ඇතුලත් වන සිසුන් සංඛ්‍යාව වර්ධනය කිරීම විශ්වවිද්‍යාලවල විෂයමාලා සංවර්ධනය කිරීම අරමුණු කරගත් "උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)" සඳහා රු. මිලියන 1,595 ක් දරා ඇත.

නිපුණතා සංවර්ධනය සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය සඳහා වැය කරන ලද මුදල රු. මිලියන 2,537 ක් වූ අතර, එයින් රු. මිලියන 242 ක් මූලධන ව්‍යාපෘති සඳහා 2021 වසරේ පළමු මාස හතර තුළ දරනු ලැබිණි.

**2.12 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම් | 14,677 | 15,221 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 525 | 600 |
| **මූලධන වියදම** | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සංවර්ධනය | 1,157 | 1,531 |
| වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම | 100 | 50 |
| විශ්වවිද්‍යාලවල තාක්ෂණික පීඨ ස්ථාපිත කිරීම | 250 | 250 |
| විශ්වවිද්‍යාල සිසුන් වෙත ලබාදෙන ලැප්ටොප් පරිගණක සඳහා ණයපොලී | 49 | 1 |
| උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 290 | 1,595 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම ( ශ්‍රී ලංකා - කුවේට් රජය) | 325 | 574 |
| විද්‍යා සහ තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය-අ.සං.බැ.) | 80 | 904 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**2.13 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා නිපුණතා සංවර්ධනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන | 46 | 113 |
| කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීම | 157 | 68 |
| ආණමඩුව කාර්මික විද්‍යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 37 | 9 |
| "නිපුණතා සිසුදිරිය" ශිෂ්‍යත්ව වැඩසටහන | - | 47 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## සෞඛ්‍යය

කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල පැමිණීමත් සමඟ පුරවැසියන් වෙත අත්‍යාවශ්‍ය සෞඛ්‍යය සේවාවන් අඛණ්ඩව ලබා දීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, 2021 වසරේ පළමු මාස හතර තුළ බටහිර සහ දේශීය වෛද්‍ය ඇතුළුව මධ්‍යම රජයේ සහ පළාත් සෞඛ්‍යය සේවා සඳහා වියදම රු.මිලියන 91,296 ක් දක්වා සියයට 24.2 කින් විශාල ලෙස ඉහළ ගොස් තිබේ. සෞඛ්‍යය සඳහා වන මුළු වියදමින් රු. මිලියන 83,242 ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර මූලධන ආයෝජනය රු. මිලියන 8,054 කි.

පුනරාවර්තන වියදම් වල ප්‍රධාන කාණ්ඩ වලින් එකක් වන වෛද්‍ය සැපයුම් 2020 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරයි. එබැවින්, පුනරාවර්තන සංරචකය යටතේ කරන ලද මුළු ආයෝජනයෙන් රු. මිලියන 20,143 ක් ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර අයිතම සඳහා වියදම් කර ඇත.

**2.14 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම්**

රු.මිලියන

| විස්තරය | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | **68,421** | **83,242** |
| එයින් සේවා සැපයීමේ වියදම | 38,501 | 44,352 |
| වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 31,915 | 34,693 |
| වෛද්‍ය සැපයීම් | 13,763 | 20,143 |
| පළාත් සෞඛ්‍ය | 16,158 | 18,747 |

රු.මිලියන

| විස්තරය | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| රාජ්‍ය ආයෝජන වියදම | **5,059** | **8,054** |
| වෛද්‍ය උපකරණ | 1,283 | 1,282 |
| සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | - | 824 |
| කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | - | 804 |
| කරාපිටිය, අම්පාර, යාපනය රෝහල්වල ළමා රෝග රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීම | 36 | 185 |
| තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම (එක්සිම් බැංකුව, චීන රජය) | - | 175 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල හදිසි අනතුරු ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම | 67 | 109 |
| බාහිර රෝගී සේවා සංකීර්ණය සංවර්ධනය - කොළඹ ජාතික රෝහල (ශ්‍රී ලංකා රජය - චීන රජය) | 110 | 98 |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් අධිශක්ති විකිරණ ප්‍රතිකාර ලබා දීම | 88 | 69 |
| වකුගඩු රෝග නිවාරණය සඳහා නව රසායනාගාරයක් සහ නව රෝහලක් ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය - චීන රජය) | 139 | 10 |
| හෙද පීඨය/ නේවාසිකාගාරය ඉදිකිරීම | 177 | 5 |
| වෙනත් මූලධන ආයෝජන | 2,012 | 4,493 |
| පළාත් සෞඛ්‍ය ආයෝජන | 1,147 | 1,377 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණය

2021 වසරේ පළමු මාස හතර තුළ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණය සඳහා මුළු රාජ්‍ය ආයෝජනය රු. මිලියන 8,807 කි. ඉන් රු. මිලියන 1,400 ක් මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන ද ඇතුළුව මහවැලි ප්‍රදේශයන්හි වාරිමාර්ග යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා වියදම් කර ඇත. ඉතිරි රු. මිලියන 7,407 වාරිමාර්ග අමාත්‍යාංශ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාරි පද්ධතියේ සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් වියදම් කර ඇත.

### කෘෂිකර්මය

පශු සම්පත්, වැවිලි, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන් ද ඇතුළත්ව කෘෂිකර්ම අංශය සඳහා 2021 වසරේ පළමු මාස හතර තුල රු. මිලියන 16,991 ක වියදමක් දරා ඇත. ඉන් රුපියල් මිලියන 6,655 ක් පොහොර නිෂ්පාදනය, බෙදා හැරීම, නියාමනය සහ රසායනික පොහොර හා කෘමි නාශක භාවිතය වෙනුවෙන් වියදම් කර ඇත. තවද, කෘෂිභෝග සඳහා රු. මිලියන 4,277 ක්ද, වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2,386 ක්ද ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රු. මිලියන 928 ක්ද වියදම් දරා ඇති අතර ඉතිරිය පශු සම්පත් සංවර්ධනය වෙනුවෙන් වැය කර ඇත.

### ජල සම්පාදන හා සනීපාරක්ෂාව

සුරක්ෂිත පානීය ජලය සහ ගුණාත්මක සනීපාරක්ෂක සේවා ලබා ගැනීම සඳහා දේශීය සහ විදේශීය බැංකුවලින් ලබාගත් ණය සේවාකරණය ඇතුළුව රු. මිලියන 4,705 ක වියදමක්, 2021 වසරේ පළමු මාස හතරක කාලය තුළ රජය විසින් අඛණ්ඩව දරා ඇත. සැමට පානීය ජලය ලබා දීම සහතික කිරීම සඳහා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඇතිකිරීම සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීම අරමුණු කරගත් "සැමට ජලය" ජාතික වැඩසටහන ව්‍යාපෘති 248 කින් සමන්විත වේ.

**2.15 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා තෝරාගත් ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති වියදම්**

රු. මිලියන

| ව්‍යාපෘතිය | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|
| නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශ ආශ්‍රිතව වැළඳෙන රෝග නිවාරණය පිළිබඳ වැඩසටහන | 67 |
| ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව) | 964 |
| මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 1 (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව ) | 626 |
| අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය / ප්‍රංශය ) | 254 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන යෝජනා ක්‍රමය අදියර 1 ( ශ්‍රී ලංකා රජය / ජයිකා ) | 111 |
| මහනුවර උතුර හා පාතදුම්බර ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය / චීනය ) | 774 |
| " සැමට ජලය " දිවයින පුරා ක්‍රියාත්මක වන ජල සම්පාදන වැඩසටහන | 30 |
| " ප්‍රජා ජල අභිමන් "ජල සම්පාදන යෝජනා ක්‍රමය | 131 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### මහාමාර්ග සහ පාලම්

2021 වසරේ පළමු මාස හතර තුළ මාර්ග සහ පාලම් ඉදිකිරීම සහ නඩත්තුව වෙනුවෙන් රු. මිලියන 38,796 ක වියදමක් දරා ඇති අතර එය 2020 වසරේ පළමු මාස හතරේ වියදම හා සංසන්දනය කිරීමේදී සියයට හතරක පමණ වැඩි වීමකි. ඉහත වියදමින් රු. මිලියන 22,527 ක් ජාතික මාර්ග සහ ග්‍රාමීය මාර්ග පද්ධතියේ සංවර්ධන කටයුතු සඳහා වියදම් කර ඇත.

ග්‍රාමීය සහ පළාත් මාර්ග ජාලයේ කි.මී. 6,000 කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කිරීම උදෙසා ආරම්භකර ඇති ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන ( i-road project ) සඳහා රු. මිලියන 12,055 ක වියදමක් දරා ඇත. තව ද ග්‍රාමීය ප්‍රදේශ ප්‍රධාන මාර්ග සමග සම්බන්ධ කිරීම මෙන්ම නාගරික රථවාහන තදබදය අවම කිරීමේ අරමුණින් ආරම්භ කර ඇති කිලෝමීටර් 100,000 විකල්ප මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 7,371 ක වියදමක් දරා ඇත.

එසේම අධිවේගී මාර්ග ජාලයේ සංවර්ධනය උදෙසා රු. මිලියන 522 ක වියදමක් දරා ඇත. මීට අමතරව මාර්ග පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මෙන්ම පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 1,437 ක සහ රු. මිලියන 118 ක ආයෝජනයක් මෙම වසරේ පළමු මාස හතර තුළ සිදු කර ඇත.

කැළණි ගඟට ඉහළින් ඉදිවන නව පාලමේ කටයුතු මෙම වසරේ දී අවසන් වීමට නියමිතය. මේ අවස්ථාව වනවිට මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා වූ කොටසේ ඉදිකිරීම් ආරම්භක අවස්ථාවේ ඇත. තව ද, කණු මත ඉදිවන නව වරාය නගර අධිවේගී මාර්ගය, නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මත ඉදිවන මාර්ගය මෙන්ම නව කැළණි පාලම ද කොළඹ නගරය සහ ඒ අවට රථවාහන තදබදය අවම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පුනරුත්ථාපනය සහ සංවර්ධනය සඳහා දේශීය බැංකු මඟින් ලබාගත් ණය වෙනුවෙන් වූ වාරික ගෙවීම සඳහා රු. මිලියන 11,399 මෙම කාලසීමාව තුලදී වියදම් කර ඇත.

**2.16 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා මහාමාර්ග හා පාලම් සඳහා වන වියදම**

රු. මිලියන

| | ව්‍යාපෘතිය/ වැඩසටහන | 2020 ජනවාරි -අප්‍රේල් | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|---|
| **1** | **අධිවේගී මාර්ග සංවර්ධනය** | **8,173** | **520** |
| | පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය අදියර III | 13 | - |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 107 | 444 |
| | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ( දැනටමත් වැඩ අවසන් කර ඇත.) | 5,817 | - |
| | කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය | 9 | 23 |
| | කණු මත දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය | 19 | 31 |
| | කණු මත දිවෙන වරාය නගර අධිවේගී මාර්ගය | 2,208 | 22 |
| **2** | **මහාමාර්ග සංවර්ධනය** | **9,607** | **22,527** |
| | මාර්ග නඩත්තුව | 928 | 1,503 |
| | ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘතිය අදියර III | 1,013 | - |
| | කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 128 | 664 |
| | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 460 | 267 |
| | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | 5,186 | 12,055 |
| | ප්‍රධාන සහ අධිවේගී මාර්ගවලට සම්බන්ධතාවය ලබාදෙන කි.මී 100,000 විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය | - | 7,371 |
| | අනෙකුත් මාර්ග සංවර්ධනය | 1,768 | 667 |
| **3** | **මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම** | **795** | **1,437** |
| **4** | **පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම** | **3,329** | **118** |
| | යකඩ පාලම් ව්‍යාපෘතිය | 11 | - |
| | ජාතික මාර්ග ජාලයේ හානි වූ සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය | 271 | 52 |
| | ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 54 | - |
| | පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 29 | 16 |
| | දෙවන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 2,894 | 32 |
| | අනෙකුත් ( ගුවන් පාලම් ද ඇතුළුව) | 70 | 18 |
| **5** | **ස්වාභාවික ව්‍යසන වලින් බලපෑමට ලක්වූ මාර්ග පුනරුත්ථාපනය** | **485** | **38** |
| **6** | **,මගනැගුම, ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන** | **74** | **16** |
| **7** | **මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාරු කිරීම්** | **2,465** | **2,590** |
| **8** | **ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති )** | **79** | **391** |
| **9** | **මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය හිගය පියවීම සඳහා ලබාදුන් මුදල් දායකත්වය** | **12,137** | **11,339** |
| **10** | **අනෙකුත්** | **-** | **-** |
| | **එකතුව** | **37,144** | **38,796** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## ප්‍රවාහනය

2021 වසරේ පළමු මාස හතර තුළ ප්‍රවාහන අංශය සඳහා රජය විසින් දරන ලද මුළු වියදම රු. මිලියන 13,585 ක් වේ. එයින් රු. මිලියන 9,676 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු. මිලියන 3,909 ක් මූලධන වියදම් සඳහා ද විය. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, මහව සිට ඕමන්තය දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම සහ දුම්රිය ඇණියේ සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාවන් ද ඇතුළත් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා රු. මිලියන 1,453 ක වියදමක් සිදු කරන ලදී.

ප්‍රවාහන අංශය සඳහා රජය විසින් දරන ලද මුළු වියදමින් රු. මිලියන 3,800 ක් ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ගයන්හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ සේවාවන්ට

බස් ගමන් අවසර පත් ලබාදීම සඳහා වියදම් දරා ඇත. 2021 වසරේ පළමු මාස හතර තුළ වාහන ලියාපදිංචිය සඳහා අංක තහඩු ලබාදීම හා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 407 ක වියදමක් සිදු කරන ලදී.

### නිවාස සංවර්ධනය

නිවාස හා යටිතල පහසුකම් ඉදි කිරීම සඳහා රජය විසින් 2021 වසරේ සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. "ඔබට ගෙයක් රටට හෙටක්" යන තේමාව යටතේ නිවාස සංවර්ධනය සිදු කරනු ලබන අතර ඒ සඳහා 2021 වසර තුළ තවදුරටත් අතිරේකව ප්‍රතිපාදන සපයනු ලැබේ. නිවාස අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීමට පළමු මාස හතර තුළ රු.මිලියන 2,436 ක් වැය කර ඇති අතර ඉන් රු. මිලියන 1,510 ක් වැය කර ඇත්තේ ග්‍රාමීය, නාගරික, විරු සුමිතුරු සහ වකුගඩු රෝගයට ගොදුරු වූවන් ඇතුළු අඩු ආදායම්ලාභී පවුල් වලට නව නිවාස ඉදිකිරීම සඳහා වේ. එබැවින් වසංගත තත්ත්වය මධ්‍යයේ වර්ෂය තුළ නිවාස ඒකක 34,876 ක් ඉදිකිරීමේ ඉලක්කය සපුරා ගැනීම රජයේ අරමුණයි.

### නාගරික සංවර්ධනය

කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුව ද, රජයේ ප්‍රමුඛතම අරමුණක් වන තිරසාර නාගරික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් රජය දිගින් දිගටම නාගරික සංවර්ධන අංශය සඳහා වියදම් දරයි. නාගරික පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ සමුච්චිත රජයේ වියදම රු.මිලියන 4,868 කි. නාගරික සංවර්ධන අංශයේ මුළු වියදමෙන් රු. මිලියන 3,133 ක මුදලක් කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය, උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවර සහ ගාල්ල, යාපනය), වේරැස් ගඟ වැසිජල අපවහන සහ පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ පළාත් නවයෙහි නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත.

**2.17 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා මහා පරිමාණ නාගරික සංවර්ධන ව්‍යාපෘති වියදම්**

රු. මිලියන

| ව්‍යාපෘතිය | 2021 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|
| මහ කොළඹ නාගරික සංර්ධන ව්‍යාපෘතිය - (ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව) | 142 |
| පැලියගොඩ ප්‍රදේශයේ මැනිං වෙළෙඳ පළ ප්‍රතිෂ්ඨාපනය කිරීම | 6 |
| වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 6 |
| පළාත් නවය තුළ නගර සංවර්ධන ව්‍යාපෘතිය (සුඛිත පුරවර) | 233 |
| බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ සහ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 30 |
| හෝමාගම ප්‍රදේශයේ මාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම(තාක්ෂණික නගරය) | 45 |
| වේරැස් ගඟ වැසිජල අපවහන සහ පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 492 |
| බේරේ වැවේ ජලයේ ගුණාත්මක භාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම | 6 |
| මහ කොළඹ නාගරික සංර්ධන ව්‍යාපෘතිය - (ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව) | 359 |
| උපාය මාර්ගික නගර සංවර්ධනය කිරීම මහනුවර සහ ගාල්ල (ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව) | 626 |
| උපාය මාර්ගික නගර සංවර්ධනය කිරීම යාපනය (ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව) | 331 |
| උපාය මාර්ගික නගර සංවර්ධනය කිරීම අනුරාධපුර (ශ්‍රී ලංකා රජය ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය) | 2 |
| නාගරික පුනර්ජීවන වැඩසටහන | 1,092 |
| නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීම (ශ්‍රී ලංකා රජය/ ආසියානු සංවර්ධන බැංකුව) | 115 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2021 වසරේ පළමු මාස හතර තුළ භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලා ඒම් රු. බිලියන 459.1 ක් වූ අතර එය රු. බිලියන 550.8 ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 83.4 කි. මේ අතර 2021 වසරේ පළමු මාස හතර තුළ පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලා යාම් රු. බිලියන 1,022.7 ක් වූ අතර එය රු. බිලියන 1,077.9 ක් වූ ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 94.9 කි. මෙය 2020 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදයේ රු. බිලියන 897.9 සමඟ සැසඳීමේදී සියයට 13 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2021 වසරේ අප්‍රේල් 30 දිනට මුළු මුදල් හිඟය රු. බිලියන 563.6 ක් වූ අතර 2020 වසරේ අප්‍රේල් 30 දිනට පැවති රු. බිලියන 440.2 ට සාපේක්ෂව එය සියයට 28.0 වැඩිවීමකි. ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් සහ රාජ්‍ය ආයෝජන පිළිවෙලින් සියයට 8.8 කින් සහ සියයට 55.9 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහි ප්‍රතිඵලය වූයේ 2021 වසරේ අප්‍රේල් 30 දිනට සමස්ත මුදල් හා බැංකු ශේෂ හිඟය රු. බිලියන 620.5 ක් දක්වා වැඩිවීමයි. එය 2020 වසරේ අප්‍රේල් 30 දිනට රු. බිලියන 304.4 ක් විය.

**2.18 වගුව : 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්ව ප්‍රකාශය**

රු. බිලියන

| අයිතමය | ජනවාරි - අප්‍රේල් | | |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -274.3 | -488.2 | -488.2 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 457.7 | 550.8 | 459.1 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -800.2 | -892.0 | -870.4 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -97.7 | -185.9 | -152.3 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -440.2 | -527.1 | -563.6 |
| දල ණය ගැනීම් * | 629.9 | 733.4 | 732.5 |
| ණය ආපසු ගෙවීම් | -270.0 | -299.1 | -310.7 |
| ශුද්ධ ණය ගැනීම් | 359.9 | 434.3 | 421.8 |
| පෙර වසරේ ස්වෛරීත්ව බැඳුම්කර ශේෂය | 51.4 | - | - |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB / ශුද්ධ තැන්පතු යනාදිය) | -1.2 | - | 9.5 |
| අවසාන මුදල් ශේෂය | -304.4 | -581.0 | -620.5 |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
* භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2021 අප්‍රේල් 30 දින ගිවිසුම්ගත කරන ලද ව්‍යාපෘති/වැඩසටහන් ණය ඇතුළත් වේ.

## රාජ්‍ය ණය කළමණාකරනය


2021 වසරේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු ණය ගැනීම් සීමාව රු. බිලියන 2,997.0 වන අතර, 2021 වසරේ ජනවාරි 01 වනදා සිට අප්‍රේල් මස 30 වනදා දක්වා කාලය තුළ රජයේ ණය භාවිතය රු. බිලියන 732.5 කි. මෙම කාලය තුළ දී මුදල් ප්‍රවාහ මෙහෙයුම් හා සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා දේශීය හා විදේශීය වශයෙන් පිළිවෙලින් රු. බිලියන 608.3 ක සහ රු. බිලියන 124 ක මුළු ණය ලබාගෙන ඇත. 2021 වසරේ පළමු මාස හතර තුළ සියයට 83.1 ක්ම දේශීය ණය ගැනීම් වලින් සමන්විත විය. භාණ්ඩාගාර බැදුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර දේශීය ණය ගැනීමේ ප්‍රධාන ප්‍රභවයන් විය. ඒ අනුව 2021 වසරේ පළමු මාස හතර තුළ සමස්ත දේශීය ණය වලින් සියයට 67 ක් පමණ භාණ්ඩාගාර බැදුම්කර මගින් ලබාගෙන ඇති අතර සියයට 23 ක් භාණ්ඩාගාර බිල්පත් නියෝජනය කරන අතර තවත් සියයට 10 ක් ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබාගෙන ඇත. තවද, 2021 වසරේ පළමු කාර්තුවේ දී, විදේශ විනිමය කාලීන මූල්‍ය ණය පහසුකම් (FCTFF) මගින් ලැබුන මුදල විදේශ ණය සේවා ගෙවීම් සඳහා යොදාගන්නා ලදී. සමාලෝචනයට භාජනය වු කාලසීමාව අවසන් වන විට ශුද්ධ ණය ගැනීම රු. බිලියන 421.8 කි.

**2.19 වගුව : 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා දේශීය දළ ණය ගැනීම්**

| මූලාශ්‍රය | රු. බිලියන |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 404.5 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 142.3 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 45.1 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර | 16.4 |
| එකතුව | **608.3** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

2.3 රූප සටහන : දේශීය දළ ණය ගැනීම් (2021 ජනවාරි -අප්‍රේල්)




මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## භාණ්ඩාගාර ඇපකර මත වගකීම් හෙලිදරව් කිරීම

2021 වසරේ අප්‍රේල් 30 වන දිනට නිකුත්කල හා එදිනට පවතින භාණ්ඩාගාර ඇපකර වල වටිනාකම රු. බිලියන 1434.7 ක් වන අතර එය 2016 අංක 13 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ (වගකීම්) (සංශෝධන) පනතේ දෙවන වගන්තිය අනුව අදාළ සීමාව තුල වේ. 2021 වසරේ අප්‍රේල් 30 වන දිනට මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව වගු අංක 2.20 දක්වා ඇත.

**2.20 වගුව : මහා භාණ්ඩාගාරය විසින් 2021.04.30 දින දක්වා නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව**

| අනු අංකය | ආයතනයේ නම | බැංකුවේ හෝ ආයතනයේ නම | රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|
| 1 | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | හොංකොං සහ ෂැංහයි බැංකු සමාගම | 8,821.85 | **149,608.18** |
| | | හැටන් නැෂනල් බැංකුව | 4,000.00 | |
| | | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජනසීය (ජයිකා) | 136,786.32 | |
| 2 | ලංකා විදුලිබල මණ්ඩලය | ආසියානු සංවර්ධන බැංකුව | 92,939.55 | **140,334.10** |
| | | ලංකා බැංකුව | 5,000.00 | |
| | | ලංකා බැංකුව | 26,505.53 | |
| | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 7,500.00 | |
| | | සීමාසහිත චීන කර්මාන්ත හා වාණිජ බැංකුව | 8,389.02 | |
| 3 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ලංකා බැංකුව | 179,883.00 | **370,059.31** |
| | | මහජන බැංකුව | 181,427.00 | |
| | | සීමාසහිත චයිනා ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගම | 8,749.31 | |
| 4 | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | මහජන බැංකුව | 14,372.74 | **14,372.74** |
| 5 | ලංකා ධීවර සංස්ථාව | ලංකා බැංකුව | 350.00 | **350.00** |
| 6 | ඇල්කඩුව වැවිලි සමාගම | ලංකා බැංකුව | 30.00 | **30.00** |
| 7 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | ලංකා බැංකුව | 835.00 | **36,537.13** |
| | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 35,702.13 | |
| 8 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | ලංකා බැංකුව | 140.00 | **140.00** |
| 9 | ලක්දනව් ලිමිටඩ් | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,992.00 | **5,984.00** |
| | | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 2,992.00 | |
| 10 | සීමාසහිත ලංකා ගල් අඟුරු (පෞද්ගලික) සමාගම | මහජන බැංකුව | 11,000.00 | **11,000.00** |
| 11 | සී/ස ලංකා සතොස සමාගම | මහජන බැංකුව | 3,241.00 | **3,241.00** |

| අනු අංකය | ආයතනයේ නම | බැංකුවේ හෝ ආයතනයේ නම | රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|
| 12 | සීමාසහිත ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල | ලංකා බැංකුව | 8,600.00 | **8,600.00** |
| 13 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ලංකා බැංකුව | 57,510.89 | **229,780.62** |
| | | කොමර්ෂල් බැංකුව | 968.36 | |
| | | චීන සංවර්ධන | 12,485.22 | |
| | | ඩීඑෆ්සීසී බැංකුව | 6,026.24 | |
| | | ඉන්දියන් එක්සිම් බැංකුව | 51,306.63 | |
| | | හැටන් නැෂනල් බැංකුව | 13,460.20 | |
| | | අයි. එන්. ජී. බැංකුවල නෙදර්ලන්තය | 20,120.19 | |
| | | ජාතික සංවර්ධන බැංකුව | 17,380.43 | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 34,710.61 | |
| | | මහජන බැංකුව | 3,538.70 | |
| | | යුනිකෙඩිට් බැංකුව ඔස්ට්‍රියා ඒ.ජී. | 12,273.16 | |
| 14 | වී අලෙවි මණ්ඩලය | ලංකා බැංකුව | 1,000.00 | **1,942.95** |
| | | මහජන බැංකුව | 942.95 | |
| 15 | මාර්ග සංවර්ධන අධිකාරිය | ලංකා බැංකුව | 124,151.94 | **307,418.64** |
| | | කොමර්ෂල් බැංකුව | 4,755.93 | |
| | | ඩීඑෆ්සීසී බැංකුව | 5,896.51 | |
| | | හැටන් නැෂනල් බැංකුව | 20,133.15 | |
| | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 6,299.21 | |
| | | මහජන බැංකුව | 79,365.66 | |
| | | සම්පත් බැංකුව | 52,316.24 | |
| | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 14,500.00 | |
| 16 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | ලංකා බ | 3,500.00 | **3,500.00** |
| 17 | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | ලංකා බැංකුව | 1,000.00 | **1,000.00** |
| 18 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | ලංකා බැංකුව | 2,400.00 | **2,400.00** |
| 19 | නාගරික සංවර්ධන අධිකාරිය | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,770.00 | **4,959.88** |
| | | ලංකා බැංකුව | 2,189.88 | |

| අනු අංකය | ආයතනයේ නම | බැංකුවේ හෝ ආයතනයේ නම | රු. මිලියන | එකතුව රු. මිලියන |
| --- | --- | --- | --- | --- |
| 20 | වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම | හොංකොං සහ ෂැංහයි බැංකු සමාගම | 32,705.78 | **32,705.78** |
| 21 | නොර්ත්සි ලිමිටඩ් | ලංකා බැංකුව | 39.02 | |
| | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60.00 | **99.02** |
| 22 | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | චීන එක්සිම් බැංකුව | 17,719.47 | **17,719.47** |
| 23 | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | මහජන බැංකුව | 1,350.00 | **1,350.00** |
| 24 | සීමාසාහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | ලංකා බැංකුව | 500.00 | **500.00** |
| 25 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂන සංස්ථාව | 2,398.44 | **2,398.44** |
| | | ලංකා බැංකුව | 7,495.13 | |
| 26 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවය | මහජන බැංකුව | 9,922.84 | **52,395.21** |
| | | ඩීබී ට්‍රස්ටීස් (හොංකොං) ලිමිටඩ් | 34,977.25 | |
| 27 | ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව | ලංකා බැංකුව | 200.00 | **200.00** |
| 28 | ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව | ලංකා බැංකුව | 100.00 | **100.00** |
| 29 | ජාතික කඩදාසි සංස්ථාව | මහජන බැංකුව | 40.00 | **40.00** |
| 30 | ලංකා බැංකුව සහ මහජන බැංකුව | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව () | 35,976.60 | **35,976.60** |
| | මුළු වටිනාකම | | **1,434,743.08** | **1,434,743.08** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 3 වන පරිච්ඡේදය

# රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය

### සමාලෝචනය

ශ්‍රී ලංකාවේ රජය සතු ව්‍යාපාර සැපයුම් දාම, සැපයුම් සේවා, වෙළඳ, බලශක්ති, බැංකු, විදුලිය, ජලය, වරාය හා ගුවන් තොටුපොළ සහ ඖෂධ ආදී අංශවල ප්‍රධාන කාර්යභාරයක් අඛණ්ඩව සිදු කළ අතර, කොවිඩ් 19 වසංගත තත්ත්වය සඳහා ප්‍රතිචාර දැක්වීමේදී රජය සතු ව්‍යාපාරවල කර්යසාධනය අනෙකුත් කරුණු අතර ඉතා වැදගත් විය. ඒ අනුව, අඛණ්ඩව ඖෂධ සැපයුම හා නිෂ්පාදනය සහතික කිරීම හා 2021 වර්ෂයේ දී එන්නත් ආනයනය කිරීම මෙන්ම එන්නත් ශ්‍රී ලංකාව තුළ නිපදවීමද සැලසුම් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි සෘජු දායකත්වය, අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය අඛණ්ඩව ලබා දීම සහතික කරමින් සහ බාධාවකින් තොර සැපයුම් දාමයත් තහවුරු කරමින් ලංකා සතොස ආයතනය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පහසුකම් සැපයීම, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු රාජ්‍ය බැංකු පද්ධතිය ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා දඩ පොළීවලින් තොර ණය සහන කාල සීමාවන් ලබා දීම, මඟින් සහන සලසා ඇත.

2021 වර්ෂයේ මුල් මාස හතර තුළ රජය සතු ප්‍රධාන ව්‍යාපාර 52 හි අලාභය රු. බිලියන 13.4ක් ලෙස වාර්තා වී ඇත. රජය සතු ප්‍රධාන ව්‍යාපාර 52 න් ව්‍යාපාර 33 ක් රු. බිලියන 69.4 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර අනෙක් රජය සතු ව්‍යාපාර 19 විසින් රු. බිලියන 82.8 ක ශුද්ධ අලාභයක් 2021 වසරේ මුල් මාස හතර තුළ වාර්තා කර ඇත. එසේම, 2021 වසරේ මුල් මාස හතර තුළ, රජය සතු ව්‍යාපාර 19 ක් විසින් අයබදු හා ලාභාංශ වශයෙන් රු. බිලියන 6.84 ක් ප්‍රේෂණය කරමින් රජයේ බදු නොවන ආදායමට දායක වී ඇත.

### රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

රු. ට්‍රිලියන 3 ක වත්කම් පදනමක් සහිත ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වෙමින් 2020 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 2,983 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම, 2021 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 3,113 ක් දක්වා සියයට 4.3 කින් ඉහළ ගොස් ඇත. 2020 වසර අවසානය වන විට රු. බිලියන 2,475 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු ප්‍රමාණය 2021 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 2,528 ක් දක්වා සියයට 2.1 කින් වැඩි වී ඇත. 2020 වසර අවසන් වන විට සියයට 4.8 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය, 2021 අප්‍රේල් මස අවසානය වන විට සියයට 4.4 ක් දක්වා මද වශයෙන් හිතකර වර්ධනයක් පෙන්නුම් කරයි. 2020 සමස්ත මූල්‍ය වර්ෂය තුල වාර්තා කරන ලද රු. බිලියන 23.5 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2021 මුල් මාස හතර සඳහා ලංකා බැංකුව විසින් රු. බිලියන 19.6 ක බදු පෙර ලාභයක් වාර්තාකර ඇත

### මහජන බැංකුව

2020 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 2,230 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2021 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 2,420 ක් දක්වා සියයට 8.5 කින් වර්ධනය වී ඇත. 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,835 ක් වූ තැන්පතු ප්‍රමාණය 2021 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 2,031 ක් දක්වා වැඩි වී ඇත. එසේම, 2020 වර්ෂය අවසානය වන විට පැවැති රු. බිලියන 1,723 ක් වූ ණය කළඹේ වටිනාකම 2021 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 1,904 ක් දක්වා සියයට 10.5 කින් ඉහළ ගොස් ඇත. 2020 වර්ෂය අවසානය වන විට සියයට 3.2 ක් වූ අක්‍රීය ණය අනුපාතය 2021 අප්‍රේල් මස අවසානය වන විට සියයට 3.0 ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. 2020 වසරේ සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 6.8 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2021 අප්‍රේල් මාසය දක්වා මුල් මාස හතර තුළ මහජන බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 8.0 ක් ලෙස වාර්තා වී ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2020 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 1,364ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම, 2021 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 1,451 ක් දක්වා සියයට 6.3 කින් වර්ධනය වී ඇත. 2020 වසර අවසානය වන විට රු. බිලියන 1,237 ක් වූ තැන්පතු පදනම 2021 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 1,320 ක් දක්වා වැඩි වී ඇත. 2020 වසර අවසානය වන විට පැවැති රු. බිලියන 517 ක් වූ ණය කළඹ 2021 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 502 ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. 2020 සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 3.9 ක් වූ

බදු පෙර ලාභය හා සසඳන විට 2021 මුල් මාස හතරක කාලය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 10.6 ක් ලෙස වාර්තා කර ඇත.

### සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2020 වර්ෂයේ සමගාමී කාල පරිච්ඡේදය තුල වාර්තා කරන ලද රු. බිලියන 13.0 ක් වූ සමස්ත ආදායම රු. බිලියන 19.1 ක් දක්වා සියයට 47 කින් ඉහළ ගොස් ඇති අතර 2021 වර්ෂයේ මුල් මාස හතර තුල වාර්තා කරන ලද බදු පෙර ලාභය රු. බිලියන 7.5 ක් වේ. 2021 වර්ෂයේ මුල් මාස හතර තුල පැවති හිතකර වෙළඳපොල තත්ත්වය හේතුවෙන් 2021 අප්‍රේල් මාසය අවසානය වන විට ආයතනයේ වත්කම් පදනම රු. බිලියන 243 ක් දක්වා වර්ධනය වී ඇත. සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එහි පරිපාලිත සමාගමක් වන කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන ග්‍රෑන්ඩ් හයට් හෝටල් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා රු. බිලියන 2 ක ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජනයක් 2021 මැයි මාසයේ දී සිදු කරන ලදී.

### ලංකා විදුලිබල මණ්ඩලය

විදුලිය සඳහා වන ඉල්ලුම 2021 මුල් මාස හතර තුළදී ගිගාවොට් පැය 4,949 දක්වා සියයට 23 කින් වැඩි වී ඇති අතර 2020 වර්ෂයේ එම කාලය තුළ ගිගාවොට් පැය 4,026 ක ඉල්ලුම හා සසඳන විට මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ එම කාලසීමාව තුළ සංචරණ සීමාවන් ලිහිල් කිරීමෙන් කර්මාන්ත, පොදු සේවාවන් සහ හෝටල් අංශ සඳහා වන ඉල්ලුම වැඩිවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 පළමු මාස හතරක කාලය තුළදී රු. මිලියන 67,213 ක් වූ විදුලිය අලෙවියෙන් ලද ආදායම 2021 දී රු. මිලියන 80,529 ක් දක්වා සියයට 20 කින් වැඩි වී ඇත. තවද, මෙම කාල පරිච්ඡේදය තුළදී රු. මිලියන 25,994 ක් වූ මුළු අලාභය රු. මිලියන 7,515 දක්වා අඩුකර ගැනීමටද ලංකා විදුලිබල මණ්ඩලයට හැකිවී ඇත. මේ අතර 2020 වර්ෂයේ මෙම කාලය තුළ ජලඃ තාප (ඉන්ධන)ඃ තාප (ගල් අඟුරු) ඃ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (එන්.සී.ආර්.ඊ) 19ඃ34ඃ40ඃ7 සිට 18ඃ29ඃ44ඃ9 දක්වා උත්පාදක මිශ්‍රණයේ සිදුකරන ලද වාසිදායක වෙනස්කම් හේතුවෙන් 2020 දී එම කාලසීමාව තුළ වාර්තා වූ කිලෝවොට් පැයකට රු. 23.74 ක් වූ විකණුම් කාලය තුළ ඒකකයක පිරිවැය වාර්තාගත කාලසීමාව සඳහා කිලෝවොට් පැයකට රු. 18.29 ක් දක්වා අඩු වී ඇත.

2021 අප්‍රේල් මස අවසන් වන විට ව්‍යාපෘති ණය ඇතුළු ගෙවිය යුතු මුළු බැඳීම් රු. මිලියන 371,299 ක් වූ අතර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා නිසා රාජ්‍ය බැංකුවලට ගෙවිය යුතු හිඟ මුදල රු. මිලියන 107,219 කි. කෙසේ නමුත්, ලංකා ඛනිජ තෙල් සංස්ථාවට සහ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ට 2020 වසර අවසන් වන විට ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 133,365 සිට 2021 අප්‍රේල් මස අවසන් වන විට රු. මිලියන 126,869 දක්වා අඩු වී ඇත.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2020 වසරේ සමගාමී කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ පළමු මාස හතරේ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම මෙට්‍රික් ටොන් මිලියන 2ක් දක්වා සියයට 7 කින් ඉහළ ගොස් තිබේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙට්‍රික් ටොන් මිලියන 1.78 ක් වූ 2021 වසරේ පළමු මාස හතර සඳහා ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කරන ප්‍රමාණය, 2020 වසරේ එම කාල පරිච්ඡේදයේම මෙට්‍රික් ටොන් මිලියන 1.48 ට සාපේක්ෂව සියයට 20 ක වැඩි වීමකි. 2021 වසරේ පළමු මාස හතර තුළ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක ජාත්‍යන්තර මිල ඇ.ඩො. 66 දක්වා සියයට 29 කින් ඉහළ ගොස් තිබේ. අවසානයේදී, 2021 වසරේ පළමු මාස හතර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය ඇ.ඩො. මිලියන 894 ක් විය. මෙය 2020 වර්ෂයේ එම කාලය තුළ ඇ.ඩො. මිලියන 699 ක ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනයට සාපේක්ෂව සියයට 28 ක වැඩිවීමකි.

මෙම සන්දර්භය තුළ, ස්ථාවර මිලක් අඛණ්ඩව පැවතීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනයට වූ අහිතකර බලපෑම, 2021 පළමු මාස 4 තුළ රු. බිලියන 8.2 ක දළ අලාභය 2020 වසරේ එම කාලය තුළ වාර්තා වූ රු. බිලියන 8.4 ක් වූ දළ ලාභය හා සංසන්දනයේ දී පැහැදිලි වේ. මෙම තත්ත්වය හේතුවෙන් 2021 අප්‍රේල් මස අවසානයේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු. බිලියන 45.3 ක ශුද්ධ අලාභයක් වාර්තා කරන ලදී. ඒ අතරම, ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රීලංකන් ගුවන් සේවය වැනි විවිධ රාජ්‍ය ව්‍යාපාරවලින් 2021 අප්‍රේල් මස අවසානය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබිය යුතු මුදල රු. මිලියන 149,602 ක් වේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රඳවාගත් ඉපැයීම 2021 අප්‍රේල් මස අවසන් වන විට සෘණ රු. බිලියන 382 ක් ලෙස වාර්තා වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රජයේ වාණිජ බැංකු දෙක වෙත 2020 වසර අවසානයෙදී ගෙවිය යුතුව තිබූ රු. බිලියන 529 ක ණය මුදල 2021 අප්‍රේල් මාසය අවසන් වන විට රු. බිලියන 670 දක්වා වැඩි විය. ඉහත තත්ත්වයන් සහ අනෙකුත් සාධක සලකා බැලීමෙන්, රජය විසින් 2021 ජුනි 12 වන දින සිට බල පැවැත්වෙන පරිදි ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ඉහළ දැමීමට කටයුතු කරන ලදී. මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විදේශ වෙළඳපොළෙන් ඇ.ඩො. බිලියනයක දිගුකාලීන ප්‍රති

මූල්‍ය පහසුකමක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බලමින් සිටී. එසේම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නව ව්‍යාපාර ආකෘතියක් සමඟ නැව් තෙල් ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමට සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස බැරල් 100,000 ක ධාරිතාවයකින් යුත් නව තෙල් පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරයි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

2021 වසරේ මුල් මාස හතර තුළ රජය වරාය ආශ්‍රිත විශාල යටිතල පහසුකම් සංවර්ධන වැඩ පිළිවෙළක් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර බහලුම් පර්යන්තයේ සංවර්ධන කටයුතු ද බටහිර බහලුම් පර්යන්තයේ සංවර්ධන කටයුතු ද පෞද්ගලික අංශයේ සහය ඇතිව ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. ඉදිරි වසර පහ තුළ නැගෙනහිර බහලුම් පර්යන්තයේ සහ බටහිර බහලුම් පර්යන්තයේ සංවර්ධන කටයුතු සමගාමීව ක්‍රියාත්මක කිරීමටත්, ජාත්‍යන්තර නාවික වෙළඳාම තුළ වර්ධනය වෙමින් පවතින ඉල්ලුමට අවශ්‍ය සැපයුම ලබා දීම සඳහා 2025 වසරේ සිට එම පර්යන්ත සම්පූර්ණ මෙහෙයුම් තත්ත්වයට ගෙන ඒම සඳහාත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කටයුතු කරමින් පවතී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාප්ති වැඩසටහනේ ප්‍රතිඵලයක් වශයෙන් ඉන්ධන සැපයීම, ගබඩා අංගන හා ගබඩා පහසුකම් සැපයීම, නැව් තැනීම හා අළුත්වැඩියා කිරීම, රක්ෂණය, බැංකුකරණය සහ වෙනත් සේවාවන් ආදී අතිරේක කර්මාන්ත හඳුන්වාදීම හා වර්ධනය සිදු වනු ඇත. ආර්ථිකයට අගය එකතු කිරීමටත් සඵලදායීත්වය වර්ධනය කිරීමටත් උපකාරී වන ඍජු හා වක්‍ර සේවා නියුක්තිය වර්ධනය සහ තාක්ෂණ හුවමාරුව යනාදිය මඟින් මූල්‍ය හා සමාජීය වශයෙන් මධ්‍යකාලීන ප්‍රතිලාභ මෙමඟින් ලබා දෙනු ඇත.

2021 වසරේ මුල් මාස හතර තුළ, භාණ්ඩ හා වෙනත් නැව් සහ යාත්‍රා 1,303 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවනු ලබන කොළඹ, ත්‍රිකුණාමලය සහ ගාල්ල යන වරායන් වෙත පැමිණ ඇති අතර, එය 2020 වසරේ සමගාමී කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 35 ක වර්ධනයක් පෙන්නුම් කිරීමකි. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමස්ත අඩි විස්සේ සම ඒකක බහාලුම් (TEUs) ඒකක 700,000 ක් හසුරුවා ඇති අතර එය 2021 වසරේ මුල් මාස හතර තුළ සියයට 35 ක වැඩිවීමකි.

නාවික කටයුතු, බහාලුම් හැසිරවීම්, වාප්පු මෙහෙයුම්, වරාය පහසුකම් සැපයීම හා වෙනත් සේවා මෙහෙයුම් මඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විකුණුම් ආදායම් උපයනු ලබයි. 2021 වසරේ මුල් මාස හතර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් උපයන ලද මිලියන 17,024 ක ආදායම, 2020 වසරේ සමගාමී කාල පරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 23 ක වර්ධනයක් පෙන්නුම් කරන අතර, වාර්තා කරන ලද රු. මිලියන 10,549 ක සමස්ත වියදම්ද සියයට 10 කින් වර්ධනය වී ඇත. ඒ අනුව, 2021 වර්ෂයේ මුල් මාස හතර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රු. මිලියන 4,993ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර 2020 වසරේ සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. මිලියන 4,675 ක බදු පෙර ලාභය හා සැසඳීමේ දී එය සියයට 7 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 වසරේ අප්‍රේල් මස අවසන් වන විට ආයතනයේ විදේශීය හා දේශීය ණය ප්‍රමාණය පිළිවෙළින් රු. මිලියන 55,096 ක් සහ රු. මිලියන 8,795 ක් විය.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2025 වර්ෂයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉලක්ක සපුරා ගැනීමේදී සහ "සැමට ජලය" සඳහා වන රජයේ දැක්ම සපුරාලීම සඳහා 2020 වර්ෂයේ නල ජලය සහ සුරක්ෂිත පානීය ජල සැපයුම් ආවරණය පිළිවෙලින් සියයට 51.9 ක් සහ සියයට 92.0 ක් වූ අතර එය 2021 වර්ෂයේ පළමු මාස හතර තුළ පිළිවෙලින් සියයට 53.7 ක් සහ සියයට 93.8 ක් දක්වා වැඩි කරගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් විය.

මෙම කාල පරිච්ඡේදය තුළදී පද්ධතියට නව සම්බන්ධතා 21,000 ක් එක් කරමින් විදේශ අරමුදල් මත සිදු කළ මහා පරිමාණ ව්‍යාපෘති 02 ක් සම්පූර්ණ කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් විය. එබැවින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම 2020 වර්ෂයේ සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු මිලියන 8,115 ට සාපෙක්ෂව 2021 වර්ෂයේ පළමු මාස හතර තුළ දී මිලියන 8,327 දක්වා සියයට 3 කින් ඉහළ යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂයේ සමගාමී කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. මිලියන 36 ක් වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව 2021 වසරේ මුල් මාස හතර තුළ දී රු. මිලියන 117 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් වී ඇත. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් 2021 වර්ෂයේ පළමු මාස 04 සඳහා රු. මිලියන 209 ක සමස්ත අලාභයක් ලැබූ අතර 2020 වර්ෂයේ එම කාලය තුළ රු. මිලියන 143 ක ලාභයක් වාර්තා කර ඇත.

මේ අතර, 2021 වර්ෂයේ මුල් මාස හතර තුළ ජල නිෂ්පාදනය සහ ජල අලෙවිය පිළිවෙළින් සියයට 3 කින් සහ සියයට 7 කින් ඉහළ ගොස් ඇති අතර එය පිළිවෙලින් ඝන මීටර් මිලියන 265 ක් සහ ඝන මීටර් මිලියන 200 ක් විය. තවද, මහ කොළඹ අපජල ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ආදායම් නොවන ජල පරිහරණය පෙර වසරට වඩා අඩු වී තිබේ.

### ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම

කොවිඩ් 19 වසංගතයේ බලපෑම අවම කිරීම සඳහා හඳුන්වා දී ඇති ක්‍රියාමාර්ග ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමෙහි මූල්‍ය තත්ත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ පළමු කාර්තුවේ සමස්ත අලාභය මිලියන 1,792 ක් වූ අතර, එම කාර්තුවේ දී හසුරුවන ලද ගුවන් මගීන් සංඛ්‍යාව 119,742 ක් පමණක් විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි 2 වන පර්යන්තය ස්මාර්ට් ගුවන් තොටුපොළ සංකල්පය භාවිතයෙන් ඉදි කිරීමට නියමිත අතර වසර 3 ක් තුළ ඉදිකිරීම් කටයුතු නිමාවීමෙන් පසු දේශීය හා ජාත්‍යන්තර සංචාරකයන්ට සුවපහසු සංචාරක අත්දැකීමක් ලබා දීමට ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමට අවස්ථාව ලැබෙනු ඇත. බහු-මහල් වාහන නැවැත්වීමේ ස්ථාන, නව ගුවන් තොටුපොළ විවේකාග ාර, ගේට්ටු විවේකාගාර, ජාලගත බහු මාදිලියේ ප්‍රවාහන පද්ධති සහ වෙනත් පහසුකම් ගුවන් මගීන්ගේ පහසුව හා සංතුෂ්ටිය වැඩි දියුණු කරනු ඇත. නව පර්යන්තයේ මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 180,900 ක් වන අතර එය පර්යන්තය සමග ඒකාබද්ධ වන විට වර්ග මීටර් 270,900 ක් දක්වා විශාල වේ. නව පිරික්සුම් කවුළු 96 ක් එකතු කිරීමත් සමග මගී පිරික්සුම් කවුළු ගණන 149 දක්වා ඉහළ යනු ඇත. මීට අමතරව පිටවීමේ ගමන් බලපත්‍ර පාලක කවුන්ටර් 32 ක් පැමිණීමේ ගමන් බලපත්‍ර පාලක කවුන්ටර් 56 ක්, සම්බන්ධතා දොරටු 16 ක්, බස් ගේට්ටු 10 ක්, ගුවන් ගමන් විවේකාගාර 6 ක්, ගමන් මලු ලබා ගන්නා ස්ථාන 7 ක්, ගමන් මලු සැකසීමේ ස්ථාන 7 ක් සහ ගුවන් යානා නැවැත්වීමේ ස්ථාන 23 - 28 අතර ප්‍රමාණයක් නව පර්යන්තය තුළ පිහිටුවීමට නියමිතය.

### ශ්‍රී ලංකන් ගුවන් සමාගම

2020 වසරේ දී කොවිඩ් 19 වසංගතයත් සමග ගුවන් සේවා කර්මාන්තයේ මෙහෙයුම් පරිසරය මුළුමනින්ම වෙනස් විය. වර්තමානය වන විට එම වසංගතයේ බරපතලකම වැඩිවීම ශ්‍රී ලංකාවට ගුවන් මගීන් පැමිණීම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. බොහෝ රටවල් විසින් මෙම සංචරණ සීමා පැනවීම හේතුවෙන් ඉන්දියාව, මැදපෙරදිග හා ඈත පෙරදිග වැනි ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන වෙළෙඳ පොළ ද බලපෑමට ලක් වී ඇත. මෙසේ 2020 වසරේ දී ලොව පුරා පැනවූ දේශසීමා සංචරණ හේතුවෙන් ගුවන් සේවාවන්හි සාම්ප්‍රදායික ව්‍යාපාරය වූ ගුවන් මගී ප්‍රවාහනය සීමාකාරී තත්ත්වයකට පත්වූ අතර එය 2021 වසර තුළ ද ක්‍රියාත්මක වෙමින් පවතී. එම නිසා භාණ්ඩ ප්‍රවාහනය ගුවන් ගමන්හි ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වී ඇත. ඒ අනුව, 2021 වසරේ මුල් මාස හතර තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් විශේෂිත භාණ්ඩ ප්‍රවාහන කාලසටහනක් හඳුන්වා දුන් අතර පුළුල් බඳ ගුවන් යානයක් ඒ සඳහා සකස් කර ඇත. මූලිකවම භාණ්ඩ ඉල්ලුම මත පදනම්ව නව මාර්ග 6 ක් හඳුන්වා දී ඇති අතර තවදුරටත් නව ගුවන් යානා හා නව ගමන් මාර්ග යොදා ගනිමින් භාණ්ඩ ප්‍රවාහනය වැඩි කිරීමට සැලසුම් සකස් කර ඇත. වර්තමානයේදී ගුවන් ගමන් කර්මාන්තය එහි බරපතලම බේදවාචකයට මුහුණ දී ඇති අතර එම අර්බුදයේ සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා පිරිවැය ව්‍යුහය ප්‍රශස්ත කිරීම, විලම්බිත ගෙවුම් සැලසුම් හා සහන ලබා ගැනීම පිළිබඳව ප්‍රධාන සැපයුම්කරුවන් සමග සාකච්ඡා කිරීම වැනි පියවර ගැනීම මගින් ද්‍රවශීලතාව රැක ගැනීමට ශ්‍රීලංකන් ගුවන් සමාගම කටයුතු කර ඇත. එසේ කරන අතරම අඛණ්ඩව නව ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කර ගැනීම කෙරෙහි ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් අවධානය යොමුකර ඇති අතර පිරිවැය ඉතිරි කර ගැනීමේ ක්‍රම ද අනුගමනය කරමින් සිටී.

පිරිවැය ප්‍රශස්ත කිරීම සඳහා ගනු ලබන පියවර තුළට, ගුවන් යානා බදු කුළිය ස්ථිරවම වාර්ෂිකව ඇ.ඩො. මිලියන 27.5 කින් අඩු කිරීමට හේතු වූ ගුවන් යානා කල්බදු ගිවිසුම් ප්‍රතිව්‍යුහගත කිරීම හා සමාගමේ ද්‍රවශීලතාව කෙරෙහි බලපාන ගෙවුම් කල් දැමීම ඇතුළත්ය.

ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමය, දීමනා ප්‍රතිව්‍යුහගත කිරීම, සියයට 2.5 සිට සියයට 25 දක්වා අනිවාර්ය වැටුප් අඩු කිරීම, වැටුප් වර්ධක/බඳවා ගැනීම් සීමා කිරීම ඇතුළු විවිධ ක්‍රියාමාර්ග තුළින් කාර්යය මණ්ඩල පිරිවැය ප්‍රශස්තකරණය කිරීම වර්තමාන තත්ත්වය යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සියලු සාමූහික ගිවිසුම් 2021 වර්ෂය තුළ ප්‍රතික්ෂේප කරන ලදී.

නව කොටස් ප්‍රාග්ධනය සැපයීම මගින් රජය දිගින් දිගටම ශ්‍රී ලංකන් ගුවන් සමාගමට සහයෝගය ලබා දී ඇත. මෙය 2014 වර්ෂයෙන් පසු ශ්‍රීලංකන් ගුවන් සමාගමට ලබාදුන් පළමු ප්‍රාග්ධන සැපයුම වන අතර 2020 නොවැම්බර් මාසයේදී රු. බිලියන 27.7 ක් සහ 2021 අප්‍රේල් මාසයේ දී රු. බිලියන 18 ක් වශයෙන් ලබා දී ඇත. 2020 ඔක්තෝබර් 26 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇ.ඩො. මිලියන 500 ක ප්‍රාග්ධනීකරණ වැඩසටහනේ කොටසක් ලෙස මෙය ක්‍රියාත්මකය.

තවද, මෙම කාලය තුළ දී කල් ඉකුත් වූ, කෙටි කාලීන ණය සඳහා රාජ්‍ය බැංකු දෙකට ලබා දී තිබූ ඇ.ඩො. මිලියන 205.4 ක සහ රු. බිලියන 27.6 ක වටිනාකමෙන් යුත් සහන ලිපි නැවත නිකුත් කිරීමට මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දෙන ලදී. එසේම, 2021 වසර තුළදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව ලබා දුන් භාණ්ඩාගාර ඇපකර මත පදනම්ව කාරක ප්‍රාග්ධන කටයුතු සඳහා රාජ්‍ය බැංකු දෙක විසින් ඇ.ඩො. මිලියන 75 ක වටිනාකමින් යුත් නව පහසුකම් සලසා ඇත.

2021 මාර්තු 31 වන විට ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් රු.මිලියන 372,015.25 ක සමුච්චිත අලාභයක් සහිතව 2020-2021 වර්ෂය සඳහා රු.මිලියන 45,162.76 ක අලාභයක් වාර්තා කර ඇත. තවද, රු. මිලියන 221,254.34 කින් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ජංගම වගකීම් දැනට පවතින ජංගම වත්කම් ඉක්මවා ඇති අතර, වාර්තා කරන දිනය වන විට සමාග මේ මුළු හිමිකම ඍණ රු.මිලියන 289,546.99 කි. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු වන අතර එමඟින් සමාගම බරපතල ප්‍රාග්ධන හායනයකට ලක් වී ඇත. එම නිසා ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් වන තුරු මූල්‍ය සහාය ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව රජය විසින් එම සමාගමේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමේ ලිපියක් නිකුත් කර ඇත.

වගුව 3.1 : රජය සතු ප්‍රධාන ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ/ප්‍රධාන පියවර

| ආයතනය | ප්‍රතිසංස්කරණ/ප්‍රධාන පියවර |
|---|---|
| රාජ්‍ය බැංකු: (ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) | • ණය කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ සුපරීක්ෂණය සහ නැවත අයකරගැනීම වර්ධනය කිරීම<br>• අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන රාමුව ශක්තිමත් කිරීම.<br>• පවත්නා වසංගත තත්වය යටතේ ජංගම දුරකථන සහ වෙනත් ඩිජිටල් යෙදුම් භාවිතා කිරීම තුළින් පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සඳහා තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.<br>• පවත්නා ගනුදෙනුකරුවන් වෙත සහය දීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව නිෂ්පාදන වැඩි දියුණු කිරීම<br>• කොවිඩ්-19 වසංගතයේ 3 වන රැල්ල මධ්‍යයේ වුවද ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ බැංකු සේවා සහතික කිරීම.<br>• වසංගතය තත්වයන් යටතේ පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන් සඳහා සහන සලසා දීම වෙනුවෙන් නව සහනදායී මූල්‍ය පැකේජයන් යොදා ගැනීම. |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | • ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා ඇ. ඩො. බිලියන 1.0 ක දිගුකාලීන ප්‍රතිමූල්‍යකරණ පහසුකමක් ලබා ගැනීමට<br>• සපුගස්කන්දෙහි යෝජිත නව තෙල් පිරිපහදුව සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීම |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | • ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Adani Port and Special Economic Zone Ltd සහ ඔවුන්ගේ දේශීය හවුල්කරු වන ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී යන ආයතන විසින් වසර 35ක් දක්වා බටහිර බහාලුම් පර්යන්තය ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, පැවරීම පදනම (BOT) යටතේ පොදු-පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස සංවර්ධනය කිරීමට මූලික පියවර ගෙන තිබේ.<br>• ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැගෙනහිර බහාලුම් පර්යන්තය අදියර වශයෙන් සංවර්ධනය කිරීමටත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියට පූර්ණ අයිතිය සතු බහාලුම් පර්යන්තයක් ලෙස ක්‍රියාත්මක කිරීමටත් පියවර ගනිමින් සිටී. පර්යන්තයේ සිවිල් වැඩ කටයුතු සඳහා ව්‍යුහාත්මක සැලසුම සහ ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම සිදු වෙමින් පවතී.<br>• යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවමින් පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව සංචාරක හා වාණිජ කටයුතු සඳහා කලාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කටයුතු කරමින් සිටියි.<br>• ශ්‍රී ලංකා වරාය අධිකාරිය වරාය ප්‍රජා පද්ධතියක් (Port Community System) ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. වරාය ප්‍රජා පද්ධතියක් යනු වරාය අංශයේ ව්‍යාපාර ක්‍රියාවලිය තුළ සම්බන්ධතාවය සපුරාලීම සඳහා ස්වාධීනව සපයන මෘදුකාංග විසඳුමක් වන අතර, එය ව්‍යාපාරික චක්‍ර ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා අදාළ ගනුදෙනු පමණක් තල්ලු කිරීමට හෝ ඇදීමට පොදු අතුරු මුහුණතක් භාවිතා කරනු ලබන නව තොරතුරු පද්ධති යෙදවුමක් නිර්මාණය කරනු ඇත. |
| සීමා සහිත ලංකා සීනි සමාගම | • කර්මාන්තශාලා ධාරිතාවය ඉහල නැංවීම සහ උක් වගාව වැඩි දියුණු කිරීම මඟින් සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම උදෙසා ක්‍රියාමාර්ග ගනු ලබමින් පවතී. |

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

වගුව 3.2 : ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52හි ලාභදායීත්වය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යාපාරය | 2019* | 2020 * | 2021.04.30 දක්වා* |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 29,685 | 23,552 | 19,656 |
| 2 | මහජන බැංකුව | 19,666 | 21,227 | 8,055 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 10,462 | 15,645 | 10,567 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 465 | 587 | 192 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 774 | 978 | 433 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,222 | 1,586 | -88 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 29,761 | 32,500 | 10,668 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 19,865 | 23,663 | 7,460 |
| 9 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 3,009 | 9,015 | 3,029 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 253 | 265 | 86 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 627 | 1,257 | 138 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -85,411 | -62,561 | -7,515 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | -11,836 | 2,371 | -45,304 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 16,155 | 20,327 | 4,993 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | -1,111 | 663 | -209 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම** | 15,223 | -3,748 | -1,792 |
| 17 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම | -47,198 | -45,162 | -24,800 |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 1,890 | -2,383 | -1,090 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -976 | -997 | -369 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 340 | 261 | 16 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | -844 | -243 | 39 |
| 22 | සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම** | -619 | 417 | 80 |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය** | -362 | 6 | 31 |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -330 | -150 | -41 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -757 | -350 | -97 |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 120 | 214 | 135 |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 64 | 283 | 135 |
| 28 | සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | -53 | 43 | 9 |
| 29 | ශ්‍රී ලංකා කපු සංස්ථාව | 43 | 15 | 1 |
| 30 | සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 1,982 | 69 | 406 |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම** | 21 | 66 | 39 |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 21 | 1 | 12 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,897 | 2,994 | 1,500 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,323 | 1,435 | 635 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 592 | 1,164 | 266 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 3 | 9 | 1 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2,176 | 2,546 | 229 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | -94 | 174 | -41 |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -571 | -213 | -132 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -501 | -234 | -65 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -101 | -28 | 5.9 |
| 42 | සීමාසහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 99 | -98 | -211 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 317 | 464 | 132 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | -27 | -120 | 43 |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම** | -2,982 | -1,381 | 355 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -169 | 23 | -285 |
| 47 | ලංකා ධීවර සංස්ථාව** | -100 | -48 | -4 |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | -71 | -109 | -61 |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම** | 189 | 268 | 12 |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම** | 306 | 241 | 43 |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | -312 | -892 | -310 |
| 52 | සීමාසහිත ලංකා සීනි සමාගම | -1,304 | 1,171 | -369 |
| | **එකතුව** | **3,821** | **46,783** | **-13,381** |

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

* කෙටුම්පත්

** ලාභය 2021.03.31 දිනට (2021 ජනවාරි සිට මාර්තු දක්වා)

වගුව 3.3 : රාජ්‍ය ව්‍යාපාර වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම

රු මිලියන

| රාජ්‍ය ව්‍යාපාරය | 2019 | 2020 | 2021.04.30 දක්වා |
|---|---|---|---|
| අයබදු | **22,634** | **14,769** | **4,296** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,000 | 1,000 | 1,500 |
| ලංකා බැංකුව | – | 1,250 | - |
| මහජන බැංකුව | 2,200 | 2,500 | 500 |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 8,950 | 5,000 | 2,000 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 169 | - | - |
| රාජ්‍ය දව සංස්ථාව | 50 | - | - |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 3,268 | 782 | - |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2,300 | - | - |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 25 | - | - |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 250 | 156 | 200 |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 53 | - | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 15 | - | - |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | 25 | - | - |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 500 | - | - |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 800 | - | - |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 200 | - | - |
| ශ්‍රී ලංකා විදේශ සේවා හා නියුක්ති කාර්යාංශය | 650 | - | - |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 50 | - | - |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 200 | - | - |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | 29 | - | - |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 900 | - | - |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 28.88 | 81 | 80 |
| ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය | - | - | 16 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | - | 4,000 | - |
| ලාභාංශ | **5,025** | **2, 855** | **2,542** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 30 |
| ලංකා බැංකුව | 346 | 347 | 173 |
| මහජන බැංකුව | 316 | 316 | 158 |
| සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව | 0.8 | 1 | 1 |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,720 | 695 | - |
| සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම | 500 | - | - |
| සීමාසහිත ලංකා ඛණිජ වැලි සමාගම | 130 | - | 300 |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 7 | - | 5 |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 13 | 2 | - |
| සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | 37 | - | - |
| සීමාසහිත මාන්තායි සෝල්ට් සමාගම | – | 2 | 1 |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 15 | 304 | - |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | - | - |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | – | 10 | - |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 947 | 947 | 1,331 |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 133 | - | 159 |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | 501 | - | 327 |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | 82 | - |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 23 | 77 | 24 |
| සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සමාගම | – | - | 1 |
| වැවිලි සමාගම් | 172 | 12 | 32 |
| වෙනත් | 12 | - | - |
| එකතුව | **27,659** | **17,624** | **6,838** |

මූලාශ්‍රඃ රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

## 4 වන පරිච්ඡේදය

# විදේශ මූල්‍යයනය

විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම සඳහා 2020 වර්ෂයේදී නව්‍යකරණය කරන ලද ප්‍රතිපත්තිවලට අනුව, ණය නොවන ව්‍යාපෘති දිරිගැන්වීමට සමගාමීව ණය අඩු කිරීම සඳහා රජය විසින් ඉදිරියේදී අත්සන් කිරීමට නියමිත ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය නැවත සලකා බලන ලදී. ඒ අනුව, 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයේ දී රජය ජල සම්පත් කළමනාකරණය හා අධික වාහන තදබදය සහිත ප්‍රදේශයන්හි ගුවන් පාලම් දෙකක් ඉදිකිරීම සඳහා විදේශ ණය ලබා ගන්නා ලදි. ඊට අමතරව රජය විසින් ගෙවුම් ශේෂ කළමනාකරණ සඳහා විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් ලෙස ඇ.එ.ජ. ඩොල(ර්) මිලියන 500 ක් ලබාගෙන ඇත.

### 4.1 විදේශ මූල්‍යයන එකඟතා

රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා අවශ්‍ය විදේශ මූල්‍යයනයන් සම්පාදනය කිරීම වෙනුවෙන් රජය විවිධ විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා ණය දෙන ආයතන සමග 2021 වර්ෂයේ පළමු මාස 4 දී විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 4 ක් මගින් එ.ජ. ඩොල(ර්) මිලියන 633.78 ක එකඟතා ඇතිකරගෙන ඇත. මෙයින් එ.ජ. ඩොල(ර්) මිලියන 500 ක් ගෙවුම් ශේෂ කළමනාකරණ සහාය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා ගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමකින් ද, ඉතිරි එ.ජ. ඩොල(ර්) මිලියන 58.08 ක ප්‍රමාණය ලෝක බැංකුව මගින් මූල්‍යනය වන ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘති දෙකක් සඳහා හා එ.ජ.ඩොල(ර්) මිලියන 60.96 ක ප්‍රමාණය හංගේරියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය වන කොහුවල හා ගැටඹේ ඉදිකරනු ලබන ගුවන් පාලම් ව්‍යාපෘතීන් ද සමන්විත වේ. 2021 වර්ෂයේ පළමු කාර්තුවේ දී එකඟතා ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රගතිය සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වය බලපාන ලදි.

වගුව 4.1: 2021 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාළ මූල්‍ය කොන්දේසි සමග

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | එ.ජ.ඩො | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| ද්විපාර්ශ්වික | | | | | | | | | | | | | |
| චීන සංවර්ධන බැංකුව | ණය | 4/12/2021 | විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම 2021 | එ.ජ. ඩො | 500 | 99,955.00 | 500 | විචල්‍ය | ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය | 2.51 | මූලික ගෙවීම 1.25% | 3 | 10 |
| බහුපාර්ශ්වික | | | | | | | | | | | | | |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 4/22/2021 | ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය - සහනදායී ණය | විශේෂ ගැනුම් හිමිකම් | 31.38 | 8851.61 | 31.38 | ස්ථාවර | _ | 1.25 | සේවා ගාස්තු 0.75%, පොරොන්දු ගාස්තු 0.25%, | 5 | 29 |
| | ණය | 4/22/2021 | ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය - සහනදායී නොවන ණය | එ.ජ. ඩො | 26.7 | 5,126.40 | 26.7 | විචල්‍ය | ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය | _ | පොරොන්දු ගාස්තු මූලික ගෙවීම 0.25% | 5 | 29 |
| හංගේරියානු සංවර්ධන බැංකුව | ණය | 4/1/2021 | කොහුවල හා ගැටඹේ ඉදිකරනු ලබන ගුවන් පාලම් ව්‍යාපෘතිය | යුරෝ | 52 | 12,143.57 | 60.96 | පොලී රහිත ණය | | | _ | 10 | 37 |
| | | | | | එකතුව | **129,076.58** | **633.76** | | | | | | |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත

## 4.2 විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2021 ජනවාරි 01 සිට අප්‍රේල් 30 දක්වා, මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය වන එ.ජ.ඩො. මිලියන 856.4ක් එ.ජ.ඩො. මිලියන 855.8ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර එ.ජ.ඩොල(ර්) මිලියන 0.6ක් ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි වේ.

මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය චීනය සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් මගින් ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 60ක් ද අනතුරුව ඉහළ ප්‍රමාණයක් ලෝක බැංකුව (සියයට 16), ආසියානු සංවර්ධන බැංකුව (සියයට 13), සහ ජපානය (සියයට 5) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදු වූ ප්‍රතිලබ්ධි වේ.

වගුව 4.2 : එක් එක් සංවර්ධන පාර්ශවකරු විසින් 2021 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ප්‍රතිලබ්ධි

| සංවර්ධන පාර්ශවකරු / ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (එ.ජ.ඩොල(ර්) මිලියන)* | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| ද්විපාර්ශ්වික | **590.9** | - | **590.9** |
| චීනය** | 514.9 | - | 514.9 |
| ජපානය | 42.1 | - | 42.1 |
| ප්‍රංශය | 2.7 | - | 2.7 |
| ඉන්දියාව | 13.0 | - | 13.0 |
| එක්සත් රාජධානිය | 2.9 | - | 2.9 |
| නෙද(ර්)ලන්තය | 3.0 | - | 3.0 |
| ඔස්ට්‍රියාව | 4.4 | - | 4.4 |
| කුවේටය | 6.0 | - | 6.0 |
| ස්පාඤ්ඤය | 0.5 | - | 0.5 |
| කොරියාව | 0.6 | | 0.6 |
| සෞදි අරාබියාව | 0.8 | - | 0.8 |
| බහුපාර්ශ්වික | **264.9** | **-** | **265.2** |
| ආසියානු සංවර්ධන බැංකුව | 113.6 | - | 113.6 |
| ලෝක බැංකුව | 134.4 | 0.6 | 135.0 |
| අසියනු යටිතල පහසුකම් ආයොජන බැංකුව | 9.0 | | 9.0 |
| කෘෂිකර්මාන්තය සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 1.3 | | 1.3 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 6.6 | - | 6.6 |
| එකතුව | **855.8** | **0.6** | **856.4** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව


සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී 2021 අප්‍රේල් 30 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත

* තාවකාලික

** චීන සංවර්ධන බැංකුව විසින් ලබා දුන් එ.ජ.ඩොල(ර්) මිලියන 500.0ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම අඩංගු වේ

ගෙවුම් ශේෂ කළමනාකරණ සහාය සඳහා ලබාගත් එ.ජ.ඩොල(ර්) මිලියන 500ක ප්‍රමාණයට අමතරව, මෙම වර්ෂයේ සිදුවූ ප්‍රතිලබ්ධි වලින් ඉහළ ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ (සියයට 13) ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇති අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව (සියයට 5), සෞඛ්‍ය හා සමාජ සුබසාධනය (සියයට 5), ප්‍රවාහනය (සියයට 3), විදුලිබල හා බලශක්ති (සියයට 3) අධ්‍යාපනය හා පුහුණු (සියයට 3) සහ නිවාස හා නාගරික සංවර්ධනය (සියයට 3) යන අංශ යටතේ ක්‍රියාතිමක වන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇත.

රූපසටහන 4.1: එක් එක් අංශය වෙනුවෙන් 2021 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු වූ ප්‍රතිලබ්ධි (එ.ජ. ඩොල(ර්) මිලියන)





මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## 4.3 එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට එකඟතා පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2021 අප්‍රේල් 30 දින වන විට එ.ජ.ඩොල(ර්) මිලියන 8,003.9ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයක් පිළිවෙළින් චීනය, ලෝක බැංකුව සහ ජපානය ලබා දීමට නියමිතය.


එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂයෙන් සියයට 20ක් මාර්ග හා පාලම් අංශයේ ද ජල සම්පාදන හා සනීපාරක්ෂාව අංශයේ සියයට 19ක් හා සියයට 14ක් ප්‍රවාහන අංශයේ එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

**රූපසටහන 4.2 : පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශවකරු අනුව (එ.ජ.ඩොල(ර්) මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**රූපසටහන 4.3 : 2021 අප්‍රේල් 30 වන විට අංශ අනුව පළ කරන ලද එකඟතා මත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (එ.ජ.ඩොල(ර්) මිලියන)**





මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## 4.4 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2021 අප්‍රේල් 30 වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය එ.ජ.ඩොල(ර්) බිලියන 35.1[1] කි. තවද, 2021 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] එ.ජ.ඩොල(ර්) මිලියන 981.0කි. මෙයින්, එ.ජ.ඩොල(ර්) මිලියන 520.6ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන එ.ජ.ඩොල(ර්) මිලියන 460.4ක් පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

**රූපසටහන 4.4 : 2021 අප්‍රේල් 30 වන විට සිදුකර ඇති ණය සේවාකරණය හා වර්ෂයේ ඉදිරි මාස 8 සඳහා පුරෝකතනය[3] කරන ලද ණය සේවාකරණ ගෙවීම් (එ.ජ.ඩොල(ර්) මිලියන)**




1. භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්හි අනේවාසික ආයෝජන හා රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.
2. මුළු ණය සේවාකරණය පොලිගෙවීම්, ණය වාරික ගෙවීම්, රාජ්‍ය ව්‍යාපාරයන්හි ණය සේවාකරණය අඩංගු නොවේ.
3. පුරෝකථනය කර ඇත්තේ 2021 අප්‍රේල් 30 පැවති විනිමය අනුපාතයන් අනුව වේ. පුරෝකථන සඳහා දැනට ඇති ණය ප්‍රමාණය පමණක් පදනම් කරගෙන ඇති අතර 2021 වර්ෂයේ සිදුවන නව ණය ගැනීම් අනුව එකතුවන ණය සේවාකරණ ගෙවීම් පුරෝකථන අගයන් එකතුකර නැත.